අනාගතයට
# එතෙර වෙමු



# වාර්ෂික වාර්තාව 2015

ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව



# අනාගතයට
# එතෙර වෙමු

ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව



# වාර්ෂික වාර්තාව 2015

## පෙළගැස්ම


| | පිටු අංකය |
|---|---|
| - ආයතනික දර්ශනය | |
| ආයතනික තොරතුරු | 01 |
| - දැක්ම, මෙහෙවර සහ වටිනාකම් | 02 - 03 |
| - වැදගත් මූල්‍ය තොරතුරු | 04 - 07 |
| - විධායක තොරතුරු | |
| සභාපතිතුමාගේ පණිවුඩය | 08 - 09 |
| සාමාන්‍යාධිකාරීතුමාගේ පණිවුඩය | 10 - 13 |
| - අධ්‍යක්ෂ මණ්ඩලය | 14 - 17 |
| - ආයතනික කළමනාකාරීත්වය | 18 - 21 |
| - ආයතනික සමාජ වගකීම | 22 - 24 |
| - අධ්‍යක්ෂක මණ්ඩල වාර්තාව | 25 - 29 |
| - ආයතනික යහපාලනය | 30 - 40 |
| - අවදානම් කළමනාකරණය | 41 - 53 |
| - අනුකූලතා වාර්තාව | 54 |
| - මානව සම්පත් සංවර්ධනය | 55 - 56 |
| - විගණන කමිටු වාර්තාව | 57 - 58 |
| - අභ්‍යන්තර පාලනය පිළිබඳව අධ්‍යක්ෂවරයාගේ වාර්තාව | 59 - 60 |
| - මූල්‍ය තත්ත්වය පිළිබඳව විගණකාධිපති වාර්තාව | 61 - 64 |
| - මූල්‍ය ප්‍රකාශන | 65 - 109 |
| - වාර්ෂික මහසභා රැස්වීම් නිවේදනය | 110 |
| - පෙරකලාසි පත්‍රය | 111 - 112 |





# ආයතනික තොරතුරු

### ලියාපදිංචි නාමය

ශ්‍රී ලංකා සේවිංස් බෑන්ක් ලිමිටඩ්

### නෛතික තත්ත්වය

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධානවලට අනුකූලව ලියාපදිංචි අංක N(PBS) 1336 යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත කරන ලද සීමාසහිත සමාගමක් වන අතර 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි අංක PB 296 සහිතව නැවත ලියාපදිංචි කරන ලදි 1988 අංක 30 දරන බැංකු පනත යටතේ පිහිටුවන ලද බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි.

### ලියාපදිංචි කාර්යාලය

අංක: 265, වෝඩ් පෙදෙස, කොළඹ 07
දුරකතනය: 0112691721-2, 0112674700/1/2/3
ෆැක්ස්: 0112674705 /6 /7
විද්‍යුත් තැපෑල: info@slsbl.lk

### සංස්ථාපිත කළ දිනය

2006 ජූලි 07

### සමාගම් ලේකම්

නීතීඥ
ඒ. ආර්. ආර්. පියසේකර මිය
නීතිවේදී (කොළඹ), පශ්චාත් උපාධි ඩිප්ලෝමා (කොළඹ)
පශ්චාත් උපාධි (මොරටුව)
ලියාපදිංචි සමාගම් ලේකම්
ප්‍රසිද්ධ නොතාරිස්, දිවුරුම් කොමසාරිස්

### විගණකවරු

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
306/72, පොල්දූව,
බත්තරමුල්ල, ශ්‍රී ලංකාව

### බැංකුකරුවන්

ලංකා බැංකුව
මහජන බැංකුව

### අධ්‍යක්ෂ මණ්ඩලය

කේ. අමරසිංහ මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂක/සභාපති (වැඩබලන)
එස්. ඒ. සී. කුලතිලක මිය - (භාණ්ඩාගාර නියෝජිත)
නීතීඥ සුනිල් විතාරණගේ මහතා
ඒ. සෂිමාල් මඩපාත මහතා
ඩී. එස්. ඩබ්ලිව්. සමරසේකර මහතා
පී. ධීරසිංහ මහතා
ඩී. ඒ. පණ්ඩිත මහතා
ආර්. එම්. සී.රත්නායක මහතා
නීතීඥ පී. එස්. දයානන්ද මහතා
නීතීඥ සී. වී. ජේ. අරඹේවෙල මහතා



# අපගේ මෙහෙවර

ශ්‍රී ලංකාවේ ක්‍ෂුද්‍ර මූල්‍ය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාකයින්ගේ ආදායම් උත්පාදනය, ක්‍ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර කටයුතු වෙනුවෙන් වඩාත් විශ්වාසනීය සහ ආකර්ෂණීය මූල්‍ය පහසුකම් සැපයීම සහ ඔවුන්ගේ ඉතිරිකිරීමේ පුරුද්ද වැඩිදියුණු කිරීම වෙනුවෙන් කැපවීම.

# අපගේ දැක්ම

ක්‍ෂුද්‍ර මූල්‍ය සුළු හා මධ්‍ය පරිමාණ කේෂ්ත්‍රයේ වඩාත් ආකර්ක්‍ෂණීය බැංකුව බවට පත් වීම.

# අපගේ වටිනාකම්

පහත වටිනාකම් වෙත කැප වෙමින් අපගේ සේවා ලබා දීම තුළින් බැංකුවේ අපේක්ෂිත ආදර්ශ සහ ව්‍යාපාරික ආචාර ධර්ම ඉහළ නංවාගත හැකි වන බව අපගේ විශ්වාසයයි:

**වෘත්තීමයභාවය**
**ඒකාබද්ධතාව**
**කාර්යක්‍ෂමතාව**
**විශ්වසනීයත්වය**
**විවෘතභාවය**
**සමාජ වගකීම**

# වැදගත් මූල්‍ය තොරතුරු












| | දොරින් දොර | ළමා ඉතුරුම් | සාමාන්‍ය ඉතුරුම් | ස්ථාවර තැන්පතු | වෙනත් |
|---|---|---|---|---|---|
| 2015 | 9.63 | 18.05 | 199.37 | 365.41 | 315.25 |
| 2014 | 7.16 | 16.35 | 185.42 | 644.84 | 338.42 |



## වියදම් සංසන්දනය - 2015 සහ 2014 (රු. මිලියන)




| | මුළු වියදම | පොලී වියදම් | පුද්ගල පිරිවැය | සේවකයින් විශ්‍රාම යාමේදී, ප්‍රතිපාදන සඳහා වෙන්කිරීම | පරිශ්‍ර, උපකරණ හා ස්ථාපන වියදම් | ගාස්තු හා කොමිස් වියදම් | වෙනත් පොදුකාර්යය වියදම් |
|---|---|---|---|---|---|---|---|
| 2015 | 349 | 148 | 93 | 9 | 81 | 13 | 7 |
| 2014 | 352 | 183 | 58 | 6 | 76 | 8 | 21 |

## පොලී ආදායම - 2015 සහ 2014 (රු. මිලියන)




| | පොලී ආදායම භාණ්ඩාගාර බැඳුම්කර | පොලී ආදායම භාණ්ඩාගාර බිල්පත් | පොලී ආදායම ප්‍රතිමිලදී ගැනීම් ආයෝජන (REPO) | බැංකු ස්ථාවර තැම්පත් පොලී ආදායම | පොලී ආදායම සුරැකුම්පත් සහ ණයකර | පොලී ආදායම PSDB ණය | පොලී ආදායම ණය හා වෙනත් අත්තිකාරම් - SLSBL |
|---|---|---|---|---|---|---|---|
| 2015 | 0 | 92 | 143 | 143 | 55 | 37 | 206 |
| 2014 | - | 96 | 112 | 272 | 18 | 41 | 172 |

## ක්ෂුද්‍ර මූල්‍ය පොලී ආදායම් සංසන්දනය - 2015 සහ 2014 (රු. මිලියන)




කුෂුද්‍ර මූල්‍ය ණය හා අත්තිකාරම් ප්‍රමාණය - 2015 සහ 2014 (රු. මිලියන)
1,200
1,150
1,100
1,050
1,000
950
1,145
1,017
2015
2014
කුෂුද්‍ර මූල්‍ය ණය හා අත්තිකාරම්


සමස්ථ තැන්පතු වටිනාකම - 2015 සහ 2014 (රු. මිලියන)
1,400
1,200
1,000
800
600
400
200
-
908
1,192
2015
2014
මුළු තැන්පතු ප්‍රමාණය

# සභාපතිතුමාගේ පණිවිඩය



2015 දෙසැම්බර් 31 න් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වන සීමාසහිත ශ්‍රී ලංකා සේවිංස් බෑන්ක් ලිමිටඩ්හි වාර්ෂික වාර්තාව හා ගිණුම් විස්තර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ඉදිරිපත් කරන්නට ලැබීම මහත් සතුටකි.

## මුහුණ දුන් අභියෝග

වඩා සාර්ථක අනාගතයක් වෙනුවෙන් තවදුරටත් සවිමත් වෙමින් ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව 2015 වසරේදී සිය 08 වන සංවත්සරය සමරනු ලැබිය. සම්පූර්ණයෙන්ම රජයේ හිමිකාරත්වයට යටත් බැංකු ආයතනයක් වශයෙන් දිවයිනේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය තුළ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සතු තීරණාත්මක භූමිකාව මැනවින් හඳුනාගෙන කටයුතු කිරීමට සමත් වී තිබේ. ඒ අනුව, තම උපායමාර්ගික සැලැස්මට අනුකූල වන පරිදි ක්ෂුද්‍ර මූල්‍ය කටයුතුවල සිට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් දක්වා ක්ෂේත්‍ර කෙරෙහි අප බැංකුවේ අවධානය යොමු වෙයි.

ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය තවදුරටත් දිරිමත් කරමින් හා ඒ සඳහා සහාය දක්වමින් දේශීය ආර්ථික වර්ධනය තවදුරටත් පුළුල් කිරීම වෙනුවෙන් දායක වීමට බැංකුව බලාපොරොත්තු වෙයි.

## ආයතනික යහපාලනය

ආයතනිනක යහපාලන ප්‍රතිපත්ති සකස් කිරීමේදී ඒවා බැංකුවේ ආයතනික කළමනාකරණ පරිචයන්ට මනා ලෙස ගැලපෙන බව සහතික කර ගැනීම ඉතා වැදගත් වේ. මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සහායද සහිතව උප කමිටු කිහිපයක්ම පිහිටුවීමට බැංකුව කටයුතු කර තිබේ. ඒ අතරින්, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලයට අනුබද්ධිත අවදානම් කළමනාකරණ කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා වේතන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල නීති හා අයකරවා ගැනීම් කමිටුව ආදිය විසින් බැංකුවේ ආයතනික යහපාලනය සවිමත්ව පවත්වාගෙන යනු පිණිස විශාල කාර්යභාරයක් ඉටු කරන ලදි. ඒවාට අදාළ අධ්‍යක්ෂවරුන් විසින් ලබා දෙන ලද දායකත්වය හා ඔවුන්ගේ කැපවීම සුවිශාල වූ බව විශේෂයෙන් සඳහන් කළ යුතුය.

## පාර්ශ්වකරුවන් වෙත පණිවුඩය

අප බැංකුවේ කටයුතු කෙරෙහි ඉතාම වැදගත් විශ්වාසයක් තබමින් අප සමග එක්ව සිටි ගනුදෙනුකාර භවතුන් සහ ව්‍යාපාරික හවුල්කරුවන් මහත් සේ අගය කරමි. පසුගිය කාලය මුළුල්ලේම බැංකුව සමග අත්වැල් බැඳ රැඳී සිටි ඔවුන් සියලුම දෙනා වෙත මාගේ ස්තුතිය හිමි වේ. වඩාත් වටින්නේ සෑම අවස්ථාවකම නොවෙනස්ව රැඳී සිටින සබඳතාවන් බව කිව යුතුය.

සෑම විටම අප හට සවියක් වූයේත්, මින් ඉදිරියට එසේ වන්නේත් අප බැංකුව සමග රැඳී සිටින ගනුදෙනුකාර භවතුන් බව උදක්ම පවසමි. ඒ අතරින්ද, ග්‍රාමීය ප්‍රදේශ ආශ්‍රිත අපගේ ගනුදෙනුකරුවන් සහ ක්ෂුද්‍ර මූල්‍ය හවුල්කාර සංවිධාන විශේෂයෙන්ම සඳහන් කළ යුතුය.

අප හට මුහුණ දෙන්නට සිදු වූ අභියෝග රාශියක් අතරෙහි කැපී පෙනෙන කාරණයක් වූයේ බැංකුවේ ව්‍යාපාරික කටයුතු නිසි අයුරින් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය සාර්ථක කුසලතා සහ දැනුමින් පොහොසත් පුද්ගල මානව සම්පත් සොයා ගැනීමයි. (ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ) බැංකුවේ සමස්ත කාර්ය මණ්ඩලය වෙත මෙහිදී මා හට කීමට ඇත්තේ අපගේ සමස්ත රටත්, එහි ජනතාවත් සංවර්ධනය කරා රැගෙන යාමේ ගමනට දායක වීමේ වගකීමක් අප සැමට ඇති බවයි. මේ නිසා, මෙහිදී සමාලෝචනයට ලක් වන මූල්‍ය වර්ෂය තුළ සාර්ථක ප්‍රතිඵල උදාකර ගැනීම සඳහා දුෂ්කර අවස්ථාවලදී පවා මහත් කැප වීමෙන් කටයුතු කළ කාර්ය මණ්ඩලය බෙහෙවින් අගය කරමි. ඔවුන්ගේ උසස් කැපවීම සහ නිරන්තර පක්ෂපාතීත්වය නොවන්නට මෙතෙක් පැමිණි සාර්ථකත්වයේ ගමන පැමිණීමට අප හට හැකි නොවනු ඇත.

## ස්තුතිය

ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව වෙත නිරන්තරයෙන් මහත් සහයෝගයක් සහ නිසි මාර්ගෝපදේශනයක් ලබා දෙමින් අප හට සහාය දැක්වූ ගරු රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා, ගරු රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා, ගරු මුදල් අමාත්‍යතුමා, ගරු මුදල් රාජ්‍ය අමාත්‍යතුමා, රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමා, මහා භාණ්ඩාගාර ලේකම්තුමා, මහ බැංකු අධිපතිතුමා, ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතුමා, විගණකාධිපති ජෙනරාල්තුමා සහ එතුමාගේ කාර්ය මණ්ඩලය, නීතිපතිතුමා, අනෙකුත් අදාළ නියාමන ආයතනවල ප්‍රධානීන් සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩල වෙත මාගේ හදපිරි ස්තුතිය පුද කරමි.

එමෙන්ම, (ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ) මගේ හිතවත් අධ්‍යක්ෂවරුන් විසින් ලබා දෙන ලද නිරන්තර මාර්ගෝපදේශනය සහ සහයෝගය වෙනුවෙන්ද මගේ අවංක ස්තුතිය පුද කරමි. එපමණක්ද නොව, පසුගිය කාලය පුරාවට අප බැංකුව වෙනුවෙන් විශාල මෙහෙවරක් ඉටු කරන ලද හිටපු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ද ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

අතිශයින්ම තරගකාරී ව්‍යාපාරික පරිසරයක් තුළ වුවද ස්ථාපිත ඉලක්ක සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් ඉතාම දක්ෂ සහ දූරදර්ශී කළමනාකරණ සහායක් ලබා දුන් සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීතුමා ප්‍රමුඛ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩල වෙතද මගේ නොමඳ ස්තුතිය හිමි වේ.



කේ. අමරසිංහ
වැඩබලන සභාපති



# සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ **පණිවිඩය**

වැදගත් සන්ධිස්ථාන කිහිපයක්ම පසු කිරීමට ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවට හැකි වූ 2015 වර්ෂය සඳහා වන එහි වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරන්නට ලැබීම මට මහත් සතුටක් දනවයි. බැංකුවේ ආරම්භක අරමුණු සාක්ෂාත් කර ගන්නා අතරම ජාතියේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායික බැංකුව ලෙස නැගී සිටින්නට හැකි වූ මෙම වසර තුළ අපි අපගේ 08 වන සංවත්සරය සැමරුවෙමු. අප තවමත් බැංකු කර්මාන්තයට ආධුනික බැංකුවක් වුවද මෙහි සමාලෝචනයට ලක් වන කාල සීමාව තුළ වැදගත් සන්ධිස්ථාන කිහිපයක්ම පසු කරමින් විශිෂ්ට ලාභ වර්ධනයක් ලඟාකර ගැනීමට අපට හැකි වීම සතුටට කරුණකි. 2015 වසර තුළදී අප සියලු දෙනා විසින් පිහිටුවන ලද පදනම ඉදිරි වසරවලදී තව තවත් විශිෂ්ටත්වයට පත් වීම සඳහා මහෝපකාරී වනු ඇති බව අපගේ සියලුම පාර්ශ්වකරුවන් වෙත පැවසීමට මෙය කදිම අවස්ථාවක් වනු ඇත. මේ නිසා, ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර මූල්‍ය සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා සේවා සපයන විශාලතම රාජ්‍ය බැංකුව බවට පත් වීමේ අප සතු පරම අභිලාෂය මුදුන්පත් ගැනීමට හැකි වනු නොඅනුමානය.

## ■ බාහිර පරිසරය

ජනාධිපතිවරණයෙන් අනතුරුව මහ මැතිවරණයක්ද පැවැත්වුණු පසුබිමක 2015 වර්ෂය ආරම්භ වූයේ නව බලාපොරොත්තු මෙන්ම අභියෝගද රැසක්ම ඉදිකරමිනි. ශ්‍රී ලාංකේය දේශපාලනික ඉතිහාසය අංශක 180 කින්ම අපවර්තනයට බඳුන් වූ මෙම වසර ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ප්‍රජාව නව අභියෝගාත්මක අවස්ථා සහ වගකීම් මාලාවකටම අභිමුඛ කරනු ලැබීය.

2014 වසරට සාපේක්ෂව ගත් කල සාමාන්‍ය වශයෙන් තෙල් මිල 50% ඉක්මවන අගයකින් පහත හෙලීම රටට සුභදායී ලෙස බලපෑ අතර එහි ප්‍රතිඵලයක් ලෙස වෙළඳපොළ ලාභදායීතාව කෙරෙහිද එල්ල වූයේ ධනාත්මක බලපෑමකි.

ප්‍රධාන වශයෙන් මහජනතාව වෙත ලබා දුන් ණය, බැංකු සහ මූල්‍ය ආයතන මගින් උත්පාදනය වූ ඉහළ ද්‍රවශීලතාව හේතුවෙන් රටෙහි ආනයන වියදම් ඉහළ යාම කෙරෙහි රජයේ දැඩි අවධානය යොමුව තිබේ. මේ නිසා ගෙවුම් ශේෂ කෙරෙහි සැලකියයුතු ඍණාත්මක බලපෑමක් එල්ල විය.

මෙම සමාලෝචනයට ලක් වන කාල සීමාව තුළ බාහිර පරිසරයෙහි ඇති වූ විවිධ ප්‍රවණතා විසින් බැංකු ව්‍යාපාර සඳහා විවිධ අවස්ථා මෙන්ම බාධකද මුසු වූ තත්ත්වයක් නිර්මාණය කෙරුණි. කෙසේ වෙතත්, අභිනවයෙන් පත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයෙහි සහයෝගය සහිතව එකී වෙළඳපොල අවස්ථා මැනවින් ප්‍රයෝජනයට ගනිමින් අපට එල්ල වූ විවිධ බාධක ජය ගැනීම සඳහා අපගේ අභ්‍යන්තර ශක්තිය උපරිමයෙන් යොදා ගැනීමට හැකි විය. මේ නිසා, පසුගිය වසරට සාපේක්ෂව බලන කල මෙම වසර තුළ සැලකියයුතු මට්ටමේ සාර්ථකත්වයක් ලබා ගැනීමට අපට හැකි වී ඇති බව කිව හැක.




## ■ මූල්‍ය සාධනයන් කෙටියෙන්

**ණය වර්ධනය**

**37%**

ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව යනු පූර්ණ ලෙස ශ්‍රී ලංකා රජයේ හිමිකාරත්වය යටතේ ක්‍රියාත්මක වන ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ඉලක්ක කරගත් බැංකුවක් වන අතර දිළිඳුකම තුරන් කිරීමේ රජයේ දැක්මට අනුකූල වන පරිදි හුදෙක් ලාභ ඉපැයීම වෙනුවට ආර්ථිකයෙහි අඩු වරප්‍රසාදිත අංශය සවිබල ගැන්වීම එහි මූලික අරමුණ වෙයි. මෙහි සමාලෝචනයට ලක් වන කාල සීමාව තුළ මූලික වශයෙන්ම දිවයිනෙහි ඌන සංවර්ධිත ප්‍රදේශ කෙරෙහි අවධානය යොමු කරමින් සුළු පරිමාන මෙන්ම මධ්‍යම පරිමාන මට්ටමේ ව්‍යවසායයන් බිහි කිරීම හා වැඩිදියුණු කිරීම වෙනුවෙන් බැංකුවේ අත්තිකාරම් කළඹින් වැඩි කොටසක් වෙන් කරන අතරම ඒ සඳහා වෙනමම ඒකකයක් ස්ථාපිත කිරීම තුළින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායික අංශ නගා සිටුවීම කෙරෙහි වැඩි අවධානයක් යොමු



කරඇත. මෙම වසර තුළදී බැංකුවෙහි ණය කළඹ ආශ්‍රිතව රු. බිලියන 1.7 සිට රු. බිලියන 2.4 දක්වා 37% ක වර්ධනයක් දැකිය හැකි විය. අඩු පිරිවැය ණය වැඩසටහන් ක්‍රියාත්මක කරමින් අඩු වරප්‍රසාදලාභී අංශ කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන අතරම අපගේ තැන්පත්කරුවන් හට ආකර්ෂණීය පොලී අනුපාත ලබා දීමේදී බැංකුවට විවිධ දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදු විය. තැන්පතු සඳහා ඉහළ ප්‍රතිලාභ වෙනුවෙන් තැන්පතුකරුවන් අතර පැවැති ඉල්ලුම හේතුවෙන් වෙළඳපොල තුළ උද්ගත වූ පොලී අනුපාත ඉහළ යාම නිසා බැංකුවට නව අභියෝගවලට මුහුණ දීමට සිදු විය. මේ නිසා මෙම කාල සීමාව තුළ බැංකුවේ තැන්පතු කළඹ ආශ්‍රිතව දැකිය හැක්කේ 31% ක ඍණාත්මක වර්ධනයක් වන අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ආයෝජන සඳහා ඇති අරමුදල්වල පහත බැසීමක් දක්නට ලැබේ. මේ නිසා පොලී ආදායම් වර්ධන ශීඝ්‍රතාව 5% ක් ලෙස සීමා වී පවතින බව නිරීක්ෂනය වේ. කෙසේ වෙතත්, බැංකුවේ මූල්‍ය කාර්යසාධනයට එල්ල වූ මෙවැනි බාහිර සාධකවල බලපෑම මධ්‍යයේ වුවද 84% ක ශුද්ධ ලාභ මට්ටමක් ළඟා කර ගන්නා අතරම මෙහෙයුම් වියදම් අඩුවැඩි වශයෙන් එක සමාන මට්ටමක පවත්වා ගෙනයාමට හැකි වී ඇත.

## ■ සේවා හා නිපැයුම් කළඹෙහි වර්ධනය

මෙම කාල සීමාව තුළදී නව ඉතුරුම් සංස්කෘතියක් නිර්මාණය කිරීමේ හා සාමාන්‍ය ඉතුරුම් කටයුතු සඳහා වැඩි දිරිමත්කිරීමක් ගනුදෙනුකරුවන් අතර ඇති කිරීමේ වැදගත්කම බැංකුව විසින් හඳුනාගත් අතර ඒ අනුව, ප්‍රතිලාභීන් හට කිසිදු පිරිවැයක් දැරීමට සිදු නොවන රක්ෂණාවරණයක්ද සහිත ''**එස් එල් එස් තිළිණ**'' නමැති නව බාලවයස්කාර ඉතුරුම් සේවාවක් හඳුන්වා දෙන ලදි. එය හඳුන්වා දීමේ අරමුණ වූයේ දීර්ඝ කාලීන තැන්පතුකරුවන් වෙත ළඟා වීමේ අරමුණිනි. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් ඉලක්ක කරගත් ණය සේවා සම්පාදනය කිරීමේදී අවශ්‍ය අරමුදල් යොදා ගැනීම සඳහා දීර්ඝ කාලීන ඉතුරුම් ගිණුම් බිහි කිරීමට හැකි වන පරිදි අපගේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායික ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා ඉටු කිරීමද එහි අභිප්‍රායයක් විය.

අපගේ ණය කළඹ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් හා සම්බන්ධ කිරීම වෙනුවෙන් පියවර රැසක්ම ගනු ලැබූ අතර ග්‍රාමීය හා නාගරික ස්වයං-රැකියාවල නිරත පිරිස් වෙනුවෙන් විශේෂයෙන්ම සකස් කරන ලද ''**ප්‍රජා දිරිය**'' නම් වූ නව ණය සේවාවක්ද හඳුන්වා දීමට 2015 වසර තුළ අපට හැකි විය. මීට අමතරව, ඒ ඒ ප්‍රතිලාභීන්ගේ ජීවන මට්ටම සහ ව්‍යාපාර ඉහළ තත්ත්වයන්ට නගා සිටුවීමට නියමිත හෝ අලුතින්ම ආරම්භ කිරීමට නියමිත ව්‍යාපෘති වෙනුවෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායික අංශයේ අවශ්‍යතා ඉටු කිරීම සඳහා ''**එස් එල් එස් දිරිය**'' නමින් නව ණය සේවාවක්ද අපි හඳුන්වා දුනිමු.

## ■ මානව සම්පත් සංවර්ධනය

2015 වසර තුළදී බැංකුව විසින් මානව සම්පත් සංවර්ධන කටයුතු සහ බැංකුව තුළ වෘත්තීයමය වශයෙන් ඉහළ බැංකුකරණ සංස්කෘතියක් ස්ථාපිත කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කරන ලදි. ඒ අනුව, කාර්ය මණ්ඩල සංවර්ධනය ඉලක්ක කර ගනිමින් පුහුණු වැඩසටහන් රැසක්ම පවත්වන ලද අතර බැංකු කර්මාන්තයෙහි සාමාන්‍ය වැටුප් මට්ටම්වලට සමගාමී වන පරිදි සේවක මණ්ඩලයේ වැටුප් ඉහළ නැංවීමද සුවිශේෂී කටයුත්තකි. මේ නිසා අපට වඩා ඉහළ ගුණාත්මකභාවයකින් හෙබි මානව සම්පතක් බැංකුව වෙත ආකර්ෂණය කර ගැනීමට හැකි විය. මෙලෙස මානව සම්පත් සංවර්ධන ක්‍රියාවලිය වෙනුවෙන් වැඩි අවධානයක් යොමු කරමින් කටයුතු කිරීම නිසා බැංකුවේ පුද්ගල පිරිවැටුම 58.4% කින් ඉහළ ගිය නමුදු අප විසින් එය දීර්ඝ කාලීන ප්‍රතිලාභ උදා කරනු ලබන සාධනීය ආයෝජනයක් ලෙස සලකන ලදි. මීට අමතරව, නව ව්‍යාපාර සංවර්ධන නිලධාරීන් පිරිසක් බඳවා ගැනීම තුළින් අපගේ ණය සේවාවන් රට පුරාම ව්‍යාප්ත කළ හැකි මට්ටමේ ආකර්ෂණීය ප්‍රතිඵල උදා කළ බැංකුවට නව සංකල්පයක් වූ "Bare foot Banking Practice" හඳුන්වාදෙන ලදී.

## ■ රජයේ අරමුණු හා සැලසුම්වලට අනුකූලව කටයුතු කිරීම

ශාඛා කාර්යාල සංඛ්‍යාව සීමිත වුවද අප විසින් රජයේ අරමුණු හා උපායමාර්ගයන්ට අනුකූලව ආර්ථිකයෙහි අඩු වරප්‍රසාදලාභී අංශ සවි බල ගන්වමින් ඔවුන් නගා සිටුවීම සඳහා ක්‍රියා කිරීමට සැලසුම් කරන ලදි. මෙම වසර තුලදී දිවයින පුරා හවුල්කාර සංවිධාන 260 කට ආසන්න ප්‍රමාණයක් කරා ළඟා වෙමින් අපගේ සේවාවන් පුළුල් කළ අතරම ගනුදෙනුකාර හවතුන් 6000 කට අධික පිරිසක් සඳහා බැංකු සේවා සැපයීමට අපට හැකි විය. මේ අතරම වැඩි වශයෙන් බරතැබූ ඇප ඉදිරිපත් කිරීමට අපහසු පුද්ගලයන් වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි නව ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම (Re-financed loans) හා සම්බන්ධ වෙමින් ''ස්ව ශක්ති'' ණය යෝජනා ක්‍රමය බැංකුව වෙත හඳුන්වා දීමට කටයුතු යොදා ඇත. මේ අයුරින් අප සතු නම්‍යශීලී සහ පාරිභෝගිකයන්ට සුහදශීලී ණය ලබා දීමේ සේවාවන් හරහා දිවයිනේ බැංකු සේවා ලබා ගැනීමේ අවස්ථා අහිමි වී තිබුණු පිරිස් වෙතද එම අවස්ථා විවර කිරීම සඳහා අප විසින් කටයුතු කරන ලදි.

## ■ සමාජ වගකීම් වැඩසටහන්

අප බැංකුව විසින් දිවයිනේ ග්‍රාමීය ප්‍රදේශවල ස්වයං-රැකියාවල නියුතු පුද්ගලයන් සහ අපගේ හවුල්කාර සංවිධානවල සාමාජිකයින් සවිබල ගැන්වීමේ අරමුණින් මෙම කාලසීමාව තුළ දරිද්‍රතාව තුරන් කිරීමේ වැඩසටහන්, ඔවුන්ගේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා වූ විවිධ වැඩසටහන් සහ ප්‍රදර්ශන වැනි ක්‍රියාදාමයන් රැසක් දියත් කරන ලදි. මේ අතරම, ව්‍යවසායකයන්ගේ තාක්ෂණික දැනුම, කාර්යක්ෂමතාව, සඵලතාව සහ සමස්ථ තත්ත්ව කළමනාකරණය වැනි ක්ෂේත්‍ර වර්ධනය කිරීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලය සහ කාර්මික තාක්ෂණ ආයතනය වැනි ආයතන සමගද අත්වැල් බැඳ ගනිමින් වැඩසටහන් කිහිපයක්ම දියත් කරන ලදි.

## ■ ප්‍රමුඛ බැංකු තැන්පතුකරුවන්ගේ අරමුදල් පියවීම

අප බැංකුවේ තවත් ප්‍රධානතම වගකීමක් වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2002 වසරේදී ව්‍යාපාරික කටයුතු අත්හිටුවන ලද ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුවේ ගනුදෙනුකරුවන්ගේ තැන්පතු මුදල් පියවීමට කටයුතු කිරීමයි. ඒ අනුව, 2015 වසරේදී අප විසින් රු. මිලියන 270.8 ක වටිනාකමකින් යුතු සමස්ථ තනි පුද්ගල තැන්පතු ප්‍රමාණයෙන් රු. මිලියන 69.3 ක් ම පියවා නිදහස් කිරීමට කටයුතු කරන ලද අතර 2016 වසරේදී ඉතිරි රු. මිලියන 201.5 ක මුදල් ප්‍රමාණය පියවා නිදහස් කිරීමට සැලසුම් කරන ලදි. එසේම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශිත ණය නැවත ගෙවීමේ යෝජනා ක්‍රමයට අනුකූලව තනි පුද්ගල තැන්පත්කරුවන් සමග ඇති වගකීම් ප්‍රමාණය නියමිත කාල රාමුව තුලදීම මුළුමනින්ම පියවා අවසන් කිරීමට අපි බලාපොරොත්තු වෙමු.

මීට අමතරව, 2017 වසර අවසානයට පෙර රු. බිලියන 1.9 ක වටිනාකමකින් යුතු ආයතනික තැන්පතු මුදල් ප්‍රමාණයද පියවා නිදහස් කිරීමට අප විසින් දැනටමත් අදාල සැලසුම් කර තිබේ.

## ■ අනාගත සැලසුම් හා සංවර්ධනයන්

ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ සියලුම පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා ඉටු කරන අතරම එහි ඉලක්ක සහ අරමුණු ළඟාකර ගැනීම සඳහා අංශ කිහිපයකටම අදාළ ඉතා පැහැදිලි දීර්ඝ කාලීන මෙන්ම කෙටිකාලීන සැලසුම් අප විසින් දැනටමත් සම්පාදනය කොට ඇත.

බාසල් III මගපෙන්වීම් ක්‍රියාත්මක කිරීම නිසා අවම ප්‍රාග්ධන අවශ්‍යතාව සපුරා ගැනීමට අදාළව නව අභියෝග රැසක් ඉස්මතු වී පවතී. රජයේ සහ අනෙකුත් නියාමන ආයතනවල ප්‍රතිපත්තිවලට අනුකූල වෙමින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා ඉටු කරදීම සඳහා අප විසින් නව ණය ලබා දීමේ සේවා හඳුන්වා දීමටද සැලසුම් කර ඇත. එකී ව්‍යවසායකයන් ක්ෂුද්‍ර ව්‍යවසායික මට්ටමේ සිට සුළු හා මධ්‍ය පරිමාණ මෙන්ම මහා පරිමාන මට්ටමේ ව්‍යවසායකයන් ලෙසට සංවර්ධනය කොට ජාතික ආර්ථිකයට සෘජුව දායක වීම අපගේ ඒකායන අභිප්‍රාය වේ.

අපගේ අරමුණුකරා හඹා යාමේදී අති විශිෂ්ට සහයෝගයක් ලබා දෙන රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන ගරු අමාත්‍යතුමා සහ එම නියෝජ්‍ය අමාත්‍යතුමා, ගරු මුදල් අමාත්‍යතුමා, රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමා, මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා, මහා භාණ්ඩාගාර ලේකම්තුමා, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමා, විගණකාධිපති ජෙනරාල්තුමා සහ එම කාර්ය මණ්ඩලය, නීතිපතිතුමා සහ එම කාර්ය මණ්ඩලය සහ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතුමා සහ එම කාර්ය මණ්ඩලය වෙත මගේ අවංක ස්තුතිය පිරිනමමි.

එසේම, මෙම සමාලෝචනයට ලක් වන වර්ෂය තුළ බැංකුව සුභවාදී සහ නිවැරදි මාවතක ගමන් කරවීම සඳහා නිසි තීරණ ගැනීමේදී මා වෙත ලබා දුන් වටිනා මගපෙන්වීම සහ සහයෝගය වෙනුවෙන් සභාපතිතුමා ප්‍රමුඛ අධ්‍යක්ෂ මණ්ඩලය වෙතද මගේ හෘදයංගමය ස්තුතිය පුද කරමි.

අපගේ ආයතනික ප්‍රතිඵල නිසි පරිදි උදාකර ගැනීම සඳහා ඉමහත් කැපවීමෙන් කටයුතු කළ අප බැංකුවේ සමස්ථ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මණ්ඩලය, අනෙකුත් සියලුම කළමනාකරණ නිලධාරීන් මෙන්ම අපේක්ෂිත ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේදී මහත් ධෛර්යයක් හා සහයෝගයක් ලබා දුන් සෙසු සියලුම කාර්ය මණ්ඩලය මෙන්ම අනෙකුත් සියලුම පාර්ශ්වකරුවන් වෙතද මාගේ නොමද ස්තුතිය හිමි විය යුතු වේ.

අවසාන වශයෙන්, අප කෙරෙහි විශ්වාසය තබමින් ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව සමග ව්‍යාපාරික සබඳතා පවත්වා ගැනීම වෙනුවෙන් අපගේ වටිනා ගනුදෙනුකාර භවතුන් සහ අනෙකුත් පාර්ශ්ව වෙතද මගේ අවංක ස්තුතිය පුද කරමි.



ඩබ්ලිව්. ඒ. උදය බණ්ඩාර
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී

# අධ්‍යක්ෂ මණ්ඩලය

*වමේ සිට දකුණට අසුන් ගෙන*

එස්.ඒ.සී. කුලතිලක මිය

කේ. අමරසිංහ මහතා

පී. ධීරසිංහ මහතා

*වමේ දිට දකුණට සිටගෙන*

ඒ. ශෂිමාල් මඩපාත මහතා

පී.එස්. දයානන්ද මහතා

ඩී.එස්.ඩබ්ලිව්. සමරසේකර මහතා

ඩී.ඒ. පණ්ඩිත මහතා

ආර්.එම්.සී. රත්නායක මහතා

සුනිල් විතාරණගේ මහතා

සී.වී.ජේ. අරඹේවෙල මහතා *



* ඡායාරූපයේ නොමැත



# අධ්‍යක්ෂ මණ්ඩලය



**කේ. අමරසිංහ මහතා**
ක්‍රියාකාරී අධ්‍යක්ෂ - සභාපති (වැඩබලන)
විධායක නොවන අධ්‍යක්ෂ
බැඳුණු දිනය: 2015.02.12



**එස්.ඒ.සී. කුලතිලක මිය**
විධායක නොවන අධ්‍යක්ෂ
බැඳුණු දිනය: 2015.02.24



**ඩී.එස්.ඩබ්. සමරසේකර මහතා**
විධායක නොවන අධ්‍යක්ෂ
බැඳුණු දිනය: 2016.07.20



**ආර්.එම්.සී. රත්නායක මහතා**
විධායක නොවන අධ්‍යක්ෂ
බැඳුණු දිනය: 2016.07.20



**සුනිල් විතාරණගේ මහතා**
විධායක නොවන අධ්‍යක්ෂ
බැඳුණු දිනය: 2015.02.12



**ඒ. ශෂිමාල් මඩපාත මහතා**
විධායක නොවන අධ්‍යක්ෂ
බැඳුණු දිනය: 2015.02.12



**පී. ධීරසිංහ මහතා**
විධායක නොවන අධ්‍යක්ෂ
බැඳුණු දිනය: 2016.07.20



**පී.එස්. දයානන්ද මහතා**
විධායක නොවන අධ්‍යක්ෂ
බැඳුණු දිනය: 2016.07.20



**ඩී.ඒ. පණ්ඩිත මහතා**
විධායක නොවන අධ්‍යක්ෂ
බැඳුණු දිනය: 2016.07.20



**සී.වී.ජේ. අරඹේවෙල මහතා**
විධායක නොවන අධ්‍යක්ෂ
බැඳුණු දිනය: 2016.12.26



# ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

*වමේ සිට දකුණට අසුන් ගෙන*

කේ.කේ.කේ.එස්. කුමාර මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකාර - මෙහෙයුම් සහ ව්‍යාපාර සංවර්ධන

ඩබ්ලිව්.ඒ.යූ. බණ්ඩාර මහතා
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී

ඒ.ආර්. රම්‍යා පියසේකර මිය
සමාගම් ලේකම්, ජ්‍යෙෂ්ඨ කළමනාකාර - නීති

*වමේ දිට දකුණට සිටගෙන*

එස්.ඒ.කේ.ඒ.කේ. සූරියආරච්චි මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකාර - අවදානම් කළමනාකරණ

එන්.එන්.එන්. විතානගේ මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකාර - තොරතුරු තාක්‍ෂණ

ජී.එම්.එස්.එන්.කේ.එම්. ගුරුසිංහ මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකාර - පරිපාලන හා සංස්ථාපන

කේ.එම්.ඩබ්ලිව්.සී. පෙරේරා මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකාර - මානව සම්පත් සංවර්ධන

කේ.එන්.ඒ. දිසානායක මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකාර - මූල්‍ය හා සැලසුම්

ඊ.ඩබ්ලිව්. ප්‍රියන්ත මහතා
වැඩබලන ජ්‍යෙෂ්ඨ කළමනාකාර - ණය



# කළමනාකරණ **කණ්ඩායම**



*වමේ සිට දකුණට අසුන් ගෙන*

ඩී.එම්.එන්.ටී. දිසානායක මිය
නියෝජ්‍ය කළමණාකරු

ඩී.එස්. රාජකරුණා මිය
නියෝජ්‍ය කළමණාකරු

එස්.ජේ. සලේ මිය
කළමණාකරු - ප්‍රධාන කාර්යාලීය ශාඛාව

කේ.එච්.එස්.එච්. අබේවික්‍රම මිය
සහකාර කළමණාකරු - නීති

සී.ජේ. අඹේපිටිය මිය
සහකාර කළමණාකරු - නීති



*වමේ සිට දකුණට සිටගෙන*

ටී.පී. පුෂ්පකාන්ති මිය
ශාඛා කළමණාකරු - මාතර ශාඛාව

ඒ.ඩී.බී.සී. අතපත්තු මහතා
සහකාර කළමණාකරු - භාණ්ඩාගාර කළමණාකරන

එන්.එම්.ඒ.ටී.බී. අරඹේපොල මහතා
ශාඛා කළමණාකරු - මන්නාරම ශාඛාව

ආර්.එන්. රාජමන්ත්‍රී මහතා
කළමණාකරු - අයකිරීම්

බී.ජේ.එච්. පෙරේරා මහතා
සහකාර කළමණාකරු - තොරතුරු තාක්ෂණ

ජී.ජී.ඒ.එන්. සංජීව මහතා
සහකාර කළමණාකරු

ජී.ඩී.කේ.එස්. යාපා මහතා
සහකාර කළමණාකරු

කේ.ඒ.එන්. රසිකප්‍රිය මහතා
කළමණාකරු - අභ්‍යන්තර විගණන

කේ.එම්. පෙරේරා මහතා
ශාඛා කළමණාකරු - අනුරාධපුර ශාඛාව

කේ.එස්.ඩී. ප්‍රනාන්දු මහතා
නියෝජ්‍ය කළමණාකරු

ඒ.කේ.ඊ. පද්මකුමාර මහතා
වැඩබලන කළමණාකරු - කල්බදු

පී.බී.එන්. සංජීවනී මිය
නියෝජ්‍ය කළමණාකාරු

# ආයතනික සමාජ වගකීම් වැඩසටහන් - 2015

අප බැංකුව සතු ප්‍රධානතම අරමුණුවලින් එකක් වන්නේ සමාජ සේවා ආධාර වශයෙන් කිසිවක් ලබා දීමෙන් තොරව තම සමාජ තත්ත්වය ඉහළ නංවා ගැනීමට හැකි වන පරිදි අඩු ආදායම්ලාභී පවුල් සවිබල ගැන්වීම තුළින් දරිද්‍රතාව තුරන් කිරීම වෙනුවෙන් කැප වීමයි.

ඒ අනුව, ග්‍රාමීය ජනතාව අතර මූල්‍ය කටයුතු පිළිබඳව පවතින අවබෝධය පුළුල් කිරීම අරමුණු කොට ගෙන අප බැංකුවේ ක්ෂුද්‍රමූල්‍ය අංශය විසින් වැඩසටහන් කිහිපයක්ම දියත් කරන ලදි. එමෙන්ම ග්‍රාමීය ජනතාව හට ආදායම් මට්ටම සහ ජීවන තත්ත්වය ඉහළ නංවා ගත හැකි පරිදි ආර්ථික උත්පාදන කටයුතු සඳහා ක්ෂුද්‍රමූල්‍ය ණය යෝජනා ක්‍රමයක් සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමට බැකුව සමත් විය.



ගාල්ල ආශ්‍රිත ප්‍රජා නායකයන්, විශේෂයෙන්ම, බැංකුව සමග ලියාපදිංචි වී සිටින හවුල්කාර සංවිධාන සතු අවශ්‍යතා හඳුනාගනිමින් ඔවුන්ගේ සාමාජිකයන් සංවර්ධනය කිරීම සහ මූල්‍ය හිදැස්වලට පිළියම් යෙදිය හැක්කේ කෙසේද වැනි කරුණු සම්බන්ධයෙන් දැනුම් හුවමාරු සැසියක් ගාල්ලේදී පවත්වන ලදි.





ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ අට වන සංවත්සරය 2015 මාර්තු 10 වැනි දිනය යෙදී තිබුණු අතර එය සමරනු වස් ගාල්ල මහනගර සභා ප්‍රධාන ශ්‍රවණාගාරයේදී ගාල්ල දිස්ත්‍රික් හවුල්කාර සමාගම් සහභාගී කරගෙන විශේෂ වැඩසටහනක් පවත්වන ලදි. ඒ අනුව, විශේෂිත වෙළෙඳ පොළක් සහ වෙළෙඳ ප්‍රදර්ශනයක් සංවිධානය කළ අතර එහි අරමුණ වූයේ බැංකුවේ මූල්‍ය අනුග්‍රහය ලබන හවුල්කාර සංවිධානවල සාමාජිකයන්ගේ ස්වයං-රැකියා නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමයි. මල්, සාම්ප්‍රදායික කැවිලි වර්ග, වෙළෙඳ කුටි සහ තවත් නිපැයුම් රැසක් ඊට ඇතුළත් විය.

කාර්මික සංවර්ධන මණ්ඩලයේ සහ කාර්මික තාක්ෂණ ආයතනයේ සහයෝගය ලබමින් මෙම සුළු ව්‍යවසායිකයන්ගේ තාක්ෂණික දැනුම ඉහළ නැංවීමද මෙහි තවත් අරමුණක් විය. අඩු පිරිවැයක් වැය කරමින් තම වෙළෙඳ භාණ්ඩ නිෂ්පාදනය කර ගැනීම සහ තරගකාරී ව්‍යාපාරික පරිසරයන් තුළ ඒවා සාර්ථක ලෙස අලෙවි කිරීම සඳහා නව තාක්ෂණය යොදා ගත හැකි ආකාර එහිදී සලකා බලන ලදි. මීට අමතරව, තාක්ෂණික උපදේශකයන් විශේෂිත දේශන පැවැත්වූ අතර මෙම ව්‍යවසායිකයන් මුහුණ දුන් ගැටළු රැසකටම ප්‍රායෝගික විසඳුම් ලබා දීමද මෙහිදී සිදු විය.







## ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ වෙසක් සැමරුම්

2015 වසරේ වෙසක් පොහොය දිනය නිමිතිකොට ගෙන ශාඛා මට්ටමින් දන්සැල් පවත්වන ලදි. ඒ ඒ බැංකු කළමනාකාරවරුන්ගේ මග පෙන්වීම යටතේ අනුරාධපුර සහ බොරැල්ල මූලස්ථාන පරිශ්‍රය ආශ්‍රිතව මෙම දන්සැල් සංවිධානය කරන ලදි.





මාතර බැංකු ශාඛාවේ 2 වන සංවත්සරය සමරමින් විශේෂ පරිත්‍යාග වැඩසටහනක් සංවිධානය කරන ලදි. මාතර 'කීර්ති කුමාර ළමා නිවාසයේ' රැකවරණය ලබන කුඩා දරුවන් හට විවිධ ද්‍රව්‍ය පරිත්‍යාග කරන ලද මෙම වැඩසටහනට මාතර බැංකු ශාඛාවේ කළමනාකරු ඇතුළු කාර්ය මණ්ඩලය සහභාගී විය.



# අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

2015 දෙසැම්බර් 31 න් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා ශ්‍රී ලංකා සේවින්ස් බෑන්ක් ලිමිටඩ්හි විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනය ඇතුළත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරනු ලබන්නේ ඉමහත් සතුටිනි.

## ව්‍යාපාර සමාලෝචනය

මෙහි දැක්වෙන සභාපතිතුමාගේ පණිවුඩය සහ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී විසින් සිදු කරන ලද මෙහෙයුම් සමාලෝචනය මගින් 2015 දෙසැම්බර් 31 න් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වන ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකු සමාගමේ මෙහෙයුම් පිළිබඳ සවිස්තර වාර්තාවක් ප්‍රකාශයට පත් වේ. මීට අමතරව පූර්ණ මෙහෙයුම් වාර්තාවක් විගණන නිලධාරීන් විසින් ඉදිරිපත් කෙරෙන 'විගණන වාර්තාව' ට ඇතුළත් වෙයි.

## බැංකුවේ නෛතික තත්ත්වය

2006 ජූලි 07 වන දින 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි අංක N (PBS) 1336 සහිතව පිහිටුවන ලද ශ්‍රී ලංකා සේවින්ස් බෑන්ක් ලිමිටඩ් 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ අංක PB 296 සහිතව නැවත ලියාපදිංචි කරන ලදි. ඉන් අනතුරුව 1988 අංක 30 දරන බැංකු පනත යටතේ විශේෂිත බැංකුවක් ලෙස බලපත්‍ර ලබා දීමෙන් පසුව 2008 මාර්තු 10 වැනි දින බැංකු ව්‍යාපාර කටයුතු අරඹන ලදි.

## අධ්‍යක්ෂ මණ්ඩලය

මෙහිදී සමාලෝචනයට ලක් වන කාල සීමාව සඳහා ශ්‍රී ලංකා සේවින්ස් බෑන්ක්හි අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් 14 දෙනෙකුගෙන් සමන්විත විය. බැංකුවේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුකූල පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලු දෙනාම පත් කරනු ලබන්නේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසිනි. සාමාන්‍යයෙන් මසකට වරක් හෝ රැස්වීම් පවත්වන අධ්‍යක්ෂ මණ්ඩලය 2015 වසර තුළදී 17 වරක් රැස් වන ලදි. 2015 වසරේ අධ්‍යක්ෂවරුන්ගේ නම් පහත දැක්වේ:

- අසෝක සෝමරත්න මහතා - සභාපති (2015.06.08 දින දක්වා)
- කරුණාරත්න අමරසිංහ මහතා (ක්‍රියාකාරී අධ්‍යක්ෂ/ 2015.06.08 සිට වැඩබලන සභාපති)
- එස්. ඒ. සී. කුලතිලක මිය (භාණ්ඩාගාර නියෝජිත)
- සුනිල් විතාරණගේ මහතා
- සෑම් සමරසිංහ මහතා (2015.12.11 දින දක්වා)
- ශාන්තිලාල් කොණ්ඩේගම මහතා
- ඒ. ශෂිමාල් මඩපාත මහතා
- දුශ්‍යන්ති වික්‍රමාරච්චි මෙනවිය
- වයි. ජී. පී. දයානන්ද මහතා
- ප්‍රසංග එන්. පෙරේරා මහතා
- හිරාන් විචක්ෂණ මහතා
- එස්. ලංකේශ්වර මහතා (2015.07.13 දින සිට)
- ඒ. එල්. එම්. යුසුෆ් මහතා (2015.02.12 දින සිට 2015.03.30 දින දක්වා)
- එල්. විජේවර්ධන මහතා (2015 මාර්තු මස සිට 2015.04. 28 දින දක්වා)

## 2015 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගීත්වය

| නම | පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව | සහභාගී වූ රැස්වීම් ගණන |
|---|---|---|
| අසෝක සෝමරත්න මහතා - සභාපති (2015.06.08 දින දක්වා) | 17 | 08 |
| කරුණාරත්න අමරසිංහ මහතා (2015.06.08 දින සිට වැඩබලන සභාපති) | 17 | 17 |
| එස්. ඒ. සී. කුලතිලක මිය | 17 | 14 |
| එස්. විතාරණගේ මහතා | 17 | 15 |
| ඒ. එස්. මඩපාත මහතා | 17 | 16 |
| එස්. සමරසිංහ මහතා | 17 | 16 |
| ප්‍රසංග එන්. පෙරේරා මහතා | 17 | 14 |
| ඩී. වික්‍රමාරච්චි මෙනවිය | 17 | 14 |
| එස්. කොණ්ඩේගම මහතා | 17 | 16 |
| වයි. ජී. පී. දයානන්ද මහතා | 17 | 06 |
| එස්. ලංකේශ්වර මහතා (2015.07.13 දින සිට) | 17 | 08 |
| හිරාන් විචක්ෂණ මහතා | 17 | 04 |

## කොන්ත්‍රාත් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ අභිලාෂ

මූල්‍ය ප්‍රකාශන සඳහා යොදා ඇති අංක 33 සටහන මගින් දක්වා ඇති කරුණු අරබයා හැර අන් කිසිදු අවස්ථාවක අධ්‍යක්ෂවරුන් හට බැංකුවට අදාළ කිසිදු සෘජු හෝ වක්‍ර කොන්ත්‍රාත්තුවක් පිළිබඳ අභිලාෂයක් නොමැත.

## අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීමක් වෙයි. එහිදී බැංකුව විසින් සිදු කරනු ලබන සියලුම ආකාරයේ ගනුදෙනුවලට අදාළ ගිණුම් වාර්තා පොත් නිසි පරිදි පවත්වා ගනු ලැබෙන බව සහතික කොට අදාළ මූල්‍ය වර්ෂය තුළ බැංකුව ලබා ඇති ලාභ/සිදුව ඇති පාඩු පිළිබඳව සත්‍ය හා සාධාරණ විග්‍රහයක් සිදු වන පරිදි මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබයි. මූල්‍ය වාර්තා සකස් කිරීමේදී බැංකු කළමනාකාරීත්වය සතු වන වගකීම් නිරන්තරයෙන් පැවැත්වෙන රැස්වීම් සමාලෝචන සහ විගණන කමිටු වාර්තා ඇසුරින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධීක්ෂණය කරනු ලබයි.

## අභ්‍යන්තර පාලන පද්ධති

ව්‍යාපාරික කටයුතු විධිමත්ව සිදු කිරීමට අවශ්‍ය වන පරිදි බැංකුවේ මූල්‍යමය මෙහෙයුම් සහ අනුකූලතා හා අවදානම් කළමනාකරණය ආදියද ආවරණය වන අංග සම්පූර්ණ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කර තිබේ. බැංකුව සතු වත්කම් හා වගකීම් කළමනාකරණය කර ගැනීමටත්, වාර්තාවල නිරවද්‍යභාවය හැකිතාක් සහතික කොට පවත්වා ගැනීමටත්, මෙහෙයුම්වල නිවැරදිභාවය ආරක්ෂා කර ගැනීමටත් ඉන් සහාය ලැබේ.

## ආයතනික යහපාලනය

මනා ආයතනික පාලනයක් පවත්වා ගනු ලැබෙන බව සහතික කිරීම සඳහා නිසි පරිදි පද්ධති හා ක්‍රමවේද ස්ථාපිත කොට ඇති අතර මීට අදාළ වැඩිදුර තොරතුරු මෙම වාර්තාවේ පිටු අංක 30 හි සවිස්තරව දක්වා ඇත.

## විගණන කමිටුව

පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සාමාජිකයන් ලෙස කටයුතු කරන ලදි.

- එස්. ඒ. සී. කුලතිලක මිය - කමිටුවේ සභාපතිනිය
- කේ. අමරසිංහ මහතා - කමිටු සාමාජික
- සුනිල් විතාරණගේ මහතා - කමිටු සාමාජික

විගණන කමිටු වාර්තාව මෙහි 57 පිටෙහි දැක්වේ.

## දැක්ම, මෙහෙවර සහ ආයතනික චර්යාව

බැංකුවේ දැක්ම හා මෙහෙවර පිටු අංක 2, 3 හි සඳහන් වේ. එම දැක්ම හා මෙහෙවර සාක්‍ෂාත් කර ගැනීමේ අරමුණින් ඉහළම ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි බැංකුවේ ව්‍යාපාරික කටයුතු සිදු කර තිබේ.

## විගණන නිලධාරීන්

මෙම සමාලෝචනයට ලක් වන කාල සීමාව සඳහා වන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති විසින් විගණනය කරන ලදි. විගණකාධිපති පත් කිරීම අනුමත කිරීමට අදාළ යෝජනාවක් වාර්ෂික මහා සභා රැස්වීමේදී ඉදිරිපත් කෙරිණ.

## කාර්ය මණ්ඩලය

2015 දෙසැම්බර් 31 දින වන විට බැංකු කාර්ය මණ්ඩලය සේවක මහත්ම මහත්මීන් 106 දෙනෙකුගෙන් සමන්විත වූ අතර එහි සංයුතිය පහත දැක්වේ:

**2015.12.31 දිනට කාර්ය මණ්ඩල සංයුතිය**

| තනතුර | සේවක සංඛ්‍යාව |
|---|---|
| සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. | 01 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකාර | 08 |
| කළමනාකාර | 05 |
| ශාඛා කළමනාකාර | 04 |
| නියෝජ්‍ය කළමනාකාර | 04 |
| සහකාර කළමනාකාර | 08 |
| බැංකු නිලධාරී | 04 |
| ණය නිලධාරී | 07 |
| අයකර ගැනීමේ නිලධාරී | 01 |
| ජ්‍යෙෂ්ඨ බැංකු සහකාර | 15 |
| ලේකම් (I ශ්‍රේණිය) | 02 |
| බැංකු සහකාර | 25 |
| නීති සහකාර | 01 |
| පිළිගැනීමේ නිලධාරී හා දුරකථන ක්‍රියාකරු | 01 |
| භාරකරු/රැකවල්කරු | 03 |
| ජ්‍යෙෂ්ඨ රියදුරු | 05 |

| | |
|---|---|
| රියදුරු | 02 |
| ජ්‍යෙෂ්ඨ කාර්යාල සහකාර | 03 |
| කාර්යාල සහකාර | 01 |
| කම්කරු | 02 |
| පුහුණුව ලබන්නන් | 03 |
| ව්‍යාපාර සංවර්ධන නිලධාරී | 01 |
| එකතුව | 106 |

## සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී (ප්‍ර.වි.නි)

බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී ලෙස කටයුතු කරන සාමාන්‍යාධිකාරීවරයා පත් කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි. අධ්‍යක්ෂ මණ්ඩලයේ ඇරයුමින් සාමාන්‍යාධිකාරී/ප්‍ර. වි. නි. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගී වෙයි.

## ව්‍යාපාරික අඛණ්ඩතාව

ශ්‍රී ලංකා සේවින්ස් බෑන්ක්හී ව්‍යාපාරික මෙහෙයුම් ඉදිරියටත් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සම්පත් ප්‍රමාණවත් ලෙස පැවතීම ගැන අධ්‍යක්ෂ මණ්ඩලය සතුට පළ කරයි. මේ අනුව, මෙම මූල්‍ය ප්‍රකාශනය සකසනු ලැබ ඇත්තේ එකී ව්‍යාපාරික අඛණ්ඩතා සංකල්ප මත පදනම් වෙමිනි.

## මූල්‍ය ප්‍රකාශනය

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්, 1988 අංක 30 දරන බැංකු පනතේ විධිවිධාන හා ඒවාට සිදු කර ඇති සංශෝධන සහ පොදුවේ පිළිගනු ලබන ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මෙහි සමාලෝචනයට ලක් වන වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබේ. එම කාර්යය අතරවාරයේදී අවශ්‍ය අවස්ථාවලදී සාධාරණ සුපරීක්ෂාකාරී තීන්දු ගැනීම් සිදු කර තිබේ.

## ලාභ සහ විසර්ජනයන් (දහස් ගණන්වලින්)

| මූල්‍ය වර්ෂාවසානයේදී | 31.12.2015 (රු.) | 31.12.2014 (රු.) |
|---|---|---|
| බදුවලට පෙර ලාභය | 432,283 | 267,686 |
| බදු | - | 32,831 |
| බදුවලට පසු ලාභය | 432,283 | 234,855 |
| රඳවාගත්/(පාඩුව) ඉදිරියට ගෙන යන ලද ලාභය | 2,477,641 | 2,283,772 |
| විසර්ජනය සඳහා ඇති ලාභය | 432,283 | 234,855 |
| අධ්‍යක්ෂවරුන් විසින් පහත සඳහන් විසර්ජනයන් සිදු කරන ලදී: සංචිත සඳහා | (594,091) | 33,509 |
| ඉදිරියට ගෙන යන ලද රඳවාගත් ලාභය | 2,315,832 | 2,485,118 |

## ආදායම

2015 දෙසැම්බර් 31 න් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වන බැංකුවේ සමස්ථ දළ ආදායම රු. මිලියන 746 ක් විය.

## ප්‍රාග්ධන වියදම්

මෙම සමාලෝචනයට ලක් වන මූල්‍ය වර්ෂය තුළ බැංකුව විසින් දේපල, පිරියත හා උපකරණ ලබා ගැනීම සඳහා රු. මිලියන 26.79 ක මුදලක් වැය කර තිබේ. මීට අදාළ ගිණුම් විස්තර මුදල් ප්‍රවාහ ප්‍රකාශන සටහනෙහි දක්වා ඇත.

## ව්‍යවස්ථාපිත ගෙවීම්

රජය වෙත සහ සේවකයන්ට අදාළව ගෙවිය යුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නිසි කලට ගෙවා ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය තම දැනුමේ හා විශ්වාසයේ හැටියට සෑහීමකට පත් වෙයි.

## ශේෂ පත්‍රයෙන් පසු සිදුවීම්

සංශෝධන හෝ ගිණුම් පත්‍රයෙහි සඳහන් කළ යුතු කිසිදු සිදුවීමක් ශේෂ පත්‍රය සැකසූ දින සිට සිදුව නොමැත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමයෙන්

..............................................

**ඒ. ආර්. ආර්. පියසේකර**

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

ශ්‍රී ලංකා සේවින්ස් බෑන්ක් ලිමිටඩ්

කොළඹ

# ආයතනික **යහපාලනය**

**2007 නො. 12 දරණ බැංකු පනතට අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා නිර්දේශකර ඇති ආයතනික යහපාලන නීති රෙගුලාසි වලට ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව අනුගත වී ඇති ආකාරය පහතින් දැක්වේ.**

| ආයතනික පාලන වගන්ති හා රීති | අනුකූලතා මට්ටම |
|---|---|
| 3 (1) අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීම් | |
| 3 (1) (i). පහත විධිවිධාන ක්‍රියාත්මක කිරීම තුළින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ ආරක්ෂාව හා ස්ථාවරභාවය ශක්තිමත් කළ යුතු වේ. | |
| (අ). බැංකුවේ ක්‍රමෝපාය හා අරමුණු හා ආයතනික වටිනාකම් අනුමත කොට නිසි පරිදි අධීක්ෂණය කිරීම හා ඒවා බැංකුව පුරා නිසි පරිදි සන්නිවේදනය වන බව සහතික කිරීම. | අනුකූලතාව දක්වා ඇත |
| (ආ). සමස්ථ අවදානම් ප්‍රතිපත්තිය හා අවදානම් කළමනාකරණ ක්‍රමවේද හා යාන්ත්‍රණයන් මිනුම්ගත කළ හැකි ඉලක්කද සහිතව අවම වශයෙන් ඉදිරි වසර තුනක කාලය සඳහා අනුමත කිරීම. | අනුකූලතාව දක්වා ඇත |
| (ඇ). මූලික අවදානම් හඳුනාගැනීම සහ එකී අවදානම් කළමනාකරණය කර ගැනීම සඳහා සුදුසු පද්ධතීන් ක්‍රියාත්මක වන බව සහතික කිරීම. | අනුකූලතාව දක්වා ඇත |
| (ඈ). සියලුම පාර්ශ්වකරුවන් සමග සන්නිවේදන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත කිරීම. තැන්පතුකරුවන්, ණයහිමියන්, කොටස් හිමියන් සහ ණය ගන්නා පාර්ශව යනාදී සියලු පාර්ශවකරුවන් සඳහා සන්නිවේදන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දීම. | අනුකූලතාව දක්වා ඇත |
| (ඉ). බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධති සහ කළමනාකරණ තොරතුරු පද්ධතිවල ප්‍රමාණවත්භාවය හා ඒකාබද්ධභාවය සමාලෝචනය කිරීම. | අනුකූලතාව දක්වා ඇත |
| (ඊ). (i). සැලකිය යුතු තරමින් ප්‍රතිපත්ති කෙරෙහි බලපෑම් ඇති කිරීම, (ii). ඍජු ක්‍රියාමාර්ග, සහ (iii). ව්‍යාපාරික කටයුතු, මෙහෙයුම් සහ අවදානම් කළමනාකරණය විෂයික බලය පැවරූ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ජාත්‍යන්තර ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුව පත් කිරීම. | අනුකූලතාව දක්වා ඇත |
| (උ). අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට අදාළ අධිකාරත්ව ක්ෂේත්‍ර හා වගකීම් නිර්වචනය කිරීම. | අනුකූලතාව දක්වා ඇත |
| (ඌ). බැංකුවේ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් විසින් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිපත්තිවලට අනුකූලව බැංකු කටයුතු නිසි පරිදි ප්‍රමාණවත්ව අධීක්ෂණය කරනු ලැබෙන බව සහතික කිරීම. | අනුකූලතාව දක්වා ඇත |

| ආයතනික පාලන වගන්ති හා රීති | අනුකූලතා මට්ටම |
|---|---|
| (එ). පහත කරුණුද ඇතුළත්ව අධ්‍යක්ෂ මණ්ඩලයේ පාලන පරිචයන් හී සාර්ථකත්වය කලින් කල තක්සේරු කිරීම: <br>(i). අධ්‍යක්ෂවරුන් හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් තෝරා ගැනීම, නම් යෝජනා කිරීම හා පත් කිරීම. <br>(ii). කළමනාකරණ තීන්දු ආශ්‍රිත ගැටුම් හා අභිලාෂ. <br>(iii). දුර්වලතා හඳුනා ගැනීම හා අවශ්‍ය අවස්ථාවලදී සංශෝධන සිදු කිරීම. | අනුකූලතාව දක්වා ඇත |
| (ඒ). ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් වෙනුවෙන් යෝග්‍ය අනුප්‍රාප්ති පිළිවෙළ සැලැස්මක් ඇති බව සහතික කිරීම. | අනුකූලතාව දක්වා ඇත |
| (ඔ). ප්‍රතිපත්ති සමාලෝචනය, සන්නිවේදන මාර්ග ස්ථාපිත කිරීම සහ ආයතනික අරමුණු සාධනයෙහි ප්‍රගතිය නිරීක්ෂණය කිරීම වැනි අරමුණු සඳහා අවශ්‍යතා ඉස්මතු වන අවස්ථාවලදී නිරන්තරයෙන් රැස්වීම. | 2016 දී අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සංශෝධනය කරන ලදී. |
| (ඕ). නියාමන පරිසරය වටහා ගැනීම සහ බැංකුව විසින් අදාළ නියාමන අධිකාරීන් සමග එලදායී සබඳතාවක් පවත්වා ගනු ලැබෙන බව සහතික කිරීම. | අනුකූලතාව දක්වා ඇත |
| (ඖ). බාහිර විගණන නිලධාරීන් බඳවා ගැනීමේදී නිසි සුපරීක්ෂාකාරීත්වය අනුගමනය කිරීම (අනුකූලතා නිලධාරීගේ උපදෙස් පරිදි). | අනුකූලතාව දක්වා ඇත <br>රජයේ විගණකවරුන් විසින් විගණන කටයුතු සිදු කරන ලදි |
| 3 (1) (ii). අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී පත්කරනු ලැබිය යුතු අතර ඔවුන්ගේ කාර්යයන් හා වගකීම් නියෝග මාලාවේ 3(5) නියෝගය ප්‍රකාර නිශ්චිතව දැක්වීම හා අනුමත කිරීම කළ යුතුය. | අනුකූලතාව දක්වා ඇත |
| 3 (1) (iii). අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රමිකව රැස්විය යුතු අතර අවම වශයෙන් වසරකට දොළොස් වතාවක්වත් ආසන්න වශයෙන් මසක කාල පරතරයක් සහිතව එකී රැස්වීම් පැවැත්විය යුතුය. මෙම රැස්වීම් වලට සහභාගීවීමට හැකියාව ඇති අධ්‍යක්ෂවරුන්ගෙන් බහුතරයක සක්‍රිය දායකත්වය තිබිය යුතුය. ලිඛිත යෝජනා, පත්‍රිකා බෙදාහැරීම තුළින් අධ්‍යක්ෂවරුන්ගේ එකඟතාව ලබා ගැනීම හැකිතාක් අවම කළ යුතුය. | අනුකූලතාව දක්වා ඇත |

| ආයතනික පාලන වගන්ති හා රීති | අනුකූලතා මට්ටම |
|---|---|
| 3 (1) (iv). ක්‍රමිකව පැවැත්වෙන මණ්ඩල රැස්වීම්වල න්‍යායපත්‍රයට බැංකුවේ ප්‍රවර්ධනය, අවදානම් කළමනාකරණයට අදාල කරුණු හා යෝජනා ඇතුලත් කිරීමට අධ්‍යක්‍ෂකවරුන්ට හැකිවනසේ විධිවිධාන සලසා ඇති බවට අධ්‍යක්‍ෂ මණ්ඩලය සහතික විය යුතුය. | අනුකූලතාව දක්වා ඇත |
| 3 (1) (v). සෑම අධ්‍යක්‍ෂවරයෙකුටම විධිමත් මාසික රැස්වීම්වලට සහභාගී වීමට අවස්ථාව ලැබෙන පරිදි අවම වශයෙන් දින 7 කට පෙරවත් දැනුම් දීමක් සිදු කළ යුතුය. අනෙකුත් සියලුම අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් වෙනුවෙන්ද සාධාරණ පූර්ව දැනුම් දීමක් සිදු කළ යුතු වේ. | අනුකූලතාව දක්වා ඇත |
| 3 (1) (vi). කිසියම් අධ්‍යක්‍ෂවරයෙකු ආසන්නතම මාස 12 ක කාලයක් තුළ පවත්වන ලද රැස්වීම්වලින් තුනෙන් දෙකකට හෝ එක දිගට යෙදෙන රැස්වීම් වාර තුනකට හෝ සහභාගී නොවන්නේ නම් ඔහුගේ/ඇයගේ අධ්‍යක්‍ෂ තනතුර අහෝසි වන පරිදි විධිවිධාන සැකසිය යුතුය. කෙසේ වෙතත්, වෙනත් අධ්‍යක්‍ෂවරයෙකු ලවා තම සහභාගීත්වය දැක්වීම අදාළ අධ්‍යක්‍ෂවරයාම/වරියම සහභාගී වූ ලෙස සැලකිය යුතුය. | අනුකූලතාව දක්වා නොමැත.<br><br>ආයතනික පාලන රීති සංග්‍රහයට අනුකූල වන පරිදි රැස්වීම්වලට සහභාගී වීමේ අවශ්‍යතා පිළිබඳව අධ්‍යක්‍ෂවරුන් දැනුවත් කර තිබේ. එක් අධ්‍යක්‍ෂවරයෙකු එක දිගට යෙදුණු රැස්වීම් වාර 03 ක් සඳහා සහභාගී වී නොමැති අතර අනෙකුත් අධ්‍යක්‍ෂවරුන් වසර තුළ පැවැත්වුණු රැස්වීම් සමස්ථයෙන් 2/3 කට අධික ප්‍රමාණයක් සඳහා සහභාගී තිබේ. |
| 3 (1) (vii). 1988 අංක 30 දරන බැංකු පනතේ 76 ඌ වගන්තිය සමග අර්ථකථනය කළ යුතු 43 වගන්තිය මගින් දැක්වෙන විධිවිධාන සන්තෘප්ත කරන සමාගම් ලේකම්වරයෙකු අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු වෙයි. සමාගම් ලේකම්ගේ මූලික වගකීම් වන්නේ අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙනුවෙන් ලේකම් කටයුතු ඉටු කිරීම, කොටස් හිමියන්ගේ රැස්වීම් සඳහා කටයුතු ඉටු කිරීම සහ සමාගමික ව්‍යවස්ථා සහ අනෙකුත් රෙගුලාසි මගින් ස්ථාපිත කාර්යයන් ඉටු කිරීම ආදියයි. | අනුකූලතාව දක්වා ඇත |
| 3 (1) (viii). සෑම අධ්‍යක්‍ෂවරයෙකු හටම සමාගම් ලේකම්ගේ උපදෙස් හා සේවාවන් ලබා ගැනීමට හැකි විය යුතුය. අධ්‍යක්‍ෂ මණ්ඩල ක්‍රමවේද සහ සියලුම අදාළ රීති හා රෙගුලාසි අනුගමනය කරනු ලැබෙන බව සහතික කිරීම එහි අරමුණ විය යුතුය. | අනුකූලතාව දක්වා ඇත |

| ආයතනික පාලන වගන්ති හා රීති | අනුකූලතා මට්ටම |
|---|---|
| 3 (1) (ix). සමාගම් ලේකම් විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා සකස් කොට පවත්වා ගත යුතු අතර ඕනෑම අධ්‍යක්ෂවරයෙකුට ඕනෑම අවස්ථාවකදී එකී වාර්තා පරීක්ෂා කර බැලීමට විවෘත විය යුතුය. | අනුකූලතාව දක්වා ඇත |
| 3 (1) (x). අධ්‍යක්ෂ මණ්ඩලය තම කාර්යභාරයන් සහ වගකීම් ඉටු කිරීමේදී නිසි සුපරීක්ෂාකාරීත්වයෙන් යුතුව කටයුතු කර තිබේද යන වග හඳුනාගත හැකි වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා ප්‍රමාණවත් විස්තර කිරීම් සහිතව වාර්තාගත කළ යුතු වේ. එසේම, එකී වාර්තා නියාමන හා අධීක්ෂණ අධිකාරීන් හට තොරතුරු ලබා ගත හැකි යොමු වශයෙන්ද සකස් කළ යුතු වේ. මේ නිසා, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවලට පහත කරුණු පැහැදිලිව ඇතුළත් විය යුතුය:<br>(අ). අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදා ගන්නා ලද දත්ත හා තොරතුරුවල සාරාංශයක්.<br>(ආ). අධ්‍යක්ෂ මණ්ඩලයේ අවදානයට ලක් වූ කරුණු<br>(ඇ). කරුණු සොයා ගැනීමේ සාකච්ඡා සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තම කාර්යයන් නිසි සුපරීක්ෂාවෙන් සිදු කරන ලද්දේද යන වග හඳුනා ගැනීමට සහාය වන කරුණු.<br>(ඈ). අදාළ විධායක නිලධාරීන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත උපාය මාර්ග හා ප්‍රතිපත්තිවලට අනුකූලතාව දක්වා තිබේද යන වග දැක්වෙන වාචික සාක්ෂි හෝ තහවුරු කිරීම් පිළිබඳ විස්තර.<br>(ඉ). බැංකුව මුහුණ පා ඇති අවදානම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනුම හා අවබෝධය සහ යොදා ගන්නා ලද අවදානම් කළමනාකරණ විධිවිධාන පිළිබඳ සමාලෝචන, සහ<br>(ඊ). ගනු ලැබෙන තීන්දු සහ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා ආදිය. | අනුකූලතාව දක්වා ඇත |
| 3 (1). (xi). අදාළ අවස්ථාවලදී සාධාරණ ඉල්ලීම් කිරීමක් මගින් අධ්‍යක්ෂවරුන්ට බැංකුවේ වියදමින් ස්වාධීන වෘත්තීමය උපදෙස් පැතීමට ඉඩ සලසන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ක්‍රමවේදයක් තිබිය යුතුය. අදාළ අධ්‍යක්ෂවරයා/වරිය හෝ අධ්‍යක්ෂවරුන්ට බැංකු කටයුතු සිදු කිරීම සඳහා එකී ස්වාධීන වෘත්තීය උපදෙස් වෙනම ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කළ යුතුය. | අධ්‍යක්ෂවරුන්ට අවශ්‍ය හා සුදුසු අවස්ථාවලදී ස්වාධීන වෘත්තීමය උපදෙස් ලබා ගැනීමට අවස්ථාව සලසා ඇත.<br><br>අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට නියමිතය. |

| ආයතනික පාලන වගන්ති හා රීති | අනුකූලතා මට්ටම |
|---|---|
| 3 (1) (xii). අධ්‍යක්ෂවරුන් වෙනත් සමාගම් හෝ අදාළ පාර්ශ්ව හා කටයුතු කරන විට බැංකුව සමග අභිලාෂයන්ට අදාළ පරස්පරතා මතු නොවන පරිදි එසේ කළ යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බැලිය යුතු කිසියම් බැඳියා පිළිගැටුමක් කවර හෝ අධ්‍යක්ෂවරයෙකු හට තිබේ නම් එය අදාළ ගනුදෙනුවට සම්බන්ධ කිසිදු බැඳියා පිළිගැටුමක් නොමැති ස්වාධීන විධායක-නොවන අධ්‍යක්ෂවරුන් සහභාගී වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී සලකා බැලිය යුතුය.<br>(3 (2) (iv) නියමය බලන්න). එසේම, තමන්ගේ හෝ තම සමීප ඥාතියෙකුගේ ව්‍යාපාරික බැඳියා පිළිගැටුමකට සම්බන්ධ කිසිදු අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවක් සඳහා ඡන්දය පාවිච්චි කිරීමෙන් අධ්‍යක්ෂවරුන් වැළකිය යුතු අතර එවැනි අධ්‍යක්ෂවරයෙකු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ අදාළ න්‍යාය පත්‍ර අයිතමය සඳහා ගණ පූරණය වෙනුවෙන් සලකා බලනු නොලැබේ. | අනුකූලතාව දක්වා ඇත |
| 3 (1) (xiii). බැංකුවේ පාලනය හා මෙහෙයවීම සම්පූර්ණයෙන්ම එහි පාලන බලාධිකාරිය යටතේ පවතින බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තීන්දු සඳහා විශේෂයෙන් වෙන් කර ඇති කරුණු අරබයා විධිමත් කාර්ය සටහනක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වා ගෙන යා යුතු වේ. | බැංකුවේ පාලනය හා මෙහෙයවීම සම්පූර්ණයෙන්ම එහි පාලන බලාධිකාරිය යටතේ පවතින බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තීන්දු සඳහා විශේෂයෙන් වෙන් කර ඇති කරුණු අරබයා විධිමත් කාර්ය සටහනක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වා ගෙන යනු ලැබේ.<br><br>මේ පිළිබඳ විධිමත් කාර්ය සටහනක් සැකසිය යුතුව තිබේ. |
| 3 (1) (xiv). තම බැඳීම් නිසි පරිදි ඉටු කිරීමට බැංකුව අසමත් හෝ එසේ වීමට ඉඩ ඇති බව හෝ වස්තුභංගත්වයට ලක් වීමට ආසන්න බව හෝ තැන්පත්කරුවන් සහ අනෙකුත් ණය හිමියන් හේතුවෙන් ගෙවීම් සිදු කිරීම අත්හිටුවීමට සූදානම් බව හෝ හැඟී යන්නේ නම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒ පිළිබඳව කිසිදු තීන්දුවක් හෝ ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙර ඒ බව වහාම බැංකු අධීක්ෂණය පිළිබඳ අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දීමට කටයුතු කළ යුතුය. | බැංකුව වස්තුභංගත්වයට ලක් වීමට ඉඩ ඇති ඕනෑම තත්ත්වයක් උද්ගත වූ වහාම කිසිදු තීන්දුවක් හෝ ක්‍රියාමාර්ගයක් ගැනීමට ප්‍රථම ඒ බව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දිය යුතු බව අධ්‍යක්ෂ මණ්ඩලය අවබෝධ කරගෙන සිටියි. |
| 3 (1) (xv). ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත සහ අනෙකුත් සුදුසු කරුණු ඇසුරින් මුදල් මණ්ඩලයේ අවශ්‍යතා ඉටු වන පරිදි බැංකුව හොඳින් ප්‍රාග්ධනීකරණය කර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කළ යුතුය. | බැංකුවේ ප්‍රාග්ධන ගැටලුව සම්බන්ධ විමසුම් ලබාගැනීම සඳහා අදල අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. විකල්ප විසඳුම් ලෙස පහත යෝජනා ඉදිරිපත් කර ඇත:<br><br>▪ රජයේ අයවැය යෝජනාවට අනුව ජාතික ඉතිරි කිරීමේ බැංකුව සමග ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව ඒකාබද්ධ කිරීම<br><br>▪ රජයේ මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධනය වශයෙන් අරමුදලක් ලබා ගැනීම<br><br>▪ ණයකර නිකුත් කිරීම |

| ආයතනික පාලන වගන්ති හා රීති | අනුකූලතා මට්ටම |
|---|---|
| 3 (1) (xvi). මෙම නියමයන්ගේ 3වන නියමයට අනුකූල වන පරිදි වාර්ෂික ආයතනික පාලන වාර්තාවක් බැංකුවේ වාර්ෂික වාර්තාවෙහි කොටසක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කළ යුතුය. | අනුකූලතාව දක්වා ඇත |
| (1) (xvii). සෑම අධ්‍යක්ෂවරයෙකු විසින්ම වාර්ෂිකව සිදු කළ යුතු ස්වයං තක්සේරු ක්‍රමයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ යුතු අතර එවැනි තක්සේරුකිරීම්/ඇගයීම්වල වාර්තා පවත්වා ගත යුතුය. | අනුකූලතාව දක්වා ඇත |
| 3 (2). අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය<br>3 (2) (i). බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 7 කට නොඅඩු හා 13 කට නොවැඩි පිරිසකගෙන් සමන්විත විය යුතුය. | අනුකූලතාව දක්වා ඇත |
| 3 (2) (ii)<br>(අ). ප්‍රධාන විධායක නිලධාරී තනතුර දරන අධ්‍යක්ෂවරයෙකු හැර වෙනත් ඕනෑම අධ්‍යක්ෂවරයෙකුගේ සේවා කාලය වසර 09 නොඉක්මවිය යුතු අතර එවැනි අධ්‍යක්ෂවරයෙකු 2008 ජනවාරි 01 දින සිටම අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරමින් සිටින කාලය ඊට ඇතුළත් කොට සලකා බැලිය යුතුය. | අනුකූලතාව දක්වා ඇත |

| ආයතනික පාලන වගන්ති හා රීති | අනුකූලතා මට්ටම |
|---|---|
| (ආ). මෙහිදී පහත විධිවිධානද සැලකිල්ලට ගත යුතුය:<br>(අ). 2008 ජනවාරි01 වන විට සේවා කාලය වසර නවය ඉක්මවා ඇති එක් අධ්‍යක්ෂවරයෙකු පමණක් සිටී නම් ඔහු/ඇය 2008 දෙසැම්බර් 31 දින බැංකුවේ අධ්‍යක්ෂ තනතුරෙන් ඉවත් වන බව සැලකිය යුතුය.<br>(ආ). 2008 ජනවාරි 01 වන විට අධ්‍යක්ෂ මණ්ඩල සේවා කාලය වසර නවය ඉක්මවා ඇති අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් සිටී නම් පහත විධිවිධාන අදාළ වෙයි:<br>I. වසර නවය ඉක්මවන එකී අධ්‍යක්ෂවරුන් අතරින් වැඩි සේවා කාලයක් අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කර ඇති පුද්ගලයා 2008 දෙසැම්බර් 31 දින සිට තනතුරින් ඉවත් වන බව සැලකිය යුතුය.<br>II. අනතුරුව 2008 ජනවාරි 01 දින වන විට වසර නවයකට අධික කාලයක් අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරමින් සිට ඇති අධ්‍යක්ෂවරුන් සියලුම දෙනා ඉවත් කරන තුරු අවම වශයෙන් වසරකට එක් අයෙකු බැගින්වත් වැඩිම සේවා කාලයේ සිට අඩුම සේවා කාලය දක්වා සැලකිල්ලට ගනිමින් පිළිවෙළින් ඉවත් කළ යුතුය. මේ අනුව 2008 ජනවාරි 01 දින වන විට සේවා කාලය වසර නවය ඉක්මවා ඇති සියලුම අධ්‍යක්ෂවරුන් 2011 දෙසැම්බර් 31 වන විට ඉවත් වන බව සැලකිය යුතුයි.<br>(ඇ). 2008 ජනවාරි 01 සිට 2010 දෙසැම්බර් 31 දක්වා කාලය ඇතුළත සේවා කාලය වසර නවය සම්පූර්ණ කිරීමට නියමිත අධ්‍යක්ෂවරුන් වේ නම්, ඉහත 3(2)(ii)(ආ) වගන්තිය ප්‍රකාරව අධ්‍යක්ෂවරුන් ඉවත් කිරීමෙන් අනතුරුව අවම වශයෙන් වසරකට එක් අයෙකු බැගින්වත් අධ්‍යක්ෂවරයෙකු ලෙස වැඩිම සේවා කාලයේ සිට අඩුම සේවා කාලය දක්වා සැලකිල්ලට ගනිමින් පිළිවෙළින් ඉවත් කළ යුතුය. කෙසේ වෙතත්, මෙම (ඇ) උප-වගන්තිය යටතට ගැනෙන සියලුම අධ්‍යක්ෂවරුන් 2011 දෙසැම්බර් 31 දින වන විට අධ්‍යක්ෂ තනතුරෙන් ඉවත් වන බව සැලකිය යුතුයි. | අනුකූලතාව දක්වා ඇත |
| 3 (2) (iii). අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින විධායක අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව සමස්ථ අධ්‍යක්ෂ සංඛ්‍යාවෙන් තුනෙන් එක නොඉක්මවිය යුතුය යන කොන්දේසියට යටත්ව කිසියම් බැංකුවක සේවකයෙකු එහි අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත් කිරීමට, ඡන්දයෙන් තෝරා ගැනීමට හෝ නම් යෝජනා කිරීමට හෝ හැකියාව ඇත (මෙහි මින්මතු ''විධායක අධ්‍යක්ෂ'' ලෙස සඳහන් වන). | අනුකූලතාව දක්වා ඇත |

| ආයතනික පාලන වගන්ති හා රීති | අනුකූලතා මට්ටම |
|---|---|
| 3 (2) (iv). අවම වශයෙන් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු හෝ සමස්ථ අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් එකට සමාන අධ්‍යක්ෂ මණ්ඩලයට ඇතුළත් විය යුතුය. මෙම උප වගන්තිය 2010 ජනවාරි 01 දින සිට බලාත්මක වෙයි.<br><br>කිසියම් විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු පහත ලක්‍ෂණ දරයි නම් ඔහු/ඇය ස්වාධීන ලෙස සැලකිය නොහැක:<br>(අ). බැංකුවේ කොටස්වලින් සියයට 1 ඉක්මවන ප්‍රමාණයක සෘජු හෝ වක්‍ර හිමිකාරත්වය දැරීම<br>(ආ). වර්තමානය වන විට එවැනි හිමිකාරත්වයක් දරමින් සිටීම හෝ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරනු ලැබීමට ආසන්නතම පූර්ව වර්ෂ දෙකක කාලයක් තුළ දරා තිබීම, මෙහි 3(7) වගන්තියෙහි දැක්වෙන ආකාරයේ කවර හෝ ව්‍යාපාරික ගනුදෙනුවක් බැංකුව සමග සිදු කිරීම, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් සියයට 10 ඉක්මවන කොටසක හිමිකාරත්වය දැරීම.<br>(ඇ). අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරනු ලැබීමට පෙර ආසන්නතම වසර දෙකක කාලයක් තුළ බැංකුවේ සේවකයෙකු ලෙස කටයුතු කර තිබීම.<br>(ඈ). අධ්‍යක්ෂවරයෙකු, ප්‍රධාන විධායක නිලධාරී හෝ ප්‍රධාන කළමනාකරණ නිලධාරියෙකු වෙත සමීප සම්බන්ධයක් තිබීම හෝ බැංකුවේ හෝ වෙනත් බැංකුවක භෞතික කොටස් හිමියෙකු වීම. මෙහි ''සමීප සම්බන්ධයක්'' යනුවෙන් අදහස් වන්නේ කලත්‍රයා හෝ මූල්‍යමය වශයෙන් යැපෙන දරුවෙකු යන්න වේ.<br>(ඉ). බැංකුවේ සුවිශේෂී හවුල්කරුවෙකුගේ නියෝජිතයෙකු වීම.<br>(ඊ). පහත සඳහන් ආකාරයේ කිසියම් සමාගමක හෝ සංවිධානයක සේවකයෙකු, අධ්‍යක්ෂවරයෙකු හෝ භෞතික කොටස් හිමියෙකු වීම:<br>(I) මෙහි 3(7) වගන්තියෙන් දැක්වුණු පරිදි වර්තමානය වන විට බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් සියයට 10 ක් ඉක්මවන ගනුදෙනුවකට සම්බන්ධව සිටින සමාගමක හෝ සංවිධානයක, හෝ<br>(II). බැංකුවේ අනෙකුත් අධ්‍යක්ෂවරුන් සේවය කරන හෝ අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු කරන හෝ කොටස් හිමියන් වන, හෝ<br>(III). බැංකුවේ අනෙකුත් අධ්‍යක්ෂවරුන් මෙහි 3 (7) වගන්තියෙන් දැක්වෙන ආකාරයේ බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් සියයට 10 ඉක්මවන ගනුදෙනුවකට සම්බන්ධව සිටින සමාගමක හෝ සංවිධානයක<br>3(2) (V). කිසියම් ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නියෝජනය කරනු පිණිස විකල්පයක් වශයෙන් අධ්‍යක්ෂවරයෙකු පත් කරනු ලැබුවේ නම් එලෙස පත් කරන ලද පුද්ගලයාද ස්වාධීන අධ්‍යක්ෂවරුන්ට අදාළ විධිවිධාන හා නිර්ණායකවලට යටත් කොට සැලකිය යුතුය. | අනුකූලතාව දක්වා ඇත<br><br>මූල්‍ය වර්ෂය ඇතුළත කිසිදු විකල්ප අධ්‍යක්ෂවරයෙකු පත් නොකරන ලදි. |
| 3 (2)(vi). විධායක නොවන අධ්‍යක්ෂවරුන් ලෙස පත් කරනු ලැබිය යුත්තේ විශ්වාසය තැබිය හැකි ප්‍රගතියක් පෙන්නුම් කොට ඇති සහ/හෝ බැංකුවේ උපායමාර්ග, කාර්යසාධනය හා සම්පත් ඉහළ නැංවීමට දායක වන ආකාරයේ ස්වාධීන තීන්දුවක් ගැනීමට අවශ්‍ය නිපුණතා හා පළපුරුද්ද ඇති අය වේ. | සාංගමික ව්‍යවස්ථාවලට අනුව මහා භාණ්ඩාගාර ලේකම් විසින් අධ්‍යක්ෂවරුන් පත් කරනු ලැබේ. |

| ආයතනික පාලන වගන්ති හා රීති | අනුකූලතා මට්ටම |
|---|---|
| (2)(vii). කිසියම් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් සඳහා පැමිණ සිටින අධ්‍යක්ෂවරුන් අතරින් අඩකට වැඩි පිරිස විධායක නොවන අධ්‍යක්ෂවරුන් නොවන්නේ නම් එවැනි රැස්වීමක ගණ පූරණය සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව සිටින්නේ නමුදු එවැනි අවස්ථාවකදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් පැවැත්විය නොහැක. මෙම උප නියමය 2010 ජනවාරි 01 සිට බලාත්මක වේ. | අනුකූලතාව දක්වා ඇත |
| 3(2)(viii). බැංකුවේ සියලු ආකාරවල ආයතනික සන්නිවේදනයන්හිදී ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් එනමින්ම හඳුනාගත යුතුය. එසේම, බැංකුව විසින් තම වාර්ෂික ආයතනික පාලන වාර්තාවෙහි අධ්‍යක්ෂවරුන් කාණ්ඩ ඇසුරින් පැහැදිලිව අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය, සභාපති, විධායක අධ්‍යක්ෂවරුන්, විධායක නොවන අධ්‍යක්ෂවරුන් සහ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් යන සියල්ලන්ගේම නම් සඳහන් කළ යුතුය. | අනුකූලතාව දක්වා ඇත |
| 3(2)(ix). අධ්‍යක්ෂවරුන් අලුතින් පත් කිරීමේදී අනුගමනය කිරීම සඳහා විධිමත්, පිළිගත් හා විනිවිදභාවයෙන් යුතු ක්‍රමවේදයක් පවත්වා ගත යුතුය. එසේම, අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීමේදී නිසි අනුපිළිවෙළ පවත්වා ගැනීම සඳහාද විධිවිධාන තිබිය යුතුය. | මහා භාණ්ඩාගාර ලේකම් විසින් අධ්‍යක්ෂවරුන් පත් කරනු ලැබේ |
| 3(2)(x). අනියම් පුරප්පාඩු පිරවීම සඳහා පත් කරනු ලැබෙන සියලු අධ්‍යක්ෂවරුන් ඔවුන් පත් කිරීමෙන් අනතුරුව පැවැත්වෙන පළමු මහා සභා රැස්වීමේදී කොටස් හිමියන්ගේ ඡන්ද විමසීමට ලක් කළ යුතුය. | එවැනි සිදුවීම් කිසිවක් සිදු නොකෙරිණ |
| 3(2)(xi) කිසියම් අධ්‍යක්ෂවරයෙකු ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් අනතුරුව අධ්‍යක්ෂ මණ්ඩලය පහත පියවර අනුගමනය කළ යුතුය:<br>(අ). එම අධ්‍යක්ෂවරයා ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම සහ එසේ කිරීමට හෝ ඉල්ලා අස්වීමට හේතු නිවේදනය කිරීම සහ,<br>(ආ). කොටස් හිමියන්ගේ අවධානයට ලක් කිරීම අවශ්‍ය කරුණු කිසිවක් වේද යන වග සනාථ කරමින් ප්‍රකාශනයක් නිකුත් කිරීම | අනුකූලතාව දක්වා ඇත |
| 3(2)(xii). කිසියම් බැංකුවක් තවත් බැංකුවක අනුබද්ධිත ආයතනයක් හෝ ආශ්‍රිත සමාගමක් වන්නේ නම් හැර අන් කිසිදු අවස්ථාවක එවැනි බැංකුවක අධ්‍යක්ෂවරයෙකු හෝ සේවකයෙකු තවත් බැංකුවක අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා පත් කිරීම, ඡන්දයෙන් පත් කිරීම හෝ නාම යෝජනා කිරීම නොකළ යුතුය. | අනුකූලතාව දක්වා ඇත |

| ආයතනික පාලන වගන්ති හා රීති | අනුකූලතා මට්ටම |
|---|---|
| 3(3). අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාව හා උචිත බව තක්සේරු කිරීමේ නිර්ණායක<br>1988 අංක 30 දරන බැංකු පනතේ 76 ඌ වගන්තිය සමග අර්ථ ගැන්විය යුතු 42 වගන්තියේ දැක්වෙන විධිවිධානවලට අමතරව පහත දැක්වෙන නිර්ණායකද කිසියම් පුද්ගලයෙකු බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස තෝරා ගැනීමට යෝග්‍යද යන වග තීරණය කිරීමේදී යොදා ගත යුතුය. මෙහි දැක්වෙන කවර හෝ නිර්ණායකයක් සමග නොගැලපීම මත කිසියම් පුද්ගලයෙකු අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරනු ලැබීම හෝ අඛණ්ඩව පවත්වා ගනු ලැබීම අහෝසි විය යුතුය. | |
| 3(3)(i). අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරන පුද්ගලයෙකු වයස අවු. 70 නොඉක්මවිය යුතුය.<br>(අ). දැනට බැංකුවක සේවය කරමින් සිටින කිසියම් පුද්ගලයෙකුගේ වයස 2008 ජනවාරි 01 වන විට අවු. 70 ට වඩා වැඩි නම් පහත දැක්වෙන තාවකාලික විධිවිධාන අදාළ වේ. කෙසේ වුවද, එවැනි අවස්ථාවකදීද මෙහි 3(2)(ii) වගන්තියෙහි විධිවිධාන බලාත්මකව පවතී:<br><br>(අ). 2008 ජනවාරි 01 වන විට කිසියම් අධ්‍යවරයෙකුගේ/වරියකගේ වයස අවු 75 ට වැඩි නම්, එම අධ්‍යක්ෂවරයාට/වරියට 2008 දෙසැම්බර් 31 නොඉක්මවන යම්කිසි කාලයක් දක්වා තවදුරටත් අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කළ හැකි අතර 2005 දෙසැම්බර් 31 දින එම අධ්‍යක්ෂ ධූරය අහෝසි වෙයි.<br>(ආ). 2008 ජනවාරි 01 දිනට කිසියම් අධ්‍යක්ෂවරයෙකුගේ/වරියකගේ වයස අවු. 70 සිට 75 අතර වේ නම්, එම අධ්‍යක්ෂවරයාට/වරියට 2009 දෙසැම්බර් 31 නොඉක්මවන යම්කිසි කාලයක් දක්වා අධ්‍යක්ෂ ධූරයේ කටයුතු කළ හැකි අතර 2009 දෙසැම්බර් 31 එම අධ්‍යක්ෂ ධූරය අහෝසි වෙයි.<br>(ආ). බැංකුවක දැනට සේවය කරමින් සිටින අධ්‍යක්ෂවරයෙකුගේ/වරියකගේ වයස 2008 ජනවාරි 01 සහ 2009 දෙසැම්බර් 31 ඇතුළත අවු. 70 වේ නම්, මෙහි 3(2)(සස) හි දැක්වෙන විධිවිධානවලට අනුව එම අධ්‍යක්ෂවරයා/වරියට 2010 දෙසැම්බර් 31 නොඉක්මවන කාලයක් සඳහා තවදුරටත් අධ්‍යක්ෂ ධූරයේ කටයුතු කළ හැකි අතර 2010 දෙසැම්බර් 31 දින එය අහෝසි වේ. | අනුකූලතාව දක්වා ඇත |
| 3(3)(ii). කිසිදු පුද්ගලයෙකුට අනුබද්ධිත හා ආශ්‍රිත සමාගම් හා ආයතනද ඇතුළත්ව සමාගම්/ආයතන 20 කට වැඩි ප්‍රමාණයක අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කිරීමට ඉඩකඩ නොමැත. එම සමාගම්/ආයතන 20 න් 10 කට අධික ප්‍රමාණයක් 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගණකාධිකරණ හා විගණන ප්‍රමිති පනතට අනුව විශේෂිත ව්‍යාපාරික ආයතන ලෙස වර්ගීකරණය කර නොමැති ඒවා විය යුතුය. | අනුකූලතාව දක්වා ඇත |
| 3(4) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරා ඇති කළමනාකරණ කාර්යභාරයන්<br>3(4)(ස). අධ්‍යක්ෂවරුන් දැනට ක්‍රියාත්මක වෙමින් පවතින කළමනාකරණ බලතල මනාව අධ්‍යයනය කොට වටහා ගත යුතුය. | අනුකූලතාව දක්වා ඇත |

| ආයතනික පාලන වගන්ති හා රීති | අනුකූලතා මට්ටම |
|---|---|
| 3(4)(ii). සමස්ථයක් වශයෙන් අධ්‍යක්‍ෂ මණ්ඩලය සතු කාර්යභාරයන් නිදහස් කිරීම අඩු කරන හෝ ඊට බාධා ඇති කරන ආකාරයේ කිසිදු කාරණයක් හෝ වගකීමක් අධ්‍යක්‍ෂ මණ්ඩල කමිටු, ප්‍රධාන විධායක නිලධාරී, විධායක අධ්‍යක්‍ෂවරුන් හෝ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් වෙත පැවරීමෙන් අධ්‍යක්‍ෂ මණ්ඩලය වැළකී සිටිය යුතුය. | අනුකූලතාව දක්වා ඇත |
| 3(4)(iii). බැංකුවේ වගකීම් හා කාර්යභාරයන් පැවරීමේ ක්‍රියාවලීන් බැංකු අවශ්‍යතාවලට අදාළ පරිදි පවතින්නේද යන වග සහතික කිරීම සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් ක්‍රියාත්මක වෙමින් පවතින ක්‍රියාවලීන් කලින් කලට සමාලෝචනය කළ යුතුය. | අනුකූලතාව දක්වා ඇත |
| 3(5). සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී<br>3(5)(i). සභාපතිගේ සහ ප්‍රධාන විධායක නිලධාරීගේ වෘත්තීය භූමිකා එකිනෙකින් වෙන්විය යුතු අතර එකම පුද්ගලයෙකුට එකී භූමිකා දෙකම නියෝජනය කිරීමට අවසර නැත. | අනුකූලතාව දක්වා ඇත |
| 3(5)(ii). සභාපති ලෙස පත් විය යුත්තේ විධායක නොවන සහ ස්වාධීන අධ්‍යක්‍ෂවරයෙකි. සභාපතිවරයා ස්වාධීන අධ්‍යක්‍ෂවරයෙකු නොවන්නේ නම් අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් වඩා ඉහළ ස්වාධීන නියෝජනයක් සිදු වන බව සහතික කරනු පිණිස සුදුසු ස්වාධීන අධ්‍යක්‍ෂවරයෙකු ජ්‍යෙෂ්ඨ අධ්‍යක්‍ෂ ලෙස පත් කරනු ලැබිය යුතුය. එම ජ්‍යෙෂ්ඨ අධ්‍යක්‍ෂවරයා පදවියේ පිහිටුවීම බැංකුවේ වාර්ෂික වාර්තාව තුළ හෙළිදරව් කළ යුතුය. | අනුකූලතාව දක්වා ඇත |
| 3(5)(iii). සභාපතිගේ සහ ප්‍රධාන විධායක නිලධාරීගේ අනන්‍යතාව සහ සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී අතර හෝ අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකයන් අතර හෝ කවර හෝ සම්බන්ධතාවක් (මූල්‍ය, ව්‍යාපාරික, පවුල් හෝ වෙනත් ඕනෑම) වේ නම් ඒ බව වාර්ෂික වාර්තාවෙහි කොටසක් වන ආයතනික පාලන වාර්තාවෙහි අනාවරණය කිරීමට අධ්‍යක්‍ෂ මණ්ඩලය වගබලා ගත යුතුය. | අනුකූලතාව දක්වා ඇත |

# අවදානම් කළමනාකරණය

''අවදානම් යනු නරක දෙයක් නොව ඕනෑම සංවිධානයක ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය සාධකයකි. අවදානම්වලට මුහුණ දීමේදී සිදු වන ඇතැම් අසමත්වීම් හා දුර්වලතා බොහෝ විට වැදගත් පාඩම් ඉගෙනීමට මග පාදයි. කෙසේ වෙතත්, අවදානම් හා බැඳී තිබෙන ධනාත්මක අවස්ථාවලින් අත්විය හැකි ප්‍රතිලාභවලට සාපේක්ෂව ඒවායෙහි ඍණාත්මක බලපෑම් පාලනය කර ගැනීමට අප උගත යුතුය.''

(Van Scoy, 1992)

## ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන්

හඳුනාගැනීම → විශ්ලේෂණය → ඇගයීම → ක්‍රියාමාර්ග ගැනීම → අධීක්ෂණය

දැනට භාවිතයේ පවතින මෙහෙයුම් පරිසරය සඳහා වඩා ඒකාබද්ධ හා දියුණු අවදානම් කළමනාකරණ ප්‍රවේශයක අවශ්‍යතාව ඇති අතර තනි සිදුවීම් හෝ කාර්යයන් මට්ටමේදී අවදානම් කළමනාකරණය කර ගැනීම සඳහා විය තවදුරටත් ප්‍රමාණවත් වන්නේ නැත.

බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය හුදෙක් අවදානම් අවම කර ගැනීම වෙත පමණක් අවධානය යොමු නොකරන අතර පිළිගත හැකි ප්‍රතිඵල, පිරිවැය වියදම් සහ අවදානම් කෙරෙහි සැලකිල්ල යොමු කරමින් හොඳම ඵල නෙළාගත හැකි පරිදි නවෝත්පාදනාත්මක විධිවිධාන භාවිතයට ගැනීමටද එමගින් සහායක් ලැබේ.

**අවදානම් හඳුනාගැනීමේදී අවධානය යොමු කරන ප්‍රධාන ප්‍රශ්න කිහිපයක් මෙසේය:**

- අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීමේදී අවදානම් මතු විය හැක්කේ කුමන අවස්ථාවේදීද? කොහිදීද? ඇයි? සහ කෙසේද?
- අපගේ ඒ ඒ ප්‍රමුඛතාව ළඟාකර ගැනීමේදී මතු විය හැකි අවදානම් කවරේද?
- එකී ප්‍රමුඛතා ළඟාකර නොගතහොත් මුහුණ දීමට සිදු විය හැකි අවදානම් කවරේද?
- මෙම ක්‍රියාවලියට දායක වන්නේ කවුද? (උදා:- සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන්, හවුල්කරුවන්)

**පහත විධික්‍රමයන්ද අවදානම් හඳුනා ගැනීමේදී අපට වැදගත් වෙයි:**

- අවදානම් මතු විය හැකි ප්‍රභවයන්ට උදාහරණ
- මතු විය හැකි ව්‍යාපාරික හා වංචා විෂයික අවදානම් ලැයිස්තුවක්
- ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී මතු විය හැකි සුලභ අවදානම්
- අවදානම් තක්සේරු කිරීමේ උපකරණයක් ලෙස ආදර්ශ සිද්ධි සැලසුම්කරණය
- ක්‍රියාවලි සම්බන්ධ කිරීම
- ලේඛන පවත්වා ගැනීම, අදාළ විගණන වාර්තා, වැඩසටහන් ඇගයීම් වාර්තා සහ/හෝ පර්යේෂණ වාර්තා.

**කිසියම් අවදානමකින් එල්ල විය හැකි බලපෑම හඳුනා ගැනීම සඳහා මෙම අවධියේදී අවධානය යොමු කරනු ලබන ප්‍රධාන ප්‍රශ්න පහත දැක්වේ:**

- මෙම සුවිශේෂී සිදුවීම අවදානමක් ලෙස සැලකිය යුත්තේ ඇයි?
- මෙම අවදානම මතු වුවහොත් කුමක් වනු ඇතිද?
- බැංකුවේ අරමුණු හා අභිලාෂ ළඟාකර ගැනීම වෙත එමගින් එල්ල වන බලපෑම කෙබඳුද?

කිසියම් පද්ධතියක් හෝ ක්‍රියාවලියකට සම්බන්ධ අවදානම් හඳුනාගැනීමේදී අභව්‍ය සිදුවීම් රැසක් ඉස්මතු විය හැකි අතර ඒ සියල්ලම ගුණාත්මක විශ්ලේෂණයකට ලක් කිරීම සෑම විටම පහසු කටයුත්තක් නොවේ.

## අවදානම් විශ්ලේෂණය කිරීම

අවදානම් විශ්ලේෂණය කිරීම සඳහා අවදානම් ප්‍රභවය සලකා බලා එය පාලනය නොකළහොත් ඇති විය හැකි ප්‍රතිඵල වෙත අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. අවදානම් පාලන විධි, එවායෙහි සාර්ථකත්වය තක්සේරු කිරීම සහ එකී පාලන විධි විධාන පවත්වාගන්නා අතරතුර මතු විය හැකි අවදානම් මට්ටම් යනාදිය හඳුනා ගැනීමද සිදු වේ. අවදානම් වර්ගයේ ස්වභාවය. අවදානම් විශ්ලේෂණය කිරීමේ අරමුණු සහ ලබාගත හැකි දත්ත හා තොරතුරු වැනි සාධක මත පිහිටා ගුණාත්මක, අර්ධ-ගුණාත්මක සහ ප්‍රමාණාත්මක විශ්ලේෂණ ක්‍රම යොදා ගැනේ.

## අවදානම් ඇගයීම

අවදානම් විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව කල් තබා ලේඛනගත කොට අනුමත කර ගන්නා ලද දරාගත හැකි අවදානම් සීමාවන්ට අදාළ නිර්ණායක සමග ඒවා සන්සන්දනය කළ හැක. සාමාන්‍යයෙන් මෙම දරාගත හැකි අවදානම් ආකෘතිය තුළ සටහන් කරනු ලැබේ. යම් හෙයකින් සුරැකුම් කරන ලද අවදානම, දරාගත හැකි අවදානම් මට්ටමට වඩා ඉහළ නම් සුවිශේෂී අවදානම්වලට අදාළව පවතන පාලන ක්‍රමවේදයන්ට අමතර පාලන විධිවිධාන හෝ වැඩිදියුණුකිරීම් සිදු කරන්නට සිදු වෙයි.

## අවදානම් සඳහා ක්‍රියාමාර්ග ගැනීම

බැංකුවට භාරගත නොහැකි අවදානම් සඳහා නිසි තක්සේරුවක් සිදු කල යුතු වෙයි. මෙම අවධියේ අරමුණ වන්නේ අවදානම් තක්සේරු කිරීම සඳහා වැය කරන පිරිවැයට සරිලන විකල්ප සකස් කර ගැනීමයි.

**මෙහි අපේක්ෂිත ප්‍රතිඵල පහත දැක්වේ:**

- අවදානම මගහැරවීම
- අවදානම අඩු කිරීම
- අවදානම මාරු කර යැවීම
- අවදානම භාර ගෙන භාරගත් මට්ටමට අනුව රඳවා තබා ගැනීම

අවදානම මග හැරවීම - අවදානම් උද්ගත වන ක්‍රියාකාරකම් භාර නොගෙන සීටීම.
අවදානම අඩු කිරීම - අවදානමක් සිදුවීමට ඇති හැකියාව පාලනය කිරීම හෝ අවදානමක් සිදු වුවහොත් ඉන් වන බලපෑම අවම කිරීම.

## අවදානම් නිරීක්ෂණය කිරීම

අවදානම් යන සංකල්පය වනාහි වෙනස්වන සුළු සහ කලින් කල විධිමත් සමාලෝචන සිදු කළ යුතු දෙයක් බව වටහා ගැනීම වැදගත් බව අපි වටහාගෙන සිටිමු. හඳුනාගනු ලැබෙන අවදානම් උද්ගත වීම නිරන්තර නිරීක්ෂණයට ලක් කළ යුතු පැතිකඩකි. මෙහිදී නව අවදානම් සහ ආයතනය කෙරෙහි ඒවායින් ඇති විය හැකි බලපෑමද සලකා බැලීම අවශ්‍ය වෙයි. අවදානම් තක්සේරුකරණයෙහි ප්‍රතිඵල මිනුම්ගත කෙරෙන්නේ කෙසේද යන්න කෙරෙහිද මේ පියවරේදී සලකා බැලීම අවශ්‍ය වෙයි. මේ අතරම, සාර්ථක ලෙස බැංකුවේ අභිලාෂ සාධනය කර ගැනීමට අදාළ ප්‍රධාන සන්ධිස්ථාන, අවදානම්සහගත අවස්ථා මෙන්ම අසාර්ථක වීමට ඇති ඉඩකඩද හඳුනා ගත යුතු වෙයි.

මෙම සමාලෝචනයට ලක් වන කාලසීමාව නිර්ණය වනු ලබන්නේ බැංකුවේ මෙහෙයුම් පරිසරය ඇසුරිනි. මෙමගින්, ආයතනික ව්‍යුහය, ශක්‍යතා සහ ආරක්ෂණ කළමනාකරණ පද්ධතියේ සාර්ථකත්වය යනාදි පැතිද ආවරණය වෙයි. සාර්ථක අවදානම් කළමනාකරණ පද්ධතියක් පවත්වා ගැනීමට නම් අවදානම් අන්තර්ක්‍රියාකාරීත්වය සලකා බැලීමද අවශ්‍ය වෙයි.

## සන්නිවේදනය සහ වාර්තා කිරීම

සාර්ථක අවදානම් කළමනාකරණ ක්‍රියාවලියක් පවත්වා ගැනීම සඳහා පැහැදිලි සන්නිවේදනයක්, එනම්, එහි අරමුණු, අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සහ එහි සංඝටක, ප්‍රතිඵල සහ අවසානයේදී ගත යුතු ක්‍රියාමාර්ග ආදිය පැහැදිලිව ලෙස සන්නිවේදනය කිරීම, අත්‍යවශ්‍ය වෙයි.

අවදානම් කළමනාකරණය අප බැංකුවේ කළමනාකරණ ක්‍රියාවලියෙහි ඇතුළත් සුවිශේෂී අංගයකි. කෙසේ වෙතත්, එහි සාර්ථකත්වය සඳහා අවදානම් කළමනාකරණයට අදාළ මනා වාර්තාකිරීමේ ක්‍රියාවලියක් පවත්වා ගැනීම වැදගත් වේ. මීට අදාළ අවශ්‍යතා විධිමත් ලෙස ලේඛගත කරනු ලැබෙන ක්‍රමවේදයක් යටතේ ස්ථාපිත කර ගැනීමද අවශ්‍ය බව හඳුනාගෙන ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩලයට අනුබද්ධිත අවදානම් කළමනාකරණ කමිටුව

ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ වර්ධනය සහ අවදානම් අතර මනා සමතුලිතභාවයක් පවත්වා ගැනීමට අවශ්‍ය මනා අවාදානම් සංස්කෘතියක් ස්ථාපිත කිරීම සහ එය ඇගයීමට ලක් කිරීම සඳහා අවශ්‍ය වන සක්‍රිය සහ ඉදිරිගාමී අවදානම් කළමනාකරණ දර්ශනයක් පවතින අතර එය බැංකුව පුරාවටම නිසි ලෙස සන්නිවේදනය කිරීම සිදු කෙරේ. සුදුසු උපායමාර්ගික කළමනාකරණ රාමුවක් තුළ සාර්ථක ලෙස සම්පත් වෙන් කිරීමක් සිදු වන බව සහතික කිරීම සඳහා බංකුවේ දැක්ම, මෙහෙවර, ප්‍රතිපත්ති සහ ව්‍යාපාරික ඉලක්ක යනාදියට අනුකූල වන පරිදි අවදානම් කළමනාකරණ දර්ශනය සකස් කර තිබේ. මෙහි ප්‍රතිඵල, උපකල්පිත අවදානම්ව සමග සංගත වන බව සහ නිර්වචනය කර ඇති අවදානම් දරා සිටීමේ සීමාව ඇතුලත ඒවා කළමනාකරණය කරනු ලැබෙන බව අපගේ අභ්‍යන්තර ක්‍රියාවලීන් මගින් සහතික කරනු ලැබේ.

ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට අනුබද්ධිත අවදානම් කළමනාකරණ කමිටුව 2007 අංක 12 දරන බැංකු පනතෙහි දැක්වෙන 'ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකු සඳහා වන ආයතනික යහපාලන විධිවිධාන' යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත කොට ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයට අයත් කාර්යාත්මක කමිටුවක් ලෙස ක්‍රියාත්මක වන එයට බැංකුවේ අවදානම් කාර්යයන් කළමනාකරණය සහ අධීක්ෂණය කිරීම හා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කොට ඇති ආයතනික යහපාලනය විෂයික අනිවාර්ය විධික්‍රමයන්හි අවශ්‍යතා පරිදි අදාළ රෙගුලාසිවලට අනුකූලතාව දක්වන්නේද යන්න සහතික කිරීම ඇතුළු සියලුම අවදානම් කළමනාකරණ වගකීම් පවරා ඇත.

## කමිටුවේ සාමාජිකයන්

2015 වර්ෂය තුළ කමිටුවේ සමාජිකයන් ලෙස කටයුතු කළ අධ්‍යක්ෂවරුන් පහත දැක්වේ:

- එස්. ඒ. සී. කුලතිලක මිය
- සෑම් සමරසිංහ මහතා
- සුනිල් විතාරණ මහතා

බැංකුවේ සභාපති සහ ක්‍රියාකාරී අධ්‍යක්ෂ යන නිලධාරීන් කමිටු සාමාජිකත්වයේ ආරාධනය පිට එහි රැස්වීම් සඳහා සහභාගී වෙති. මීට අමතරව සාමාන්‍යාධිකාරී, අනුකූලතා නිලධාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාර - නීති යන නිලධාරීන්ද සාමාජිකයන් වශයෙන් සහභාගී වෙති. කමිටුවේ ලේකම් වශයෙන් කටයුතු කරන්නේ ජ්‍යෙෂ්ඨ කළමනාකාර - අවදානම් ය.

පාලන ව්‍යුහය හා අවදානම් කළමනාකරණය පාලනය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති අතර අවශ්‍ය අවස්ථාවලදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියද සහිතව සුදුසු ප්‍රතිපත්ති සහ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කරනු ලැබේ.

බැංකුව විසින් හඳුනාගනු ලැබෙන අවදානම් හඳුනා ගැනීම සහ එම අවදානම් නිසි ලෙස කළමනාකරණය කර තිබේද යන්න සහතික කිරීමද අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. මීට අමතරව බැංකුව විසින් තම දරාගත හැකි අවදානම් සීමාව පදනම් කරගෙන අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණයට යටත්ව ආයතනික හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ වගකීමක් වශයෙන් සවිමත් කළමනාකරණයක් ස්ථාපිත කොට තිබේද යන්න තහවුරු කිරීමද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කරනු ලබයි. අවදානම් කළමනාකරණයට අදාළ අභ්‍යන්තර ප්‍රතිපත්තිවලට අනුකූලතාව දක්වා තිබේද යන්න නිරීක්ෂණය කිරීම හා සියලුම ප්‍රතිපත්ති හා ක්‍රමවේදයන් නිසි ලෙස සන්නිවේදනය කර තිබේද යන්න පරීක්ෂා කිරීම සඳහා විධිවිධාන ස්ථාපිත කොට තිබේ.

## අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව

බැංකුවේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව සම්පූර්ණයෙන්ම එහි ව්‍යාපාරික කාර්යයන්ගෙන් ස්වාධීනව කටයුතු කරයි. මේ අනුව, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තු ප්‍රධානී සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලයට අනුබද්ධිත අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කරයි.

## රැස්වීම්

මෙම සමාලෝචනයට ලක් වන මූල්‍ය වර්ෂය තුළ සාමාන්‍ය විෂය පථය සාකච්ඡා කිරීම සඳහා කමිටුව කාර්තුවකට වරක් බැගින් රැස්වීම් හතරක් පවත්වන ලදි. මීට අමතරව ණය, වෙළඳපොල, ද්‍රවශීලතා, මෙහෙයුම් යනාදී බැංකුවේ මූලික අවදානම් සහ මූලික අවදානම් දර්ශකයන් සෑම ශාඛාවකම මාසිකව කමිටු විසින් ඇගයීම කරනු ලැබේ. මෙම රැස්වීම්වලදී සිදු වූ සාකච්ඡා සහ ළඟා කර ගත් සාරාංශ සියල්ල රැස්වීම් වාර්තාවල සඳහන් කොට අධ්‍යක්ෂ මණ්ඩලයේ දැන ගැනීම සහ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අධ්‍යක්ෂවරුන් අතර බෙදා හරිනු ලැබේ. අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් මෙම රැස්වීම් සඳහා සහභාගී වේ.

# අවදානම් පාලන කමිටු




අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව, අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සකස් කිරීම සහ කාලික සමාලෝචන සිදු කිරීම සම්බන්ධයෙන් වගකීම දරයි.

## ණය අවදානම් කළමනාකරණය

සමස්ථ අවදානම් කළමනාකරණ රාමුවට ඒකාබද්ධ කරන ලද ණය අවදානම් කළමනාකරණ පද්ධතියක් පවත්වා ගැනීම බැංකුවට අත්‍යවශ්‍ය වේ. ණය අවදානම් කළමනාකරණයෙහි අරමුණ වන්නේ පිළිගත හැකි පරාමිතික යටතේ ණය අවදානමට නිරාවරණය වීමේ හැකියාව නිසි ලෙස පවත්වා ගැනීම මගින් ණයවලින් ලැබෙන ප්‍රතිලාභ ආදායම උපරිමය දක්වා වැඩි කිරීමට කටයුතු කිරීමයි. මේ සඳහා, ණය අවදානම නිසි ලෙස හඳුනා ගැනීම, මිනුම්ගත කිරීම, නිරීක්ෂණය හා පාලනය කිරීම පිළිබඳ සූක්ෂ්ම අවබෝධයක් සහ ප්‍රමාණවත් ප්‍රාග්ධන මට්ටමක් පවත්වා ගැනීම අවශ්‍ය වේ.

සාර්ථක ණය අවදානම් කළමනාකරණයක් වෙනුවෙන් බැංකුවේ ණය අවදානම් කළමනාකරණ පද්ධතිය තුළ පහත විධිවිධාන පවතී:

i. ණය ප්‍රතිපත්තිය සහ ක්‍රමෝපායයන්

ii. ණය ක්‍රියාවලිය

iii. සංවිධාන ව්‍යුහය

iv. පුද්ගල සම්පත

v. ණය සංස්කෘතිය

### i. ණය ප්‍රතිපත්තිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ණය ප්‍රතිපත්තියක් බැංකුව සතුව පවතින අතර ණය අවදානම කළමනාකරණය කර ගැනීමේ පදනම වන්නේ එයයි. එහි මූලික අරමුන වන්නේ බැංකුව පුරාවටම එකම ණය ක්‍රියාවලියක් පවත්වා ගැනීමයි. බැංකුවේ සේවා හා නිපැයුම්, ව්‍යාපාරික අංශ, භූගෝලීය හා සංවිධානමය බෙදී යාම් හරහා බැංකුව පුරාවටම සංගත ණය අවදානම් කළමනාකරණයක් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය පදනම ණය ප්‍රතිපත්තිය මගින් සැපයෙන අතර ණය අවදානමට අදාළව කටයුතු කරන සෑම මට්ටමකම සේවකයන් සියලුම දෙනා හට එය එක සේ අදාළ වෙයි. මේ අතරම, ණය ලබා දීමේ ව්‍යාපාරික කටයුතුවලදී අනුගමනය කළ යුතු සුදුසු ක්‍රියාමාර්ග නිර්වචනය කරන එය බැංකුවේ ව්‍යාපාරික උපායමාර්ග වෙත සහාය දැක්වීමද අවශ්‍ය වේ.

### ii. ණය උපායමාර්ගය

බැංකුව විසින් තම ණය ලබා දීමේ කටයුතු සඳහා මාර්ගෝපදේශන සපයන ණය අවදානම් උපායමාර්ගයක් ස්ථාපිත කොට ඇති අතර ඊට අදාළ ප්‍රතිපත්ති/ක්‍රමවේදයන්ද අනුමත කරගෙන තිබේ.

## iii. සංවිධාන ව්‍යුහය

ණය අවදානම් කළමනාකරණ පද්ධතියක් සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා මනා සංවිධාන ව්‍යුහයක පැවැත්මඅවශ්‍ය වෙයි. බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී ගණුදෙනු කරු සමග සාකච්ඡා කර ඔහුට ණය ලබා දෙන බවට තහවුරු කර ණය දෙපාර්තමේන්තුවට ණය ලබා දීමට ක්‍රියා කරන ලෙස උපදෙස් දෙන පරිචයක් දැන් වෙනස් වී ඇත. සාර්ථක පද්ධතියක් තුළ අවදානම් කළමනාකරණ කාර්යභාරය ව්‍යාපාරික කටයුතුවලින් ස්වාධීනව සිදු කළ යුතු අතර ණය අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සහ ව්‍යාපාරික කටයුතු මෙහෙයවන අංශ අතර ඝට්ටනයක් ඇති නොවිය යුතුය.

බැංකුව සතුව අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ උප කමිටුවක් වන අවදානම් කළමනාකරණ කමිටුවක් ඇති අතර එය ප්‍ර. වි. නි. සහ ණය, වෙළඳපොළ සහ මෙහෙයුම් අවදානම් අංශ ප්‍රධානීන්ගෙන් සමන්විත වෙයි. ණය අවදානමට මුහුණ දීමේදී බැංකුවට මුහුණ දීමට සිදු වන විවිධ අවදානම් වර්ග ආවරණය වන ඒකාබද්ධ අවදානම් කළමනාකරණයක් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා උපායමාර්ග සකස් කිරීම හා නිරීක්ෂණය කිරීම එහි වගකීම වෙයි. මේ සඳහා ණය අවදානම් කමිටුව සාර්ථක ලෙස ණය කමිටුව, වත්කම් හා වගකීම් කමිටුව හා අනෙකුත් අදාළ කමිටු සමග මනා සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම අවශ්‍ය වේ.

## ණය ක්‍රියාවලිය

බැංකුවේ ණය ක්‍රියාවලියට පහත පියවර ඇතුළත් වෙයි:

**ගනුදෙනු කළමනාකරණය** - අවදානම් තක්සේරුකරණය, පහසුකම් සම්පාදනය, අවදානම් ශ්‍රේණිගත කිරීමට අභ්‍යන්තර අනුමැතිය ලබා දීම. මෙම කාර්යයන් ඉටු කරනු ලබන්නේ බැංකුවේ ව්‍යාපාරික අංශ විසිනි.

**ණය පරිපාලනය** - මෙය අවදානම් කළමනාකරණ ඒකකය සතු කාර්යභාරයක් වන අතර මීට අදාළ වගකීම් වනුයේ අනුමත කරන ලද ණය පහසුකම් ක්‍රියාත්මක කිරීම, සුරැකුම් ලේඛනගත කිරීම නිරීක්ෂණය කිරීම, ණය සම්මුතීන් නිරීක්ෂනය කිරීම, රක්ෂණවලට අදාළ කටයුතු සිදු කිරීම, කොටස් වෙළඳපොල ප්‍රකාශන සහ අනෙකුත් අදාළ කාර්යයන් වේ.

**කළඹ කළමනාකරණය** - කළඹ කළමනාකරණයට පහත පියවර ඇතුළත් වේ:

1. ණය වෙත නිරාවරණය වීමේ ස්වභාවය සීමා කිරීම/අඩු කිරීම - පාරිභෝගික, නිපැයුම් හා සේවා, ආර්ථික, කර්මාන්ත හා භූගෝලීය අංශ මත සීමා පිහිටුවීම

2. වත්කම් වර්ගීකරණය

   බැංකුව විසින් තම ගනුදෙනුකාරයෙකු සමග ව්‍යාපාරික සබඳතා ආරම්භ කරන මුල් අවස්ථාවේදී යොදා ගනු ලබන අවදානම් ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදයට අනුව සෑම ගනුදෙනුකාරයෙකුටම අදාළව අවදානම් ශ්‍රේණිගත කිරීමට අමතරව, ණයකරුගේ නැවත පියවීමේ තත්ත්වය කවර ආකාරයකින් හෝ පිරිහීමකට ලක්ව තිබේද යන්න කාලීන පදනමක් මත හඳුනා ගැනීම අවශ්‍ය වේ. කළමනාකරණය ආශ්‍රිත වෙනස්වීම්, මුදල් ගලන සීමා හෝ අනතුරුදායක සංඥා ලෙස සැලකිය යුතු බාහිර සාධක නිසා එම අවශ්‍යතාව උද්ගත වේ. මෙම අවධියේදී හිඟ මුදල් කිසිවක් හඳුනාගෙන නොමැත්තේ වුවද එවැනි ගැටළුකාරී තත්ත්ව පිළිබඳ සංඥා හඳුනා ගැනෙන ගනුදෙනුකාරයින් 'නිරීක්ෂණ ලැයිස්තුව' ඇතුළත් කොට සැලකිය යුතු වේ.

3. අලාභ සඳහා වන විධිවිධාන - අක්‍රිය වත්කම් වර්ගීකරණයට අදාළ අවම අවශ්‍යතා සහ සුවිශේෂී අලාභවලට අදාළ විධිවිධාන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කොට ඇත.

බැංකුවෙ ණය කළඹ කළමනාකරණය කර ගැනීමේ ක්‍රියාවලිය සඳහා පහත විධිවිධාන අනුගමනය කරන ලදි:

- ගනුදෙනුවලට බැඳී සිටින සියලුම ගනුදෙනුකාරයින් වාර්ෂිකව සමාලෝචනයට ලක් කිරීම හා නව ගනුදෙනුකාරයින් පිළිබඳ අර්ධ වාර්ෂික සමාලෝචන සිදු කිරීම
- කලින් කල ගනුදෙනුකරුවන් ඇමතීම, ඔවුන්ගේ පරිශ්‍ර වෙත ගමන් කිරීම
- දුර්වල ගනුදෙනුකාරයින් (නිරීක්ෂණ ලැයිස්තුවට ඇතුළත් කරන ලද) පිළිබඳව කාර්තුවකට සැරයක්වත් සමාලෝචන සිදු කිරීම
- බරපතල ලෙස බලපෑ හැකි කර්මාන්ත/දේශපාලනික/ආර්ථික දර්ශක පෙන්නුම් කරන කල්හි ක්ෂණික කළඹ සමාලෝචන සිදු කිරීම
- සමස්ථ ව්‍යාපාරික කළඹටම අදාළව කාලික සමාලෝචන සිදු කිරීම
- බැංකුවේ සියලුම ණයකරුවන්ට අදාළව අවදානම් ශ්‍රේණිගත කිරීමක් පවතින බව සහතික කිරීම

## ණය කමිටුව

ප්‍රධාන විධායක නිලධාරී, ණය දෙපාර්තමේන්තු ප්‍රධානී, ණය අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තු ප්‍රධානී සහ අනෙකුත් අදාළ අංශ ප්‍රධානීන්ගෙන් සමන්විත ණය කමිටුවක් අප බැංකුව සතු වේ. අනුමත කිරීමේ බලතල හෝ උපදේශන මට්ටමේ කාර්යයන් පමණක් හෝ සහිතව ඊට පැවරෙන කාර්යභාරයන් කිහිපයක් පහත දැක්වේ:

අධ්‍යක්ෂ මණ්ඩලය/අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව විසින් අනුමත කරන ලද ණය ප්‍රතිපත්තිය/ක්‍රමෝපායයන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකීම් දැරීම.

ණය යෝජනාවලින් ඉදිරිපත් කිරීමට අදාළ ප්‍රමිතීන්, මූල්‍ය සම්මුතීන් සහ අනෙකුත් අදාළ ප්‍රමිතීන් අනුමත කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

ණය අධිකාරත්වය, විශාල වටිනාකමකින් යුතු ණය මත සීමා පැනවීම, විවිධ අංශ වෙත නිරාවරණය වීම, ණය සමාලෝචන යාන්ත්‍රණය, අවදානම් නිරීක්ෂණය, ඇගයීම, ණය සඳහා මිල නියම කිරීම, ණය ලබා දීම ආදී වගකීම් පැවරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ නිකුත් කිරීම.

තම විෂය පරාසය යටතේ පවතින ණය සඳහා අනුමැතිය ලබා දීම.

## අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව

මෙම දෙපාර්තමේන්තුව පහත කාර්යභාරයන් සඳහා වගකීම දරයි:

- අධ්‍යක්ෂ මණ්ඩලය/ණය කමිටුව විසින් නියම කරන ලද පරාමිතික/සීමා ඇතුළත සමස්ථ බැංකුවටම අදාළ පරිදි ණය අවදානම පාලනය කිරීම හා නිරීක්ෂණය කිරීම.
- අවදානම් තක්සේරු කිරීමේ පද්ධති ස්ථාපිත කිරීම, ණය/ආයෝජන කළඹෙහි ගුණාත්මකභාවය නිරීක්ෂණය කිරීම, ගැටළුසහගත ණය හඳුනා ගැනීම, අවදානම් ශ්‍රේණිගත කිරීමේ පද්ධති භාවිත කිරීම නිරීක්ෂණය කිරීම සහ ණය සමාලෝචනය සිදු කිරීම.
- ණය කළඹ කෙරෙහි බලපෑමක් ඇති කරනු ඇති බාහිර සාධක නිරීක්ෂණය හා තක්සේරු කිරීම, එකී අවදානම් අවම කිරීම සඳහා විධිවිධාන අනුගමනය කිරීම සහ එළැඹිය හැකි අවදානම් පිළිබඳව ණය කමිටුව/අධ්‍යක්ෂ මණ්ඩලය දැනුම්වත් කිරීම.
- කලින් කල සිදු කරනු ලබන කළඹ සමාලෝචන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීම.

## ණය ශ්‍රේණිගත කිරීමේ වැදගත්කම

නව බාසල් II සම්මුතීන් විවිධ අවදානම් කාණ්ඩවලට බර තබන ලද අවදානම් සලකා බලන හෙයින් ණය අවදානම් කළමනාකරණ පද්ධතියක් තුළ අවදානම් ශ්‍රේණිගත කිරීමේ රාමුව කෙරෙහි වැදගත් තැනක් හිමි වේ. මේ අනුව, බාසල් II සම්මතයන් පහත දැක්වෙන පරිදි මට්ටම් තුනක ශ්‍රේණිගත කිරීමේ පද්ධති නිර්දේශ කරයි:

## ක්‍රමවේද ශ්‍රේණිගත කිරීමේ විධික්‍රමය

අභ්‍යන්තර අවදානම් ඇගයීමේ ආකෘතිය




## පීඩන පරීක්ෂාව

බැංකුව විසින් පීඩන පරීක්ෂාවන් සිදු කොට එමගින් බැංකුවේ ණය, වෙළඳපොල හා ද්‍රවශීලතා නිරාවරණය වීම් කෙරෙහි එල්ල වන බලපෑම මිනුම්ගත කරනු ලැබේ. මෙම පරීක්ෂාවන් කාර්තුවකට වරක්වක් සිදු කරනු ලබන අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කර ඇති විධිවිධාන ඇතුළත් එකී පරීක්ෂාවන්හි ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩලයට අනුබද්ධිත අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කෙරේ.

**පහත කාරණාවලට අදාළව පීඩන පරීක්ෂාවන් සිදු කරනු ලැබේ:**

I. සමස්ථ ණය කළඹෙහි අවාසිදායක ප්‍රවණතා

II. ණය නැවත නොගෙවීමේ අනුපාතිකය ගණනය කිරීම

- HH I – **නාම සංකේන්ද්‍රණය**
  - < 0.1 = අඩු අවදානම්
  - 0.1-0.15 = මධ්‍යම පරිමාණයේ අවදානම්
  - > 0.15 = ඉහළ අවදානම්

2015. 12. 31 දිනට ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ ක්ෂුද්‍ර මූල්‍ය ඒකකයද සහිතව සංකේන්ද්‍රණ අවදානම ගණනය කිරීම

**බැංකුවේ** HHI **දර්ශක අගය** = 32% (0.32)

2015. 12. 31 දිනට ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ ක්ෂුද්‍ර මූල්‍ය ඒකකයද රහිතව සංකේන්ද්‍රණ අවදානම ගණනය කිරීම

**බැංකුවේ** HHI **දර්ශක අගය** = 22% (0.22)

## වෙළඳපොල අවදානම

වෙළඳපොල අවදානම යන්නෙන් අදහස් වන්නේ පොලී අනුපාත සහ කොටස් මිල ගණන් වල වෙනස්වීම් හේතුවෙන් බැංකුවේ ආදායම සහ/හෝ වෙනත් ඕනෑම මූල්‍ය උපකරණයක් කෙරෙහි හානිකර බලපෑම් එල්ල වීමට ඇති ඉඩකඩ වේ.

## කොටස් කළඹ කළමනාකරණය කර ගැනීම

හිමිකරු ප්‍රාග්ධන මිලෙහි සැලකිය යුතු වෙනස්වීම් හේතුවෙන් හිමිකරු ප්‍රාග්ධන මිල ආශ්‍රිත අවදානම් උද්ගත වේ. බැංකුව සතු හිමිකරු ප්‍රාග්ධන කළඹ මහා භාණ්ඩාගාරය විසින් කළමනාකරණය කරනු ලැබෙන අතර අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් එය දිනපතා වෙළඳපොල වාර්තාවෙහි අන්තර්ගත කරනු ලැබෙයි.

| ආයෝජන සමාගමෙහි නම | මුලු පිරිවැය (රු) | වෙළඳපොළ වටිනාකම | වෙළඳපොල මිලට අගය අඩු කිරීමෙන් ලාභ/(පාඩු) | කොටස් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජාතික සංවර්ධන බැංකුව | 970,956.00 | 2,678,580.00 | 1,707,624 | 13800 |
| කොමර්ෂල් බැංකුව | 7,135.00 | 24,969.00 | 17,834 | 203 |
| ලංකා ඔරික්ස් ලීසිං සමාගම | 855 | 18,800.00 | 17,945 | 200 |
| සම්පත් බැංකුව | 83,221.00 | 738,296.00 | 655,075 | 2977 |
| වටවල ප්ලාන්ටේෂන්ස් පී එල් සී | 20,288.00 | 97,200.00 | 76,912 | 4000 |
| ලංකා සෙරමික්ස් | 128,334.00 | 600,000.00 | 471,666 | 5000 |
| සිනමන් ලේක්සයිඩ් | 34,983.00 | 377,600.00 | 342,617 | 4000 |
| කැලණිවැලි ප්ලාන්ටේෂන් පී එල් සී | 198,221.00 | 385,000.00 | 186,879 | 5500 |
| හපුගස්තැන්න ප්ලාන්ටේෂන් පී එල් සී | 2,666.00 | 2,270.00 | -396 | 100 |
| අයිට්කන් ස්පෙන්ස් හොටෙල්ස් | 160,364.00 | 1,740,600.00 | 1,580,236 | 18000 |
| පී ඒ බී සී බැංකුව | 47,952,793.00 | 186,059,548.60 | 138,106,756 | 6,865,666 |
| මුලු එකතුව | 49,559,716.00 | 192,722,863.60 | 143,163,148 | |

වෙළඳපොල අවදානම් කළමනාකරණය කර ගැනීම වෙනුවෙන් වත්කම් හා වගකීම් කමිටුවෙහි නිර්දේශ මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරයට හා ආයෝජනවලට සම්බන්ධ නොයෙකුත් ක්‍රියාකාරකම්වලට අදාළ සීමා පනවනු ලබයි. ඉන් අනතුරුව වත්කම් හා වගකීම් කමිටුව ඒවා සමීපව නිරීක්ෂණය කිරීම හා වාර්තා කිරීම සිදු කරනු ලබන අතර අර්ධ මාසිකව සංකච්ඡාවට බඳුන් කරනු ලබයි. වෙළඳපොල අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සකස් කිරීම වත්කම් හා වගකීම් කමිටුවෙහි වගකීමක් වන අතර එකී ප්‍රතිපත්ති සැලකිල්ලට ගනිමින් දෛනිකව බැංකුවට මුහුන දීමට සිදු වන අවදානම් නිරාවරණය වීම් නිරීක්ෂණය කිරීම මහා භාණ්ඩාගාරය විසින් සිදු කෙරේ. කෙසේ වෙතත්, අඛණ්ඩව වෙළඳපොල අවදානම් කළමනාකරණය කිරීම මහා භාණ්ඩාගාරයේ වගකීමකි.

## පොලී අනුපාත අවදානම

පොලී අනුපාත අවදානම යනු බැංකුවේ ශුද්ධ පොලී ආදායම සහ වෙනත් ඕනෑම මූල්‍ය උපකරණයක වටිනාකම කෙරෙහි අහිතකර බලපෑම් එල්ල කිරීමට ඉඩ ඇති පරිදි වෙළඳපොල පොලී අනුපාතික මට්ටම් ආශ්‍රිතව සිදු විය හැකි වෙනස්කම් වේ. පොලී අනුපාතික පරතරය මත සීමා පැනවීම සහ පොලී ආදායමට සංවේදීතාවක් දක්වන විවිධ වත්කම් හා වගකීම් සඳහා නැවත මිල නියම කිරීම වැනි විධිවිධාන හරහා මෙකී අවදානම කළමනාකරණය කරගත යුතු වේ.

## ශුද්ධ පොලී ආන්තිකය

2015. 12. 31 දිනට = 6.62%

2015. 12. 31 දින වන විට බැංකුව විසින් ඉහළ පොලී ආදායමක් හා අඩු පොලී වියදම් ප්‍රමාණයක් වාර්තා කර ඇත.

**ශාඛාව අනුව තැන්පතු සංකේන්ද්‍රණය - 2015. 12. 31**







වෙළඳපොල අවදානම කළමනාකරණය කර ගැනීමට අදාළ ප්‍රතිපත්ති හා ක්‍රමවේදයන් සම්බන්ධ වගකීම අධ්‍යක්‍ෂ මණ්ඩලයට අනුබද්ධිත අවදානම් කළමනාකරණ කමිටුව වෙත පැවරෙයි. කමිටුව වෙත පවරා ඇති බලතල සීමාවත් ඇතුළත බැංකුව විසින් හඳුනාගෙන ඇති අවදානම් සීමාවන්ට සාපේක්‍ෂව එමගින් අවදානම් වෙත නිරාවරණය වීම් නිරීක්‍ෂණය කරනු ලැබේ.

## ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය

සරල අර්ථයෙන් ගත කල ද්‍රවශීලතා අවදානම යනුවෙන් අදහස් වන්නේ බැංකුවෙහි වත්මන් හා අනාගත ගෙවීම් වගකීම් නිසි කල ගෙවා අවසන් කිරීමට අසමත් වීම නිසා ඉස්මතු විය හැකි අවදානම වේ.

අවදානම් දරා සිටීමේ සීමාව ඇතුළත ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කර ගැනීම හා ප්‍රමාණවත් ද්‍රවශීලතා තත්ත්වයක් බැංකුව සතුව පවතින බව සහතික කරනු පිණිස ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසින් උපායමාර්ගයක්, ප්‍රතිපත්ති හා පරිචයන් සකස් කරනු ලැබේ. මේ සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසින් බැංකුවේ ද්‍රවශීලතා මට්ටමට අදාළ තොරතුරු අඛණ්ඩව සමාලෝචනය කොට නිරන්තරයෙන් අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත වාර්තා කළ යුතු වෙයි. අඩුම තරමින් වාර්ෂිකවවත් බැංකු අධ්‍යක්‍ෂ මණ්ඩලය ද්‍රවශීලතා කළමනාකරණයට අදාළ උපායමාර්ග, ප්‍රතිපත්ති හා පරිචයන් සමාලෝචනය කිරීම හා අනුමත කිරීම සිදු කොට ජ්‍යෙෂ්ඨ කළමානාකාරීත්වය විසින් සාර්ථක ලෙස ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කරනු ලැබෙන බව සහතික කරයි.

**විස්තරාත්මකව ගත් කල ද්‍රවශීලතා අවදානම් කළමනාකරණයට පහත අංග අතුළත් වෙයි:**

- ද්‍රවශීලතා අවදානම තක්සේරු කිරීම
- ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ ආකෘතියක් සකස් කිරීම, සමාලෝචනය කිරීම හා එය යොදා ගැනීම. ගණිතමය හා සංඛ්‍යාන දත්තමය ක්‍රමවේද ලේඛනගත කිරීමද මීට ඇතුළත් වෙයි.
- බැංකුවේ ද්‍රවශීලතා තත්ත්වයට අදාළ දත්ත නිවැරදිව වාර්තා වන්නේද යන්න තහවුරු කිරීම.
- ද්‍රවශීලතාවට අදාළ පීඩන පරීක්ෂාව
- අනුමත සීමාවන්ට අනුකූලතාව දක්වන්නේද යන්න සමාලෝචනය කිරීම හා එකී සීමාවන් ඉක්මවන අවස්ථාවලදී සුදුසු පරිදි අනුමැතිය ලබා දීම.
- ද්‍රවශීලතා කළමනාකරණ ආකෘතිය වෙත නව නිපැයුම් හා සේවා එකතු කිරීම
- දෛනික අවදානම් තත්ත්වය පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය වෙත ලබා දීම
- ද්‍රවශීලතාවට අදාළ ගැටළුකාරී තත්ත්වයන්ට අදාළ හදිසි අවස්ථා සඳහා සැලසුම් සකස් කිරීම හා ක්‍රියාවට නැංවීම.

මනා ලෙස හදිසි අවස්ථා සඳහා සැලසුම් සකස් කිරීමට අමතරව, වත්කම් හා වගකීම් කමිටුව විසින් අඛණ්ඩව ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය පාලනය කරයි. මෙහිදී වත්කම් හා වගකීම් කමිටුව ණය හා තැන්පතු ආශ්‍රිතව අපේක්ෂිත වර්ධනය සාකච්ඡා කිරීම, අපේක්ෂිත ආයෝජන මුදල් ගලනය විමසා බැලීම සහ ඉදිරි අරමුදල් කල්පිරීම් යනාදිය හඳුනා ගැනීම වැනි ක්‍රියාමාර්ග ගත යුතු වෙයි. මෙම සමාලෝචනය නිසි පරිදි ලේඛනගත කළ යුතු අතර ක්‍රමෝපායික සාකච්ඡා සඳහා පදනම වශයෙන් යොදා ගනු ලබන්නේ එකී ලේඛනගත කිරීම් වේ.

**2015. 12. 31 දිනට බැංකුව සතු ආයෝජන කළඹ (රු. මිලියන)**



## මෙහෙයුම් අවදානම් කළමනාකරණය

මෙහෙයුම් අවදානම නිර්වචනය වන්නේ අභ්‍යන්තර ක්‍රියාවලීන්, පුද්ගලයන්, පද්ධති හෝ බාහිර සිදුවීම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් නොවන ලෙස කටයුතු කිරීම හෝ අසමත් වීම මත පාඩු ඇති වීමේ අවදානම වශයෙනි.

මෙහෙයුම් අවදානමක් හඳුනා ගැනීමම එවැනි අවදානමක් ඉස්මතු වීම් මූලයද වේ.

| | |
|---|---|
| **අභ්‍යන්තර වංචා** | අවම වශයෙන් එක් අභ්‍යන්තර පුද්ගලයෙකු හෝ පාර්ශ්වයක සහභාගීත්වය සහිතව සිදු කෙරෙන වංචනික ක්‍රියා, නුසුදුසු වත්කම් හෝ උපායශීලී ලෙස රෙගුලාසි, ආයතනික ප්‍රතිපත්ති, අභ්‍යන්තර විවිධත්වය නොසලකා සිදු කෙරෙන වෙනස් කොට සැලකීම් ආදිය නිසා සිදු වන අලාභ |
| **බාහිර වංචා** | තුන්වැනි පාර්ශ්වයක් විසින් වංචනික අරමුණකින් සිදු කරනු ලබන ක්‍රියා හෝ නීති උපායශීලී ලෙස උල්ලංඝනය කිරීම් ආදිය නිසා සිදු වන අලාභ (සොරකම් කිරීම, හැක් කිරීම් ආදිය). |
| **සේවක පරිචයන් හා සේවාස්ථාන ආරක්ෂාව** | සේවකයන්ගේ සෞඛ්‍යයට හෝ ආරක්ෂණ නීති හෝ ගිවිසුම්වලට අයෝග්‍ය පරිදි සිදු කෙරෙන ක්‍රියා නිසා සිදු වන අලාභ. සේවකයන්ට සිදු වන ශාරීරික හානි සඳහා දීමනා ඉල්ලා සිටීම, සේවකයන් අතර ඇති විවිධත්වය අසාධාරණයට ලක් කරන සුළු ක්‍රියා ආදිය. |
| **ගනුදෙනුකරුවන්, සේවා සහ ව්‍යාපාරික පරිචයන්** | චේතනා විරහිතව හෝ නොසැලකිලිමත් බව නිසා සේවාදායකයින් වෙත ඇති වෘත්තීය වගකීම ඉටුකිරීමට අපොහොසත්වීම (විශ්වාසදායිභාවය හා යෝග්‍යතාවය ඇතුලත්ව) හෝ නිෂ්පාදනයේ ස්භාවය හෝ සැලැස්ම මගින් ඇතිවන හානි ආදිය. |
| **භෞතික වත්කම්වලට සිදු වන හානි** | ස්භාවික විපත් හෝ වෙනත් සිද්ධියක් නිසා ආයතනයේ භෞතික වත්කම්වලට වන හානි ආදිය. |
| **ව්‍යාපාරික හා පද්ධති බිඳවැටීම්** | ව්‍යාපාර හෝ පද්ධති බිඳ වැටීම නිසා ඇති වන හානි ආදිය. |
| **ක්‍රියාත්මක කිරීම, බෙදා හැරීම හා ක්‍රියාවලි කළමනාකරණය** | සම්බන්ධිත පාර්ශවයන් විසින් වෙළඳ ගනුදෙනුකරුවන් හා සැපයුම්කරුවන් සමග කරන ගනුදෙනු වලදී ගනුදෙනු සකස් කිරීමේ හා ක්‍රියාවලි කළමනාකරණයේදී සිදුවන අසමත් වීම. |

## මෙහෙයුම් අවදානම් කළමනාකරණය - ක්‍රියාවලි වාර්තාකරණය

| අභ්‍යන්තර දැක්ම | බාහිර දැක්ම |
|---|---|
| ■ අවදානම් පිළිබඳ දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීම<br>■ වැඩිමනත් ලෙස තොරතුරු එක්රැස් කරගෙන තීරණ ගැනීම<br>■ ගිවිසුම් ප්‍රකාර අවශ්‍යතා ඉටු නොකිරීම මත ගිවිසුම් අවසන් කිරීමේදී ගත යුතු ක්‍රියාමාර්ග සහ ප්‍රතිකාර්මීය ක්‍රියාමාර්ග | ■ තරගකරුවන්ට සාපේක්ෂව ආයතනික කීර්තිනාමය ඉහල නැංවීම<br>■ මෙහෙයුම් ආශ්‍රිත සිදුවීම් නිසි කලට කළමනාකරණය කිරීම තුළින් කීර්තිනාම අවදානම වෙත නිරාවරණය වීම අඩු කිරීම<br>■ සන්නිවේදන කාර්යයන් වැඩිදියුණු කොට අදාළ කරුණු පහත සඳහන් බාහිර පාර්ශ්වකරුනවන් වෙත හෙලිදරවු කිරීම:<br>■ අධීක්ෂකයන්<br>■ විගණකවරුන්<br>■ ශ්‍රේණිගත කිරීමේ ආයතන<br>■ ගනුදෙනුකරුවන් |

## උපායමාර්ගික අවදානම් කළමනාකරණය

උපායමාර්ගික අවදානම යනු උපායමාර්ගික ඉලක්ක, ව්‍යාපාරික ක්‍රමෝපායික ඉලක්ක, එකී ඉලක්ක සාක්ෂාත් කරගනු පිණිස කළමනාකාරීත්වය විසින් සකස් කරනු ලැබෙන ව්‍යාපාරික ක්‍රමෝපායයන්, ඒ සඳහා වෙන් කර ඇති සම්පත් සහ එකී ක්‍රමෝපායයන් ක්‍රියාත්මක කිරීමේදී දක්වන ගුණාත්මකබාවය වැනි කරුණුවලට අදාළ කාර්යයකි.

ව්‍යාපාරික උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන සම්පත් ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය යන කාණ්ඩ දෙකටම අයත් වේ. සන්නිවේදන නාලිකා, මෙහෙයුම් පද්ධති, බෙදාහැරීම් ජාල සහ කළමනාකරණ ශක්‍යතා ආදිය ඊට ඇතුළත් වේ.

## පොදු උපායමාර්ගික අවදානම් වර්ග

| | |
|---|---|
| බාහිර අවදානම්<br>■ තරගකාරීත්වය<br>■ වෙළඳපොල ආශ්‍රිත වෙනස්වීම් | මානව සම්පත් ආශ්‍රිත අවදානම්<br>■ දැනුම<br>■ කාර්ය මණ්ඩලය සැකසීම<br>■ සේවකයින් විසින් සිදු කරනු ලබන සොරකම් ආදිය |
| මූල්‍ය අවදානම්<br>■ මුදල් ගලනය<br>■ ප්‍රාග්ධනය<br>■ මිල හෝ පිරිවැය පීඩන තත්ත්ව | ව්‍යුහාත්මක සම්පත් අවදානම්<br>■ තොරතුරු තාක්ෂණ පද්ධතිය<br>■ හිමිකාර තොරතුරු<br>■ නියාමන ක්‍රියාමාර්ග |
| භෞතික සම්පත් අවදානම්<br>■ ආපදා<br>■ අවහිරතා | සබඳතා අවදානම්<br>■ කීර්ති නාමය<br>■ වෙළඳ කාර්යසාධනය |

**කළමනාකාරීත්වය විසින් උපායමාර්ගික අවදානම් කළමනාකරණය සිදු කිරීමේදී අනුගමනය කරනු ලබන මූලික පියවර පහත දැක්වේ:**

- ව්‍යාපාරික සහ අවදානම් ආශ්‍රිත ක්‍රියාවලීන් සියල්ලම වෙත අදාළ තොරතුරු සන්නිවේදන කිරීම හා හුවමාරු කර ගැනීම
- අවදානම් කළමනාකරණයට අදාළ තොරතුරු හා දැනුම අන් අය හා හුවමාරු කරගැනීමට ඇති නොකැමැත්ත වැළැක්වීම
- ඉස්මතු විය හැකි අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම
- අවදානම් නිසා ඇති වීමට ඉඩ ඇති වාසිදායක ප්‍රතිඵල හඳුනා ගැනීම
- අවදානම් නිරීක්ෂණය හා කළමනාකරණය
- මෙය කිසි දා නිම නොවන අඛණ්ඩ ක්‍රියාවලියකි

## කීර්තිනාම අවදානම් කළමනාකරණය

කීර්තිනාම අවදානම යනුවෙන් අදහස් වන්නේ බැංකුව විසින් ගනු ලැබෙන ඇතැම් සැකසහිත ක්‍රියාමාර්ග නිසා බැංකුවේ ප්‍රතිරූපයට සහ මහජනතාව අතර ඇති කීර්තිනාමයට සිදු වන හානියයි. ඇතැම් අවස්ථාවලදී සාධාරණ හේතු සහිතව හෝ රහිතව බැංකුවට එරෙහිව මහජනතාව අතර ඍණාත්මක ප්‍රතිරූපයක් ජනප්‍රිය කිරීමේ උත්සාහයන් නිසාද මේ තත්ත්වය උද්ගත විය හැක. මෙහි ප්‍රතිඵලය වන්නේ මහජනතාව අතර බැංකුව කෙරෙහි ඇති විශ්වාසය පළුදු වීමයි.

## සාරාංශය

ආයතනයක් වශයෙන් බැංකුව විවිධ අවදානම් රැසකට නිරාවරණය වී තිබේ. බාසල් II යටතේ හඳුනා ගන්නා ලද ප්‍රධාන අවදානම් කාණ්ඩ වශයෙන් ණය අවදානම, වෙළඳපොල අවදානම සහ මෙහෙයුම් අවදානම යනාදිය සඳහන් කළ හැක. කෙසේ වෙතත්, මීට අමතරව ද්‍රවශීලතා අවදානම, නෛතික අවදානම, අනුකූලතා අවදානම, තොරතුරු තාක්ෂණ අවදානම, කීර්ති නාමයට ඇති අවදානම ඇතුළු තවත් අවදානම් වර්ග රැසකට මුහුණ දීමට බැංකුවට සිදු වේ. මේ සියලුම අවදානම් කාණ්ඩ එකිනෙක හා අන්තර් රඳා පැවැත්මක් ඇති ඒවා වීම විශේෂය. ආයතනික කළමනාකාරීත්වය, අනුකූලතා නිලධාරියා සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසින් බැංකුවේ සන්නාමය ආරක්ෂා කර ගනිමින් මහජනයා අතර විශ්වාසය දිනා ගැනීමේ වගකීම ක්‍රියාත්මක කරනු ලැබේ. සමස්ථ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය බැංකුවේ අවදානම් කළමනාකරණ කමිටුව විසින් සාර්ථක ලෙස මෙහෙයවනු ලැබෙන අතර ඒ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා ඉදිරිපත් කරනු ලැබේ.

# අනුකූලතා **වාර්තාව**

අනුකූලතා අවදානම යනුවෙන් හැඳින්වෙන්නේ මූල්‍යමය අලාභයන්ට මඟ පාදමින් බැංකුවට අදාළ නීති, රෙගුලාසි, පිළිවෙත් සංග්‍රහයන් සහ ප්‍රමිතීන් කෙරෙහි අනුකූලතාව නොදැක්වීම නිසා ඉස්මතු වීමට ඉඩ ඇති අවදානමයි. නීති ක්‍රියාත්මක කරන ආයතන, නියාමන ආයතන විසින් නිකුත් කර ඇති රීති හා ප්‍රමිතීන්, වෙළඳපොල සම්මුතීන්, හොඳම පරිචයන් ඇතුළත් සම්මුතීන් සහ බැංකු කාර්ය මණ්ඩලයට අදාළ අභ්‍යන්තර පිළිවෙත් සංග්‍රහයන්හි විධිවිධාන ආදී මූලාශ්‍ර කිහිපයකින්ම අනුකූලතා නීති මතු වේ. ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ කාර්යමණ්ඩලය සහ කළමනාකාරීත්වය අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කරන බව සහතික කිරීම සඳහා අභ්‍යන්තර ප්‍රතිපත්ති, රීති හා රෙගුලාසි මාලාවක් පවතී. මීට අමතරව, ඒකාබද්ධතාව සහ කාර්ය පරිපාටියට අදාළ ඉහළ ප්‍රමිතීන් පවත්වා ගැනීම තුළින් දැනටමත් පවතින නියාමන රාමුව තවදුරටත් පුළුල් කරමින් වැඩිදියුණු වූ අනුකූලතා ප්‍රමිතීන් ඇති කර ගැනීමට අප බැංකුව නිරන්තරයෙන් උත්සාහ දරයි.

## අනුකූලතා ඒකකය.

බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට අදාළව බැංකු පනත මඟින් ස්ථාපිත කොට ඇති යහපාලන නියමයන් හා හොඳම පරිචයන්ට අනුව අප බැංකුව විසින් අනුකූලතා ඒකකයක් පිහිටුවා ඇති අතර බැංකුවේ සමස්ථ අනුකූලතා අවදානම් කළමනාකරණයට අදාළ නිරීක්ෂණ කටයුතුවල වගකීම පවරා ඇති අනුකූලතා නිලධාරියෙකු යටතේ එය ක්‍රියාත්මක වෙයි. මෙම ඒකකය විසින් නිරන්තරයෙන්ම බැංකුවට අදාළ නීති, රෙගුලාසි, ව්‍යවස්ථාපිත මාර්ගෝපදේශනයන් සහ අභ්‍යන්තර පාලන විධිවිධාන හා ප්‍රතිපත්තිවලට අනුකූලතාව දක්වන්නේද යන වග තක්සේරු කරනු ලැබේ. කෙසේ වෙතත්, අදාළ වගකීම් සාර්ථක ලෙස ඉටු කිරීමට තරම් ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් මෙම ඒකකය වෙත අනුයුක්ත කර නොමැත.

- මෙම ඒකකය විසින් බැංකුවට මුහුණ දීමට සිදු වන ප්‍රධාන අනුකූලතා අවදානම් වාර්ෂිකව තක්සේරු කොට අවදානම් හා විගණන කමිටු තුළ එකී අවදානම් කළමනාකරණය කර ගැනීම සඳහා අවශ්‍ය සැලසුම් සාකච්ඡා කරනු ලබයි.
- අදාළ කාර්යභාරයන් අතරින් වැඩි ගණනක් වෙත අනුකූලතා ප්‍රතිපත්තියේ අවධානය යොමු වන අතර එය අනෙකුත් කාර්යයන් සමඟම අන්තර් රඳාපැවැත්මක් දක්වන්නකි.
- අනුකූලතා ප්‍රතිපත්තියෙහි පිටපත් බෙදා හැරීම තුළින් බැංකුවේ අනුකූලතා ප්‍රතිපත්තිය සෑම දෙපාර්තමේන්තු ප්‍රධානියෙකුම වෙත සන්නිවේදනය කර තිබේ.
- අනුකූලතා කමිටු ප්‍රධානියා අධ්‍යක්ෂ මණ්ඩලයට අනුබද්ධිත අවදානම් කළමනාකරණ කමිටුව වෙතද පරිපාලනමය කරුණු සම්බන්ධයෙන් සාමාන්‍යාධිකාරී වෙතද වාර්තා කරයි.
- අනුකූලතා අවදානම නව සේවා හා නිපැයුම් වෙතද සම්බන්ධ වෙයි. අලුතින් හඳුන්වා දෙනු ලබන සියලුම නිපැයුම් හා සේවාවන් අනුකූලතා නිලධාරියාගේ තක්සේරුකරණයට ලක් වෙයි.
- අනුකූලතා ඒකකය විසින් අර්ධ වාර්ෂිකව අනුකූලතා පරීක්ෂාව සිදු කොට අධ්‍යක්ෂ මණ්ඩලයට අනුබද්ධිත අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කරනු ලබයි. මීට අමතරව, හඳුනා ගනු ලැබෙන දුර්වලතා සඳහා නිරවද්‍යකරණ ක්‍රියාමාර්ග ගනු පිණිස සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙතද අදාළ ප්‍රතිඵල වාර්තා කරනු ලබයි.
- මෙම ඒකකය විසින් අනුකූලතා වැඩසටහන්ද ක්‍රියාත්මක කරනු ලැබේ.
- මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ රෙගුලාසිවලට අනුකූලතාව දක්වන බව සහතික කරනු පිණිස බැංකුව විසින් පියවර කිහිපයක්ම ගෙන තිබේ. කාර්ය මණ්ඩලය සඳහා පුහුණු අවස්ථා ලබා දීම, මුද්‍රිත දැනුම්වත් කිරීමේ ලේඛන ලබා දීම සහ ප්‍රායෝගික ප්‍රශ්න ඇසීම තුළින් ඉදිරිපෙළ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ දැනුම පරීක්ෂා කිරීම ආදිය ඉන් කිහිපයකි.

## අනුකූලතා රාමුව



# මානව සම්පත් **කළමනාකරණය**

## 1. මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව

### 1.1 කමිටුවේ අරමුණු

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම කමිටුව පත් කරන ලද්දේ බැංකුව තුළ සියලුම වැදගත් මානව සම්පත් හා පාරිශ්‍රමික ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම සඳහාය. මීට අමතරව, ප්‍රධාන විධායක නිලධාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට අදාළව පාරිශ්‍රමික තීරණය කිරීමද කමිටුව විසින් කරනු ලැබේ. ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් වෙනුවෙන් ප්‍රධාන කාර්යසාධන දර්ශක පිහිටුවීම හා ඔවුන්ගේ කාර්යසාධනය ඇගයීමද කමිටුවේ වගකීමක් වෙයි.

### 1.2 කමිටුවේ සාමාජිකයන්

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව සමන්විත වන්නේ පහත සඳහන් අධ්‍යක්ෂවරුන්ගෙනි:

සී. කුලතිලක මහත්මිය - අධ්‍යක්ෂ<br>
එස්. මඩපාත මහතා - අධ්‍යක්ෂ<br>
එස්. විතාරනගේ මහතා - අධ්‍යක්ෂ

කමිටුවේ සභාපති වශයෙන් සී. කුලතිලක මහත්මිය එහි නායකත්වය දරණ ලද අතර ජ්‍යෙෂ්ඨ කළමනාකාර - මානව සම්පත් සංවර්ධන හා ආයතනික එහි ලේකම් වශයෙන් කටයුතු කරන ලදී.

### 1.3 රැස්වීම්

2015 වසරේදී සාර්ථක ලෙස පවත්වන ලද කමිටු රැස්වීම් හයකදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරුණු නිර්දේශ සියල්ලම පාහේ ක්‍රියාත්මක කරන ලදි.

| අධ්‍යක්ෂවරයාගේ නම | රැස්වීම් සංඛ්‍යාව | |
|---|---|---|
| | පැවැත් වූ රැස්වීම් | සහභාගී වූ රැස්වීම් සංඛ්‍යාව |
| සී. කුලතිලක මහත්මිය | 06 | 06 |
| එස්. මඩපාත මහතා | 06 | 06 |
| එස්. විතාරණගේ මහතා | 06 | 05 |

## 2. ප්‍රධාන කාර්යභාරයන්

(අ). 2015 වසරේදී මානව සම්පත් සංවර්ධන අංශයේ ප්‍රධානතම ඉලක්කය වූයේ දිනෙන් දින ඉහළ යන බැංකු අවශ්‍යතා සහ ඉල්ලුමට සරිලන සේවයක් කාර්යක්ෂමව සැපයීමට හැකි වීම සඳහා හොඳම සුදුස්සන් කාර්ය මණ්ඩලයට බඳවා ගැනීමය. ශාඛා ජාලය ව්‍යාප්ත කිරීමද එහි එක් අරමුණක් විය.

සහකාර සාමාන්‍යාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාර - තොරතුරු තාක්ෂණ බැංකුවට බැඳුණේද මෙම සමාලෝචනයට ලක් වන වසර තුළදීය.

2015 ජනවාරි 01 වන විට බැංකුව සතුව සිටි සේවක සංඛ්‍යාව 96 ක් වූ අතර වසර අවසානය වන විට එය 106 ක් දක්වා ඉහළ ගොස් ඇත

(ආ). බැංකුවේ විධායක කළමනාකරණ නිලධාරීන්ගේ අධ්‍යාපනික/වෘත්තීය පසුබිම පහතින් දැක්වේ:

**විධායක ශ්‍රේණියේ නිලධාරීන්ගේ අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම්**




(ඈ). නව අභියෝගයන්ට මුහුණ දීම සඳහා බාහිර පුහුණු හා සංවර්ධන වැඩසටහන් කාර්ය මණ්ඩලය වෙනුවෙන් ලබා දීම කමිටුවේ තවත් ප්‍රධාන කර්තව්‍යයකි. ඒ අනුව ලබා දුන් පුහුණු වැඩසටහන්වලට අදාළ විස්තර පහත දැක්වේ:

| | පැය ගණන | සහභාගී වූ සාමාජිකයන් සංඛ්‍යාව |
|---|---|---|
| ණය | 120 | 06 |
| මූල්‍ය කළමනාකරණය සහ විගණන | 188 | 27 |
| බැංකු මෙහෙයුම් | 419 | 71 |
| මානව සම්පත් හා සාමාන්‍ය කළමනාකරණය | 34 | 06 |
| තොරතුරු තාක්ෂණ | 540 | 45 |
| නීති | 42.5 | 10 |
| අවදානම් කළමනාකරණය | 40 | 06 |

මේ අතර, බැංකුවේ එක් සේවකයෙකු විදේශීය පුහුණු වැඩසටහනක් සඳහාද සහභාගී විය. කනිෂ්ඨ කාර්ය මණ්ඩලය සංවර්ධනය කිරීම සඳහා අදාළ විෂය ක්ෂේත්‍ර පිළිබඳ අභ්‍යන්තර පුහුණු වැඩසටහන්ද සංවිධානය කෙරුණි.

පාරිභෝගිකයන් සඳහා වඩා කාර්යක්ෂම සේවාවක් ලබා දෙන අතරම රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව කටයුතු කිරීමේ අරමුණින් දමිළ භාෂා පන්තිද අභ්‍යන්තරික වශයෙන් පැවැත්විණ.

එසේම, සේවකයන්ගේ උසස් අධ්‍යාපන කටයුතු හා බැංකුකරණයට අදාළ දැනුම හා සුදුසුකම් ඉහළ නැංවීමේ අරමුණින් ශ්‍රී ලංකා බැංකුකරණ ආයතනය සහ කොළඹ විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන අදාළ විභාග සමත් වන සේවකයන් සඳහා අනුග්‍රාහක මුදල් ලබා දීමටද බැංකුව කටයුතු කර ඇත.

මීට අදාළ ආයතනික සමාජ වගකීම් ප්‍රයත්නයක් වශයෙන් උසස් අධ්‍යාපන කටයුතුවල නිරත සිසුන් හට පුහුණුව ලබන්නන් ලෙස අත්දැකීම් හා පළපුරුද්ද ලබා ගැනීමේ අවස්ථා විවර කිරීමද මෙම සමාලෝචනයට ලක් වන කාල සීමාව තුළ සිදු වූ විශේෂ සිදුවීමකි.

(ඇ). දීර්ඝ කාලීන අවශ්‍යතාවක් සපුරාලමින් භාණ්ඩාගාර කළමනාකරණ අංශය ස්ථාපිත කරන ලදි.

(ඉ). බැංකුව අභ්‍යන්තරයේ සන්නිවේදන කටයුතු වඩා පහසු කිරීමේ සහ කඩිනමින් තීන්දු ක්‍රියාත්මක කිරීමේ අරමුණු ඉටු කර ගැනීමට උචිත පරිදි බැංකු සංවිධාන ව්‍යුහය හැඩගස්වා ගැනීම.

(ඊ). 2015 මූල්‍ය වර්ෂය තුළදී සේවකයන් සඳහා තවත් ප්‍රතිලාභ රැසක්ම සලසන ලදි. වෛද්‍ය රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම, අසාධ්‍ය රෝග සඳහා මූල්‍යාධාර ආවරණය, පුද්ගලික හදිසි අනතුරු ආවරණය, කාර්ය මණ්ඩලය සඳහා වන නිවාස ණය ක්‍රමය, ප්‍රසූත ප්‍රතිලාභ වැඩි කිරීම, ප්‍රසාද දීමනා, වසර අවසානයේදී ඉතිරි නිවාඩු සඳහා වැටුප් ගෙවීම, පුස්තකාල පහසුකම් ලබා දීම ආදිය ඒ අතරින් කිහිපයකි.

# විගණන කමිටු වාර්තාව

විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් බැංකුවේ විගණන කමිටුව සමන්විත වෙයි. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඇරයුම අනුව එහි රැස්වීම්වලට සහභාගී වෙයි. කමිටුවේ ආරාධනය මත විගණකාධිපති ජෙනරාල්වරයාගේ නියෝජිතයෙකු, බාහිර විගණන නියෝජිතයන්, සේවකයන් සහ බාහිර උපදේශකවරුන්ද මෙම රැස්වීම්වලට සහභාගී වේ. විගණන කමිටුවේ තීරණ ගැනීම සඳහා පැවතිය යුතු ගණ පූරණය දෙකකි. විගණන කමිටුව කාර්තුවකට එක් වරක් රැස්වන අතර කමිටු සභාපතිගේ අභිමතය පරිදි රැස්වීම් වාර ගණන වැඩි කළ හැකිය.

2015 දෙසැම්බර් 31 න් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් 05 ක් පවත්වන ලදි. බැංකුවේ අභ්‍යන්තර විගණන අංශ ප්‍රධානී මෙහි ලේකම් වශයෙන් කටයුතු කර ඇති අතර රැස්වීම්වලට අදාළ වාර්තා නිසි පරිදි පවත්වාගෙන ගොස් ඇත. විගණන කමිටු රැස්වීම් වාර්තා විධිමත් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ. මෙම සමාලෝචනයට ලක් වන මූල්‍ය වර්ෂය තුළ විගණන කමිටු සාමාජිකයන් වශයෙන් රැස්වීම්වලට සහභාගී වූ නිලධාරීන් පහත දැක්වේ:

| විගණන කමිටු රැස්වීම පැවැත්වූ දිනය | කමිටු සාමාජිකයාගේ නම හා තනතුර | | |
|---|---|---|---|
| | චන්ද්‍රිකා කුලතිලක මිය (කමිටුවේ සභාපති) | කේ. අමරසිංහ මහතා (කමිටු සාමාජික) | සුනිල් විතාරණගේ මහතා (කමිටු සාමාජික) |
| 2015 අප්‍රේල් 7 (28 වන කමිටු රැස්වීම) | සහභාගී විය | සහභාගී විය | සහභාගී විය |
| 2015 ජූනි 17 (29 වන කමිටු රැස්වීම) | සහභාගී විය | සහභාගී නොවීය | සහභාගී විය |
| 2015 ජූලි 27 (30 වන කමිටු රැස්වීම) | සහභාගී විය | සහභාගී විය | සහභාගී විය |
| 2015 සැප්තැම්බර් 28 (31 වන කමිටු රැස්වීම) | සහභාගී විය | සහභාගී විය | සහභාගී විය |
| 2015 නොවැම්බර් 18 (32 වන කමිටු රැස්වීම) | සහභාගී විය | සහභාගී විය | සහභාගී විය |
| 2015 වසර තුළ පැවැත්වූ විගණන කමිටු රැස්වීම් සංඛ්‍යාව | පහකි (05) | පහකි (05) | පහකි (05) |
| සහභාගී වූ විගණන කමිටු රැසවීම් සංඛ්‍යාව | පහකි (05) | හතරකි (04) | පහකි (05) |
| සහභාගී නොවූ විගණනන කමිටු රැස්වීම් සංඛ්‍යාව | නැත | එකකි (01) | නැත |

අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම, අභ්‍යන්තර පාලන පද්ධතිවල යෝග්‍යතාවය විමසීම, නියාමන රෙගුලාසිවලට අනුකූලතාව තක්සේරු කිරීම, මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම සහ බාහිර හා අභ්‍යන්තර විගණන නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලැබෙන ස්වාධීන වාර්තාවල සඳහන් නිර්දේශ හා නිරීක්ෂණ සලකා බැලීම ආදී කටයුතු සඳහා විගණන කමිටුවට බලය පවරා ඇත.

අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තාවල ඇතුළත් මූල්‍ය ප්‍රකාශන විගනන කමිටුවේ සමාලෝචනයට ලක් වන අතර එහිදී වැඩි අවධානයක් යොමු කරන ලද කරුණු බාහිර විගණකවරුන්ගේ කළමනාකරණ ලිපියෙහි සඳහන් වේ. දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් සම්පාදිත වාර්තා සාකච්ඡාවට බඳුන් කරනු ලබන අවස්ථාවලදී ඔවුන්ද රැස්වීම්වලට සහභාගී කරවා ගනු ලැබේ. මේ නිසා බැංකුවේ අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා සමාලෝචනය කිරීම සඳහා පුළුල් අවකාශයක් විගණන කමිටුව මගින් සැලසේ.

**විගණන කමිටුව සතු වගකීම් මෙසේය:**

- මූල්‍ය ප්‍රකාශනවල ඒකාග්‍රතාව, වාර්ෂික වාර්තා, මාසික ගිණුම් වාර්තා සහ හෙළිදරව් කිරීම සඳහා සකස් කරනු ලැබෙන කාර්තුමය වාර්තා ආදිය නිරීක්ෂණය කිරීම සඳහා බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කිරීම.

- බැංකුවේ ගිණුම් ප්‍රතිපත්ති හා පරිචයන්හි ගුණාත්මකභාවය හා පිළිගත හැකි බව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම.

- ගිණුම් හා මූල්‍ය වාර්තා සැකසීම, අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සහ නියාමන අනුකූලතාවන් සමාලෝචනය කිරීම.

- මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත් කිරීමට පෙර ඒවා අදාළ ව්‍යවස්ථාපිත විධිවිධාන, ගණකාධිකරණ ප්‍රමිතීන් සහ ප්‍රතිපත්තිවලට අනුකූලව සකසා ඇතිද යන වග සහතික කරනු පිණිස සමාලෝචනය කිරීම.

- අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය කිරීම සහ බැංකු මෙහෙයුම්වලට අදාළව දුර්වලතා, දෝෂ හා බිඳ වැටීම්, කාර්ය පටිපාටි උල්ලංඝනය වීම්, වංචා හා දූෂණ ආදිය සිදුවීමේ ඉඩකඩ අවම කිරීම සඳහා ආයතනික කළමනාකාරිත්වයට සහාය වීම.

- අභ්‍යන්තර විගණන කටයුතු ස්වාධීනව සිදුව තිබේද යන වග තක්සේරු කිරීම සහ අභ්‍යන්තර විගණන ප්‍රධානී පත් කිරීමද ඇතුළුව අභ්‍යන්තර විගණන කටයුතුවල කාර්යසාධනය හා කාර්යභාරයන් නිරීක්ෂණය කිරීම.

- බාහිර විගණකවරුන් පත් කිරීම, ගෙවීම් කිරීම, ඉල්ලා අස්වීම, ඉවත් කිරීම වැනි කටයුතු අධීක්ෂණය කිරීම, එහි පිරිවැය හා සඵලදායිතාවය ඇගයීම මෙන්ම බාහිර විගණකගේ ස්වාධීනත්වය අධීක්ෂණය කිරීම.

- මූල්‍ය වාර්තා සකස් කිරීමේදී විශ්වසනීයත්වය ආරක්ෂා වී ඇති බවට පිළිගත හැකි සහතිකයක් ලබා දීම සඳහා එම කටයුතු බැංකුපද්ධතිවල අභ්‍යන්තර පාලනය යටතේ සාර්ථකව සිදු වන්නේද යන වග සමාලෝචනය කිරීම සහ බැංකුවෙන් බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී පිළිගත් ගිණුම්කරණ සම්මතයන් හා නියාමන අවශ්‍යතා අනුගමනය කරනු ලැබෙන බව සහතික කිරීම.

ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා කමිටුව පහත කරුණු කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කරයි:

- ප්‍රධාන තීරක අංශ
- ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පරිචයන්හි සිදුව ඇති කැපී පෙනෙන වෙනස්කම්
- අවසන් විගණනයෙහිදී ඉස්මතු වන කැපී පෙනෙන වෙනස්කම්
- ව්‍යාපාරික අඛණ්ඩතා සංකල්පයේ වලංගුභාවය
- දේශීය හා ජාත්‍යන්තර ගණකාධිකරණ හා විගණන ප්‍රමිති හා වෙනත් නියාමන අවශ්‍යතා
- අවදානම් නිසි පරිදි සැලකිල්ලට ගෙන කළමනාකරණය කරනු ලැබේද යන වග
- අභ්‍යන්තර පාලන පද්ධතිවල කාර්යක්ෂමතාව

ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ වත්කම් සුරක්ෂිත බවටත්, මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති බැංකුවේ මූල්‍ය තත්ත්වය සාවද්‍ය නියෝජනයන්ගෙන් තොර බවටත් බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සාධාරණ සහතිකයක් ලබා දීමට හැකි පරිදි ප්‍රමාණවත් පරිදි අභ්‍යන්තර පාලන හා ක්‍රමවේද බැංකුව තුළ ක්‍රියාත්මක වෙමින් පවතින බව හා ඒවාට අදාළ වැඩිදියුණු කිරීම් සිදු වෙමින් පවතින බව කමිටුවේ මතය වේ.

විගණන කමිටුව වෙනුවෙන්

.......................................

**චන්ද්‍රිකා කුලතිලක මිය**
විගණන කමිටුවේ සභාපතිනි
කොළඹ, ශ්‍රී ලංකාව
2016 නොවැම්බර් 4

# අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳව අධ්‍යක්‍ෂවරුන්ගේ ප්‍රකාශනය

## වගකීම

2007 අංක 12 දරන බැංකු පනතේ 3 (8) (II) (ආ) වගන්තියේ විධිවිධානවලට අනුකූලව ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකු සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2015 මූල්‍ය වර්ෂය සඳහා වන මූල්‍ය වාර්තා සකස් කිරීමේදී යොදා ගත් අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳ මෙකී වාර්තාව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය මගින් නිකුත් කර ඇති මාර්ගෝපදේශනයන්ට අනුව ඉදිරිපත් කරනු ලබයි.

ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතියේ යෝග්‍යතාව සහ නිවැරදිභාවය සම්බන්ධයෙන් වගකීම අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත පැවරෙයි. එහිදී බැංකුව ලබන ප්‍රතිලාභ සහ අවදානම් පාලිත පදනමක් මත සමබර විය යුතු බව අධ්‍යක්‍ෂ මණ්ඩලය පිළිගන්නා අතර ඒ අනුව බැංකුව සඳහා නියම කරගෙන සිටින භාරගත හැකි අවදානම් සීමා සහ දර්ශක ඉක්මවන අවස්ථා අවධාරණය කිරීමේ මූලික අරමුණකින් යුතුව අභ්‍යන්තර පාලන පද්ධති සැලසුම් කර ඇත. ඒ අනුව අභ්‍යන්තර පාලන පද්ධතියට ප්‍රමාණාත්මක බලපෑමක් සහිත මූල්‍ය තොරතුරු හා වාර්තා හෝ මූල්‍යමය අලාභ හෝ වංචාවන් මගින් ආයතනයට විය හැකි හානිය දුරු කරන බවට සම්පූර්ණ සහතිකයක් ලබාදිය නොහැකි අතර ඒවා බොහෝ දුරකට අවම කිරීමට කටයුතු කරනු ලැබේ.

අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් බැංකුව මුහුණපානු ලබන සුවිශේෂී අවදානම් හඳුනාගැනීම, ඇගයීම හා කළමනාකරණය සඳහා දැනටමත් පවත්වාගෙන යන ක්‍රියාවලියක් ස්ථාපිත කර ඇති අතර, ව්‍යාපාරික පරිසරයේ හෝ නීති හා රෙගුලාසි නිර්දේශවල සිදුවන වෙනස්කම් වලට සරිලන සේ අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩිදියුණු කිරීමද එයට ඇතුළත් කර තිබේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය මගින් නිකුත් කර ඇති අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්‍ෂවරුන්ගේ ප්‍රකාශනයට අදාළ බැංකු අධ්‍යක්‍ෂවරුන් සඳහා වන මාර්ගෝපදේශනවලට අනුකූල වන පරිදි මෙම ක්‍රියාවලිය විධිමත්ව සමාලෝචනය කරනු ලැබේ.

එමෙන්ම දැනට ක්‍රියාත්මක කර ඇති අභ්‍යන්තර පාලන පද්ධතිය, මූල්‍ය වාර්තාකරණයේ නිරවද්‍යතාවය පිළිබඳව පිළිගත හැකි සහතිකයක් ලබාදීමට ප්‍රමාණවත් වන බවට සහ බාහිර අරමුණු වෙනුවෙන් පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශ අදාළ ගිණුම්කරණ මූලධර්ම හා ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූල වන බවට අධ්‍යක්‍ෂ මණ්ඩලය විශ්වාසය පළ කරයි.

බැංකුවේ කළමනාකාරිත්වය විසින් අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අවදානම පිළිබඳ වන ප්‍රතිපත්ති සහ වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමට සහ මුහුණ දෙන අවදානම් හඳුනාගැනීම හා ඇගයීම මගින් එය පාලනයට සහාය දෙනු ලබයි. එමෙන්ම මෙම අවදානම් අවම කිරීමට හා පාලනයට යෝග්‍ය අභ්‍යන්තර පාලනයක් නිර්මාණය කිරීමට, ක්‍රියාවේ යෙදවීමට හා අධීක්‍ෂණයටද සහාය ලබා දෙයි.

**අභ්‍යන්තර පාලන පද්ධතියේ සැකැස්ම හා කාර්යක්‍ෂමතාව සමාලෝචනය කිරීමේ ක්‍රියාවලිය සතු මූලික ලක්‍ෂණ**

මූල්‍ය වාර්තාකරණයට අදාළව බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතියේ යෝග්‍යතාව හා ඒකාබද්ධතාව සමාලෝචනය කිරීමේදී යොදා ගනු ලැබෙන ක්‍රියාවලිය සතු මූලික ලක්‍ෂණ පහත දැක්වේ:

- අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් බැංකුවේ දෛනික මෙහෙයුම් කටයුතුවල කාර්යක්‍ෂමතාවය සහතික කිරීම සඳහා කමිටු කිහිපයක්ම පත්කර තිබෙන අතර ඒවා විසින් බැංකුවේ මෙහෙයුම් කටයුතු එහි ව්‍යාපාරික අරමුණුවලට, උපායමාර්ගවලට සහ වාර්ෂික අයවැයට මෙන්ම අනුමත කරගන්නා ලද ප්‍රතිපත්ති හා ව්‍යාපාරික මාර්ගෝපදේශයන්ට අනුකූල වන බව සහතික කරනු ලැබේ.

- බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය මගින් දැනටමත් චක්‍රීය ක්‍රමවේද හා නියැදි භාවිත කරමින් අභ්‍යන්තර පාලන පද්ධතීන්හි කාර්යක්‍ෂමතාව හා ප්‍රතිපත්ති හා ක්‍රමවේදවලට අනුකූලතාව දක්වන්නේද යන වග පරීක්‍ෂා කරමින් එසේ නොවන අවස්ථාවලදී වැදගත් තොරතුරු අවධාරණය කරයි. බැංකුවේ සෑම ශාඛාවකටද අදාළව විගණන කටයුතු සිදු කෙරෙන අතර වඩා ස්වාධීන හා වාස්තවික වාර්තාවක් සකස් කිරීමේ අරමුණින් එකී විගණනයන් සිදු කරනු ලබන වාර ගණන, තක්සේරුවට ලක් වෙන අවදානම් මට්ටම් අනුව තීරණය වේ. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ සමීක්‍ෂණ වාර්තා කලින් කල පැවැත්වෙන රැස්වීම්වලදී සමාලෝචනය සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

- බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව, නියාමන අධිකාරීන් සහ කළමනාකාරීත්වය විසින් හඳුනා ගන්නා ලද පාලන ගැටළු සමාලෝචනය කරනු ලබන අතර ඉන් අනතුරුව අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ සහ අභ්‍යන්තර පාලන පද්ධතියෙහි කාර්යක්ෂමතාව සහ යෝග්‍යතාව ඇගයීමට ලක් කෙරේ විගණන කටයුතුවල පරාසය සහ අභ්‍යන්තර විගණනයන්හි ගුණාත්මකභාවය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් අභ්‍යන්තර විගණන කටයුතු විමසා බැලීමද මෙහිදී සිදු කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් වාර්තා කලින් කලට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ. බැංකුවේ විගණන කමිටුව විසින් සිදු කරනු ලබන වැඩිදුර ක්‍රියාකාරකම් මෙහි දැක්වෙන විගණන කමිටු වාර්තාවෙහි ඇතුළත් කර ඇත.

- මූල්‍ය වාර්තාකරණයට අදාළව අභ්‍යන්තර පාලන පද්ධතිය තක්සේරු කිරීමේදී බැංකුවේ කැපී පෙනෙන ගිණුම් සහ මූල්‍ය ප්‍රකාශන හෙළිදරව් කිරීම හා සම්බන්ධ සියලු ක්‍රමවේද හා පාලන විධිවිධාන එක්රැස් කර ගන්නා ලදි. ඉන් අනතුරුව, ඒවායෙහි සැකැස්මේ යෝග්‍යතාව හා කාර්යක්ෂමතාව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂා කර බලන ලදි. මෙහිදී හඳුනා ගැනීම, මිනුම්ගත කිරීම, වර්ගීකරණය සහ හෙළිදරව් කිරීම වැනි කටයුතු ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුකූලව පවත්වාගෙන යනු ලැබේ.

- බැංකුවට අදාළ වන ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර පිළිබඳ සමස්ථ කළමනාකරණ කටයුතු අධීක්ෂණය කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට අනුබද්ධිත අවදානම් කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කරන ලදි. මීට අමතරව, බැංකුවේ සියලු කටයුතු ඒවාට අදාළ නීති, රෙගුලාසි සහ නියාමන විධිවිධානවලට අනුකූලව සිදු කෙරෙන බව සහතික කිරීම සඳහා ස්වාධීන අනුකූලතා කමනාකරණ ඒකකයක්ද පිහිටුවන ලද අතර ඕනෑම ආකාරයක අනනුකූලතාවක් වාර්තා වුව හොත් ඒ බව අධ්‍යක්ෂ මණ්ඩලයට අනුබද්ධිත අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කිරීමට පියවර ගනු ලැබේ.

- දෛනික ව්‍යාපාරික කටයුතුවලදී බැංකුවේ ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර මනාව හා කාර්යක්ෂමව කළමනාකරණය හා අධීක්ෂණය කරනු ලැබෙන බව සහතික කිරීම සඳහා අවශ්‍ය බලතල පවරන ලද කළමනාකාරීත්ව මට්ටමේ කමිටුද ක්‍රියාත්මක වෙමින් පවතී.

## තහවුරු කිරීම

ඉහත ක්‍රියාවලින් මත පදනම්ව බැලූ කල බැංකුවේ මූල්‍ය වාර්තාකරණ පද්ධතිය, මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය පිළිබඳව පිළිගත හැකි සහතිකයක් ලබා දිය හැකි වන අයුරින් සකස් කර තිබෙන බවටත්, බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට අනුකූලව සිදු කර තිබෙන බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහුවරු කරනු ලබයි.

## බාහිර විගණකවරුන්ගේ සමාලෝචන ප්‍රකාශනය

බාහිර විගණකයින් විසින් ඉහත දැක්වූ 2015 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂයේ වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර තිබෙන අභ්‍යන්තර පාලනය පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය විමර්ශනයට ලක්කර, එම ප්‍රකාශනය බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතියේ ඵලදායීතාවය හා එහි සැකැස්ම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය විමර්ශනය සඳහා යොදාගත් කරුණුවලට හා සිය අවබෝධය මත එම ක්‍රියාවලියට අනුකූල නොවන බවට විශ්වාස කළ හැකි කිසිවක් වාර්තා වී නොමැති බවට තහවුරු කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමයෙන්

| | | | |
|---|---|---|---|
| කේ. අමරසිංහ මහතා<br>වැඩබලන සභාපති | සී. කුලතිලක මහත්මිය<br>සභාපතිනි - අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව | සුනිල් විතාරනගේ මහතා<br>අධ්‍යක්ෂ | ඩබ්ලිව්.ඒ.යූ. බණ්ඩාර මහතා<br>සාමාන්‍යාධිකාරී/<br>ප්‍රධාන විධායක නිලධාරී |

# විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. BAF/A/SLSBL/FA/2015 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 22 September 2017

**ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ**
**කොටස් හිමියන් වෙත,**

**2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව**

2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදයම් ප්‍රකාශන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ ("බැංකුව") මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

### මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය අධ්‍යක්ෂ මණ්ඩලයේ ("අධ්‍යක්ෂ මණ්ඩලය") වගකීම වේ.

### විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවල බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදනම් තක්සේරු කිරීම් විගණනගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදනම් තක්සේරු කිරීම් වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැකසුම් කිරීම පිණිස බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදයිත්වය පිළබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදගන්නා ලද ගිණුමකරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්‍ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**තත්වාගනනය කළ මතය සඳහා පදනම**

01. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 හි 15 වගන්තියට අනුව මූල්‍ය ප්‍රකාශන සාධාරණ ලෙස පිළියෙළ කොට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවලදී අතිරේක තොරතුරු හෙළිදරවු කිරීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, බැංකුව සතුව ප්‍රමාණවත් සාක්ෂි නොමැති වීම හේතුවෙන් පිළිවෙළින් 2015 සහ 2014 වසරවලට අදාළ හිමිකම් වෙනස්වීම් දක්වන ප්‍රකාශයේ පෙර වසර සඳහා ගැලපුම් ඉදිරිපත් කිරීමේදී රු. 68,537 ක සහ රු. 27,745,091 ක නොගලපන ලද ශේෂයක්, තොරතුරු හෙළිදරව් නොකර දක්වා ඇත.

02. වාර්තාකරණ කාල සීමාව අවසානය වන විට බැංකුව නිරාවරණය වන අවදානම් වන ණය අවදානම, වෙළෙඳපොල අවදානම සහ ද්‍රවශීලතා අවදානම ආදී මූල්‍ය උපකරණ ඇසුරින් පැන නගින අවදානම්වල ස්වභාවය සහ තරම සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 7 - මූල්‍ය උපකරණ සහ හෙළිදරවු කිරීම් ප්‍රකාරව එකී අවදානම් කළමනාකරණය කරගත් අයුරු බැංකුව විසින් හෙළිදරවු කර නොමැත.

03. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 40 - ආයෝජන දේපල, අනුකූලව පිළිගත් වෘත්තීය සුදුසුකම් සපුරා ඇති සහ ආයෝජන දේපලෙහි පිහිටීම සහ කාණ්ඩය පිළිබඳ අත්දැකීම් සපුරා ඇති ස්වාධීන තක්සේරුකරුවෙකුගේ තක්සේරු කිරීමක් මත ආයෝජන දේපලෙහි සාධාරණ අගය කොතෙක් දුරට රඳා පවතින්නේද යන්න හෙළිදරවු කර නොමැත.

04. බැංකු සැසඳීම් ප්‍රකාශනය, ලෙජරයේ සඳහන් අගයන් සමග නොගැලපෙන අතර, වර්ෂ අවසානයේ සමාලෝචනයට අනුව බැංකු සැසඳීම් ප්‍රකාශන සහ ලෙජරය වෙත ගෙන ඇති අගයයන් අතර රු. 30,916,133 ක වෙනසක් නිරීක්ෂණය වෙයි.

05. ණය වර්ග 6 කට අදලව පොදු ලෙජරයේ ශේෂයන් ණය ලේඛණයට වඩා වැඩියෙන් දක්වා ඇති අතර එය රු. 4,606,059 කි. ණය වර්ග 3 කට අදලව පොදු ලෙජරයේ ශේෂයන් ණය ලේඛනයට වඩා අඩුවෙන් දක්වා ඇත. එය රු. 1,462,929 කි.

06. කල්බදු හා කුලීපිට ගැනීම්වලට අදාළව සපයන ලද ණය ලේඛනය සහ පෙදු ලෙජරය අතර රු. 6,225,150 ක නොවිසඳන ලද වෙනස්කම් නිරීක්ෂණය විය.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

07. බැංකු ශාඛා අතර සිදුකරනු ලබන අභ්‍යන්තර ගනුදෙනු සටහන් කිරීම සඳහා පවත්වා ගනු ලබන ශාඛා ජංගම ගිණුම් අතර නොසැසුදුනු ශේෂය රු. 10,454,038 කි.

08. මෙම කාල සීමාව අවසානයට අදාළ මූල්‍ය ප්‍රකාශනවලට අනුව මහා භාණ්ඩාගාරය වෙත ගෙවීමට නියමිත ණය (ආසියානු සංවර්ධනය බැංකුවට ගෙවිය යුතු ක්ෂුද්‍ර මූල්‍ය ණය) සහ මහා භාණ්ඩාගාරය විසින් සනාථ නොකරන ලද ශේෂය අතර වෙනස රු. 2,611,023 කි. මෙම වෙනස කිසිදු අනාවරණයකින් තොරව ප්‍රකාශිත ප්‍රාග්ධනය වෙත මාරු කර ඇත.

09. උචිත හා ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මෙම සමාලෝචනයට ලක් වන කාල සීමාව තුළ ලෙජරයෙහි රු. 99,428,472 ක් ලෙස සඳහන් වන සෘණ ණය ශේෂයන් සතුටුදායක ලෙස විගණනය මගින් තහවුරු කළ නොහැක.

10. රු. 2,784,406 ක් වන අනෙකුත් ගෙවිය යුතු ශේෂයෙහි නිරවද්‍යතාව, අස්තිත්වය, සම්පූර්ණභාවය සහ තක්සේරු කිරීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය ලේඛනගත මූලාශ්‍ර කිසිවක් හමු නොවීය.

11. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2014 දෙසැම්බර් 23 දිනැති අංක 02/17/402/0073/002 දරන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව 2016 ජනවාරි 01 සිට බලපැවැත්වෙන පරිදි සෑම බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්ම සිය අවම ප්‍රාග්ධන අවශ්‍යතාව රු. බිලියන 05 දක්වා වැඩිකර ගත යුතු වුවද, බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව එදිනට පැවැති සමස්ථ ප්‍රාග්ධනය රු. 4,343,236,531 ක් ලෙස පමණක් වාර්තා වෙයි.

12. සමාලෝචනයට ලක් වන කාල සීමාව තුළ පොදු ලෙජරය සහ වර්ෂයට අදලව සපයන ලද සහ ඉතුරුම් සහ ස්ථාවර තැන්පතු ලේඛන අතර රු. 625,761 ක වෙනසක් නිරීක්ෂණය විය.

13. ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම්වලට අදාළව ලබා දී ඇති උපලේඛනය සහ පෙදු ලෙජරය අතර රු. 670,430 ක සැසඳීමට ලක් නොකරන ලද වෙනසක් නිරීක්ෂණය විය.

### තත්වාගණනය කළ මතය

ඉහත 1 සිට 13 දක්වා වැකි මගින් දැක්වෙන තත්වාගණනය කළ මතය සඳහා පදනමෙහි සඳහන් කරුණු නිසා ඇති විය හැකි ප්‍රතිඵල හැරුණුකොට 2015 දෙසැම්බර් 31 න් අවසන් වූ ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන මගින් බැංකුවේ මූල්‍ය තත්ත්වය, එහි මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහය පිළිබඳ සත්‍ය හා සාධාරණ මතයක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ඉදිරිපත් වෙන බව මා දරන්නා වූ මතය වේ.

### අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පණතේ 163(2) වගන්තියේ අවශ්‍යතා පරිදි මා විසින් පහත දරුණු දක්වනු ලැබේ:

අ). මෙම විගණන කටයුත්ත සඳහා යොදා ගෙන ඇති පදනම, එහි පරාසය සහ සීමාවන් ඉහත සඳහන් කර ඇත.

AGDSL

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

ආ). අවශ්‍ය බවට තීරණය කෙරුණු අවස්ථාවලදී සිදු කරන ලද ගැලපුම්වල ප්‍රතිඵල හැරුණු කොට, ඉහත දක්වා ඇති තත්වාගණනය කළ මතය සඳහා පදනමේ සඳහන් කරුණුවලට අදාළව සතුටුදායක මට්ටමක ඇති බව මාගේ මතය වේ.

මාගේ විමර්ශනයට පෙනී යන පරිදි විගණනය සඳහා අවශ්‍ය සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගෙන ඇති අතර විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ගැනීමට සමාගමට හැකිවී ඇත.

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සමාගම් පනතේ 151 වගන්තියේ විධිවිධානවලට අනුකූලව පිළියෙළ කර ඇත.

**එච්. එම්. ගාමිණී විජේසිංහ**

විගණකාධිපති

# මූල්‍ය ප්‍රකාශන

## ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව

2015 දෙසැම්බර් 31 න් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා

## ආදායම් ප්‍රකාශනය

| | සටහන | 2015 (රු.) | 2014 (රු.) |
|---|---|---|---|
| පොලී ආදායම | | 676,168,543 | 710,501,691 |
| පොලී වියදම් | | (147,622,445) | (183,376,492) |
| **ශුද්ධ පොලී ආදායම** | **5** | **528,546,098** | **527,125,199** |
| ගාස්තු හා කොමිස් ආදායම | | 3,261,068 | 1,847,405 |
| ගාස්තු හා කොමිස් වියදම් | | (12,629,571) | (8,101,481) |
| **ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම / වියදම** | **6** | **(9,368,504)** | **(6,254,076)** |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ) | 7 | 66,765,800 | 84,049,886 |
| **මුළු මෙහෙයුම් ආදායම** | | **585,943,395** | **604,921,009** |
| අපහායන (ගාස්තු)/ණය හා අනෙකුත් අලාභ කපා හැරීම | 8 | 75,585,703 | (167,167,519) |
| **ශුද්ධ මෙහෙයුම් ආදායම** | | **661,529,098** | **437,753,490** |
| පුද්ගල වියදම් | 9 | (101,151,110) | (63,862,170) |
| වෙනත් වියදම් | 10 | (87,977,418) | (96,278,446) |
| **එකතු කළ අගය මත බදුවලට පෙර මෙහෙයුම් ලාභය** | | **472,400,570** | **277,612,874** |
| මූල්‍ය සේවා සඳහා එකතු කළ අගය මත බද්ද | | (40,118,004) | (9,927,169) |
| **එකතු කළ අගය මත බදුවලට පසු මෙහෙයුම් ලාභය** | | **432,282,566** | **267,685,705** |
| ආදායම් බදු වියදම් | 11 | - | (32,830,793) |
| **මූල්‍ය වර්ෂය සඳහා ලාභය** | | **432,282,566** | **234,854,912** |
| කොටසකට මූලික ඉපැයීම | 12 | 94 | 51 |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 40 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංගෘහිත කොටසකි.

**ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව**

2015 දෙසැම්බර් 31 න් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා

# විස්තීර්ණ ආදායම් **ප්‍රකාශනය**

| | සටහන | 2015 (රු.) | 2014 (රු.) |
|---|---|---|---|
| **මූල්‍ය වර්ෂය සඳහා ලාභය** | | **432,282,566** | **234,854,912** |
| අනෙකුත් විස්තීර්ණ ආදායම්/(වියදම්) බදු පසු ශුද්ධ අගය | | | |
| විකිණීම සඳහා සූදානම් මූල්‍ය වත්කම් මත උපදින ලාභ/(අලාභ) | | 7,412,037 | 73,251,561 |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම මත ආයුගණක අලාභය | | - | (247,233) |
| වර්ෂයේ අනෙකුත් විස්තීර්ණ ආදායම් | | 7,412,037 | 73,004,328 |
| **වර්ෂයේ සමස්ථ විස්තීර්ණ ආදායම** | | **439,694,603** | **307,859,240** |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 40 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංගෘහිත කොටසකි.

## ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව

2015 දෙසැම්බර් 31 න් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | සටහන | 31.12.2015 රු. | 31.12.2014 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 13 | 40,461,924 | 17,059,329 |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 14 | 1,493,066,536 | 3,957,895,768 |
| බැංකුවල ඇති තැන්පතු | 15 | 3,822,054,468 | 2,048,619,529 |
| ණය සහ අනෙකුත් ගණුදෙනුකරුවන්ගෙන් අයවිය යුතු මුදල් | 16 | 2,763,400,258 | 2,042,343,113 |
| මූල්‍ය ආයෝජන - විකිණීම සඳහා සුදානම් | 17 | 192,722,864 | 185,125,289 |
| දේපළ පිරියත හා උපකරණ | 18 | 336,463,455 | 118,677,420 |
| අස්පෘශ්‍ය වත්කම් | 19 | 587,136 | 4,370,000 |
| ආයෝජන දේපල | 20 | 333,315,000 | 83,274,936 |
| වත්මන් බදු වත්කම් | 21 | - | 60,756,483 |
| වෙනත් වත්කම් | 22 | 192,617,138 | 161,716,476 |
| **මුළු වත්කම් ප්‍රමාණය** | | **9,174,688,778** | **8,679,838,343** |
| | | | |
| **වගකීම්** | | | |
| බැංකු වෙත ගෙවිය යුතු | 23 | 25,830,002 | 21,799,902 |
| වෙනත් ගණුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු | 24 | 907,707,043 | 1,192,188,476 |
| නිකුත් කරන ලද ණය සුරැකුම්පත් සහ වෙනත් ණය ගැනීම් | 25 | 3,123,338,953 | 3,111,104,464 |
| වත්මන් බදු වගකීම් | 26 | - | 22,830,793 |
| වෙනත් වගකීම් | 27 | 773,989,113 | 318,463,646 |
| **මුළු වගකීම්** | | **4,830,865,111** | **4,666,387,281** |
| | | | |
| **හිමිකරු ප්‍රාග්ධනය** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය/පැවරූ ප්‍රාග්ධනය | 28 | 3,443,290,302 | 3,440,679,279 |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | 29 | 139,871,220 | 118,257,093 |
| ආයෝජන හා අරමුදල් ගිණුම් | 30 | - | - |
| රඳවාගත් ඉපයීම් | 31 | 2,315,832,215 | 2,485,118,287 |
| වෙනත් සංචිත | 32 | (1,555,170,071) | (2,030,603,597) |
| **මුළු හිමිකරු ප්‍රාග්ධනය** | | **4,343,823,667** | **4,013,451,062** |
| **මුළු හිමිකරු ප්‍රාග්ධනය සහ වගකීම්** | | **9,174,688,778** | **8,679,838,343** |
| | | | |
| බැඳීම් සහ අසම්භාව්‍යයන් | | 5,500,000 | 5,500,000 |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 40 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංගෘහිත කොටසකි.

ඉහත මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පණතේ විධිවිධානවලට අනුව පිළියෙළ කර ඇති බවට සහතික වෙමි.

**කේ.එන්.ඒ. දිසානායක මහතා**
ජ්‍යෙෂ්ඨ කළමනාකාර - මූල්‍ය හා සැලසුම්

**ඩබ්ලිව්. ඒ. යූ. බණ්ඩාර මහතා**
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී

ඉහත මූල්‍ය ප්‍රකාශන සැකසීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීමකි.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවට අත්සන් කළේ,

**කේ. අමරසිංහ මහතා**
වැඩබලන සභාපති (ක්‍රියාකාරී අධ්‍යක්ෂ)
2105.11.27

**සුනිල් විතාරණගේ මහතා**
අධ්‍යක්ෂ
2105.11.27

**ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව**

2015 දෙසැම්බර් 31 න් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා

# හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය/පැවරූ ප්‍රාග්ධනය | | සංචිත | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | සාමාන්‍ය කොටස් (රු) | නිකුත් කළ යුතු ප්‍රාග්ධන කොටස | පවරාගැනීමට පෙර ආදායම් හිඟය (රු) | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල (රු) | ආයෝජන අරමුදල (රු) | විකිණීම සඳහා ඇති සංචිත අරමුදල (රු) | ප්‍රත්‍යාගනන සංචිත (රු) | ආදායම් සංචිත (රු) | මුළු හිමිකම් වටිනාකම |
| 2014.01.01 දිනට ශේෂය | 458,446,600 | 2,982,232,679 | (2,166,190,408) | 106,514,347 | 106,226,336 | 62,335,250 | - | 2,283,772,109 | 3,833,336,912 |
| සැසඳීමට ලක් නොකළ වෙනස | - | - | - | - | - | - | - | (27,745,091) | (27,745,091) |
| මූල්‍ය වසර සඳහා ලාභය | - | - | - | - | - | - | - | 234,854,912 | 234,854,912 |
| අනෙකුත් විස්තීර්ණ ආදායම් | - | - | - | - | - | - | - | - | - |
| ආයෝජන අරමුදල් ගිණුමට මාරු කිරීම් | - | - | - | - | (106,226,336) | - | - | 106,226,336 | - |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණක අලාභ | - | - | - | - | - | - | - | (247,233) | (247,233) |
| සාධාරණ අගය වෙනස්වීම් | - | - | - | - | - | 73,251,561 | - | - | 73,251,561 |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදලට මාරු කිරීම් | - | - | - | 11,742,746 | - | - | - | (11,742,746) | - |
| කාර්ය මණ්ඩල නිවාස ණය සංචිතය | - | - | - | - | - | - | | (100,000,000) | (100,000,000) |
| **2014.12.31 දිනට ශේෂය** | **458,446,600** | **2,982,232,679** | **(2,166,190,408)** | **118,257,092** | **-** | **135,586,811** | **-** | **2,485,118,287** | **4,013,451,061** |
| | | | | | | | | | |
| **2015.01.01 දිනට ශේෂය** | **458,446,600** | **2,982,232,679** | **(2,166,190,408)** | **118,257,092** | **-** | **135,586,811** | **7,477,405** | **2,477,640,882** | **4,013,451,061** |
| ඌන/අධි ප්‍රතිපාදන | - | - | - | - | - | - | - | (572,477,105) | (572,477,105) |
| මූල්‍ය වසර සඳහා ලාභය | - | - | - | - | - | - | - | 432,282,566 | 432,282,566 |
| ආයෝජන අරමුදල් ගිණුමට මාරු කිරීම් | - | - | - | - | - | - | - | - | - |
| සාධාරණ අගයෙහි වෙනස්වීම් | - | - | - | - | - | 7,412,037 | - | - | 7,412,037 |
| නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම මත සත්‍ය ලාභය | - | - | - | - | - | - | - | - | - |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදලට මාරු කිරීම් | - | - | - | 21,614,128 | - | - | - | (21,614,128) | - |
| ප්‍රත්‍යාගනන ලාභ | - | 2,611,023 | - | - | - | - | 460,544,084 | - | 463,155,108 |
| **2015.12.31 ට ශේෂය** | **458,446,600** | **2,984,843,702** | **(2,166,190,408)** | **139,871,220** | **-** | **142,998,848** | **468,021,489** | **2,315,832,215** | **4,343,823,667** |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 40 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංගෘහිත කොටසකි.

LKAS 01 අදල අනාවරණය සටහන් 28 සිට 32 දක්වා පෙන්වා ඇත.

ඌන/අධි ප්‍රතිපාදන තුළ රු.454,275,540/- අතිරේක බදු ප්‍රතිපාදන හා කල්බදු නැවත ක්‍රියාත්මක කිරීමේ ලාභ ඇතුලත්වේ.

## ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව

2015 දෙසැම්බර් 31 න් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහන | 31.12.2015 රු. | 31.12.2014 රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරීත්වයෙන් ජනිත වූ මුදල් ප්‍රවාහ** | | | |
| බදුවලට පෙර ලාභය | | 432,282,566 | 267,685,705 |
| | | | |
| ගැලපුම්: | | | |
| පෙර වසරේ ගැලපුම් | 31 | (579,954,510) | (27,745,091) |
| දෝෂ නිවැරදි කිරීම | | | |
| ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම් | | | |
| බදුවලට පෙර ලාභයෙහි ඇතුළත් මුදල් නොවන අයිතම | 37 | (65,529,274) | 158,718,046 |
| මෙහෙයුම් වත්කම් ආශ්‍රිත වෙනස්කම් | 38 | 79,581,099 | (925,651,898) |
| මෙහෙයුම් වගකීම් ආශ්‍රිත වෙනස්කම් | 39 | 183,604,502 | 508,452,413 |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වලට දායකත්වය | 27.6 | - | (821,957) |
| ගෙවන ලද බදු | 26 | (5,943,598) | (10,000,000) |
| **මෙහෙයුම් ක්‍රියාකාරීත්වයෙන් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **44,040,785** | **(29,362,782)** |
| | | | |
| **ආයෝජන ක්‍රියාකාරීත්වයෙන් ජනිත වූ මුදල් ප්‍රවාහ** | | | |
| දේපල, පිරියත සහ උපකරණ මිලදී ගැනීම | 18.1 | (26,788,790) | (20,391,485) |
| අස්පෘශ්‍ය වත්කම් | 19.0 | - | - |
| ආයෝජන වත්කම් | 20.0 | - | - |
| දේපල, පිරියත සහ උපකරණ විකිණීම මත | 7.0 | 2,120,500 | 181,215 |
| **ආයෝජන ක්‍රියාකාරීත්වයෙන් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(24,668,290)** | **(20,210,270)** |
| | | | |
| **මුදල් හා මුදල් සමාන දෑ ආශ්‍රිත ශුද්ධ ඉහළ/ පහල යාම** | | **19,372,495** | **(49,573,052)** |
| වසර ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ | | (4,740,573) | 44,832,479 |
| **වසර අවසානය වන විට මුදල් හා මුදල් සමාන දෑ** | 40 | **14,631,922** | **(4,740,572)** |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 40 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංගෘහිත කොටසකි.

ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව

2015 දෙසැම්බර් 31 න් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා

# වැදගත් **ගිණුම්කරණ ප්‍රතිපත්තිවල** සාරාංශය

## 1. ආයතනික තොරතුරු

### 1. 1 සාමාන්‍ය කරුණු

ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව, 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ කොළඹදී සංස්ථාපිත කරන ලද සීමිත වගකීම් සමාග මක් වන අතර 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ 2008 සැප්තැම්බර් මාසයේදී නැවත ලියාපදිංචි කරන ලදි. එය, 1988 අංක 30 දරණ බැංකු පනත යටතේ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වශයෙන් ලියාපදිංචි කරන ලදී. අංක 265, වෝඩ් පෙදෙස, කොළඹ 07 දරන ස්ථානයෙහි ලියාපදිංචි ප්‍රධාන කාර්යාලය පිහිටුවා ඇති මෙම බැංකුවේ ශාඛා මන්නාරම, මාතර, අනුරාධපුර සහ බොරැල්ල යන ප්‍රදේශවල පිහිටා තිබේ.

### 1.2 මූලික ක්‍රියාකාරකම් හා මෙහෙයුම්වල ස්වභාවය

මෙහි සමාලෝචනයට ලක් වන කාල සීමාව තුළ බැංකුව විසින් සිදු කරන ලද ප්‍රධාන ව්‍යාපාරික කටයුතු වශයෙන් ඉතුරුම් සහ කාලීන තැන්පතු භාර ගැනීම, ණය ලබා දීම, ලීසිං, කුලී සින්නක්කර, උකස් කටයුතු හා අනෙකුත් ණය පහසුකම් සහ ප්‍රමුඛ ඉතුරුම් හා සංර්ධන බැංකුවේ ණය ගිණුම් ප්‍රතිව්‍යුහගත කිරීමෙන් අනතුරුව එහි තැන්පතු වගකීම් පියවීම ආදිය සඳහන් කළ හැක.

### 1.3 ගිණුම් ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය පැවරූ දිනය

පවතින ගිණුම්කරණ ප්‍රතිපත්ති වල වලංගුතාවය 2015.1.1 දින සිට බල පැවැත්වෙන අතර එහි වලංගුතාවය අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය මත වෙනස් වේ.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ පදනම

### 2.1 අනුකූලතා ප්‍රකාශනය

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන (මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, විස්තීරණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සමග ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන්) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRS සහ LKAS) අනුව, දේපල, පිරියත හා උපකරණවලට අදාළව 3.3.1 හා 3.3.3 සටහනෙහි දක්වා ඇති අනනුකූලතාව පිළිබඳ කරුණු හැරුණු විට 1988 අංක 30 දරන බැංකු පනතේ විධිවිධානවලට අනුකූල වන පරිදි සකස් කර ඇත.

### 2.2 මිනුම්ගත කිරීමේ පදනම

මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශනයේ ඇතුළත් පහත අයිතම හැරුණු විට අනිකුත් සියලුම මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙළ කර ඇත.

- විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් එහි වෙළෙඳපොල වටිනාකමට අනුව ගණන් බලා ඇත.
- නිශ්චිත ප්‍රතිලාභ ගෙවීමේ වගකීම, එහි වත්මන් අගයට අනුව දක්වා ඇත.

### 2.3 ව්‍යවහාරික හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

බැංකුවේ ව්‍යවහාරික හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වටිනාකමෙන් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

## 2.4 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

බැංකුවේ මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශයේ අයිතම, පුළුල් වශයෙන් ඒවායේ ද්‍රවශීලතාවය මත ඉදිරිපත් කර ඇත.

## 2.5 අදාළත්වය හා සමාහාරය

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 ට අනුකූලව සමාන ප්‍රමාණාත්මක අයිතමවල සෑම අදාළ කාණ්ඩයක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කර ඇති අතර ප්‍රමාණාත්මක වන්නේ නම් අසමාන ස්වභාවයේ අයිතම හා ක්‍රියාකාරීත්වයන්ද වෙන වෙනම ඉදිරිපත් කර ඇත. මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කර මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශනයේ ශුද්ධ වටිනාකම වාර්තා කර ඇත්තේ, හඳුනාගත් වටිනාකම් හිලව් කිරීම සඳහා නෛතික වශයෙන් බලාත්මක අයිතියක් ඇත්නම් සහ ශුද්ධ පදනමින් හිලව් කිරීමේ අපේක්ෂාවක් හෝ වත්කම් හඳුනාගැනීම හා වගකීම් පියවීම සමගාමීව සිදු කරන්නේ නම් පමණි. කුමන හෝ ගිණුම්කරණ ප්‍රතිපත්තියකින් හෝ අර්ථ දැක්වීමකින් අනුමත කර හෝ අවශ්‍යතාවයක් ලෙස දක්වා ඇත්නම් සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති මගින් නිශ්චිතව දක්වා ඇති විටදී හැර සාමාන්‍යයෙන් ආදායම් සහ වියදම් ආදායම් ප්‍රකාශය තුළ හිලව් කරනු නොලැබේ.

## 2.6 සන්සන්දනාත්මක තොරතුරු

අදාළ වර්ෂයේ ඉදිරිපත් කිරීමට අනුකූලතාව දැක්වීම සඳහා අවශ්‍ය සෑම විටම පාහේ සන්සන්දනාත්මක තොරතුරු නැවත වර්ගීකරණය කරනු ලැබේ.

## 2.7 වැදගත් ගිණුම්කරණ තීන්දු, තක්සේරු කිරීම් හා උපකල්පන භාවිත කිරීම

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සහ ඇතැම් ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීම සඳහා අභිමතානුසාරී තීන්දු තීරණ හා උපකල්පන භාවිතයට ගැනීම අවශ්‍ය වන අතර ඒවායෙහි ඇති අවිනිශ්චිතතාව නිසාම වෙනස් වන සුළු වේ.

උපකල්පනවල ඇති අවිනිශ්චිතතාවය නිසා අනාගත කාල සීමා සඳහා ඉදිරියට ගෙන යනු ලබන ශේෂයන්ගේ සුවිශේෂී ගැලපුම් සිදුකිරීමේ අවශ්‍යතාව පැනනැගීමට ඉඩ ඇත.

බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ ක්‍රියාවලියේදී මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම් සඳහා සුවිශේෂී බලපෑමක් කරනු සමත් පහත දැක්වෙන තීරණ, නිශ්චය කිරීම් සහ උපකල්පන කළමනාකාරීත්වය විසින් සිදු කර ඇත:

### I. දේපල හා උපකරණවල ඵලදායී ජීව කාලය

බැංකුව විසින් සෑම වාර්තා කිරීමේ දිනයකදීම දේපළ හා උපකරණවල පැවැති ඉතිරි වටිනාකම, ඵලදායී ජීව කාලය සහ ක්ෂය කිරීමේ ක්‍රමවේදය විවරණය කරනු ලබයි. එමෙන්ම මෙම වටිනාකම්, අනුපාත හා ක්‍රමවේද නිශ්චය කිරීම තුළින් කළමනාකාරීත්වය විසින් තීරණ ගැනීම සිදු කරනු ලබන අතර එම නිසාම ඒවා අවිනිශ්චිතතාවයෙන් යුක්ත වේ.

### II. අඛණ්ඩ පැවැත්ම

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අඛණ්ඩව ඉදිරියට ක්‍රියාත්මක වීමට බැංකුවට ඇති හැකියාව පිළිබඳව ඇගයීමක් සිදු කරන ලද අතර ඒ අනුව පෙර දැකිය හැකි අනාගත කාලයක් සඳහා ව්‍යාපාර කටයුතු කරගෙන යාමට අවශ්‍ය සම්පත් බැංකුව සතු බවට සෑහීමකට පත් වී තිබේ. එසේම, බැංකුවේ අඛණ්ඩ පැවැත්ම සැකයට ලක් කරන සැලකිය යුතු අවිනිශ්චිතතාවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හඳුනාගෙන නොමැති අතර එම නිසා බැංකුව ඈවර කිරීමේ හෝ එහි මෙහෙයුම් කටයුතු නැවැත්වීමට අපේක්ෂා නොකරයි. එම නිසා බැංකුවේ මූල්‍ය ප්‍රකාශනද අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙළ කරනු ලැබේ.

### III. ණය සහ අත්තිකාරම් අපහායන අලාභ

බැංකු සමාගම විසින් සෑම වාර්තා කිරීමේ දිනයකදීම හෝ එයටත් අඩු කාලයකට වරක්, තම විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ ණය හානි අලාභයක් වාර්තා කිරීමට සිදු වන කිසියම් පැහැදිලි සාක්ෂියක් පවතින්නේදැයි සොයා බැලීම සඳහා ඇගයීමක් සිදුකරනු ලබයි. ඒ අනුව, තනි තනිව සුවිශේෂී වන මූල්‍ය වත්කම් සඳහා තනි තනිව ඇගයීම් සිදු කරනු ලබන අතර තනි තනිව සුවිශේෂී නොවන වත්කම් සඳහා සාමූහිකව ඇගයීම් කරනු ලැබේ. කෙසේ වෙතත් වත්කම් වර්ගීකරණයට සහ හානි අලාභ නිශ්චය කිරීම සඳහා කළමනාකරණ තීන්දුවක් අවශ්‍ය වේ. මෙම නිශ්චය කිරීමේ ක්‍රමවේද, සාධක රැසක් සළකා සිදුකරන උපකල්පන මත පදනම්ව තීරණය කෙරෙන අතර ඒ නිසාම අනාගතයේදී සත්‍ය වශයෙන්ම සිදුවන හානි අලාභ මෙයින් වෙනස් විය හැක. එවිට අදාළ ගැලපුම් සිදු කිරීම අවශ්‍ය වේ.

### IV. විකිණීම සඳහා ඇති ආයෝජන අපහායනය වීම

බැංකුව විසින් විකිණීමට ඇති ආයෝජනවල සාධාරණ වෙළෙඳ වටිනාකම, ඒවායේ පිරිවැයටත් වඩා සුවිශේෂීව හෝ කාලයක් පුරා පහත යන විට ඒවා සම්බන්ධයෙන් හානි වෙන් කිරීම් වාර්තා කරනු ලබයි. බැංකුව විසින් මෙම තීරණය ගැනීමේදී බලපානු ලබන වෙනත් සාධක සමග ඓතිහාසික කොටස් මිල උච්ඡාවචනයන් සහ ආයෝජනයක සාධාරණ වෙළඳ වටිනාකම එහි පිරිවැයට වඩා පහත බැසීමට ගිය කාලය සහ පරාසයද ඇගයීමට ලක් කරනු ලැබේ.

### V. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය, (නිද : පාරිතෝෂික) ආයුගණක තක්සේරු කිරීම් භාවිතයෙන් තීරණය කරනු ලබයි. මෙම ආයුගණක තක්සේරුකරණය සඳහා වට්ටම් අනුපාත, වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාත, අනාගත වැටුප් වර්ධක සහ මරණ අනුපාතික පිළිබඳව සිදු කරනු ලබන උපකල්පන අදාළ කර ගැනේ. මෙම සැලසුම්වල දීර්ඝ කාලීන ස්වභාවය නිසාම, එයට අදාළ නිශ්චය කිරීම් සුවිශේෂී අවිනිශ්චිතතාවයකින් යුක්ත වේ.

## 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

බැංකුව විසින් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ කර ගන්නා ලද සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පහත දක්වා ඇත. එකී ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙහි ඇතුළත් කර ඇති සියලුම කාලච්ඡේද සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ඒකමතිකව අදාළ කරගෙන තිබේ.

### 3.1 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමානකවලට, අතැති මුදල්, බැංකු ශේෂ හා කෙටි දැනුම් දීමකින් ලබා ගත හැකි මුදල් ඇතුළත් වේ. කෙසේ වෙතත් මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේදී, ඉහත අර්ථ දක්වා ඇති පරිදි මුදල් හා මුදල් සමානකවලට මුදල් සහ කෙටි කාලීන තැන්පතු ඇතුළත් කර තිබේ.

### 3.2 මූල්‍යමය වත්කම් - හඳුනා ගැනීම හා මිනුම්ගත කිරීම

#### 3.2.1 හඳුනා ගන්නා ලද දිනය

සියලුම මූල්‍ය වත්කම් ඒවායේ වෙළඳ දිනයේදී මූලිකව හඳුනා ගැනේ. එනම් අදාළ මූල්‍ය උපකරණයේ ගිවිසුම්ගත විධිවිධානවල පාර්ශ්වකරුවකු බවට බැංකුව පත්වන දිනයයි. මේ සඳහා සාමාන්‍ය ආකාරයේ වෙළෙඳාම් ඇතුළත් වේ. වෙළෙඳපළ ස්ථානයේදී සාමාන්‍යයෙන් ඇතිකර ගනු ලබන රෙගුලාසි හා සම්මුති මගින් දැක්වෙන කාල රාමුව තුළ වත්කම් ගෙනැවිත් දීමට අවශ්‍ය මූල්‍ය වත්කම් මිලදී ගැනීම හෝ විකිණීම.

#### 3.2.2 මූල්‍ය උපකරණවල ආරම්භක තක්සේරුව

මූලික හඳුනා ගැනීමේදී මූල්‍ය උපකරණ ආශ්‍රිතව සිදු කරනු ලබන වර්ගීකරණය, ඒවායේ අරමුණු හා ලක්ෂණ මෙන්ම එම උපකරණ අත්පත් කර ගැනීම සඳහා කළමනාකාරීත්වය සතු අපේක්ෂාව මත තීරණය වේ. එමෙන්ම මූල්‍ය වත්කම් හා වගකීම් , ලාභ හෝ අලාභ මත සාධාරණ වෙළෙඳ වටිනාකමට වාර්තා කර ඇති අවස්ථාවලදී හැර සියලුම මූල්‍ය උපකරණ ඒවායේ සාධාරණ වෙළෙඳ වටිනාකමට, ගනුදෙනු පිරිවැය එකතු කිරීමෙන් ලැබෙන වටිනාකම මත මූලිකව මිනුම්ගත කරනු ලැබේ.

#### 3.2.3 ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්

බැංකුව විසින් කල් පිරෙන තුරු රඳවා සිටින ආයෝජන, ණය හා අයවිය යුතු සහ විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් යන පහත කාණ්ඩ තුන යටතේ ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් හඳුනා ගනු ලබයි.

### I. කල් පිරෙන තුරු රඳවා සිටින මූල්‍ය ආයෝජනය

කල් පිරෙන තුරු රඳවා සිටින මූල්‍ය ආයෝජන යනු ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහ ස්ථාවර කල් පිරීමක් ඇති ව්‍යුත්පන්න නොවන මූල්‍යමය වත්කම්ය. එමෙන්ම, බැංකුවට මෙම වත්කම් කල් පිරීම දක්වා රඳවා ගැනීමේ අභිලාෂයක් මෙන්ම හැකියාවක්ද තිබිය යුතුයි. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව කල් පිරීමට හරින ලද මූල්‍යමය ආයෝජන, ක්‍රමක්ෂය පිරිවැයට එලදායී පොලී අනුපාතයෙන් හානි වීම් අඩු කිරීමේ ක්‍රමය යොදාගෙන මිනුම්ගත කරනු ලැබේ. මෙහිදී ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ මෙම වත්කම් අත්පත් කර ගැනීමේදී ගෙවූ වාරික හෝ හිමිවූ වට්ටම් සහ එලදායී පොලී අනුපාතයේ අන්තර්ගත

අංගයක් වන ගාස්තු සැලකිල්ලට ගනිමිනි. මෙම ක්‍රමක්ෂය වට්නාකම ආදායම් ප්‍රකාශනයේ "පොලී ආදායම" යටතේ ඇතුළත් කර ඇත. මෙවැනි ආයෝජන සම්බන්ධයෙන් කිසියම් හානි වීමක් සිදු වන්නේ නම් එය විස්තීරණ ආදායම් ප්‍රකාශය මගින් හඳුනා ගැනේ.

යම් හෙයකින් බැංකුවට කල් පිරීමට හරින ලද ආයෝජනයන් කල් පිරීමට පෙර විකිණීමට හෝ සුවිශේෂී නොවන වට්නාකමකට වඩා වැඩියෙන් යළි වර්ගීකරණය කිරීමට අවශ්‍ය වන්නේ නම් (යම් නිශ්චිත තත්ත්වයක් යටතේදී හැර), මුළු කාණ්ඩයම කපා හැර විකිණීමට ඇති ආයෝජන ලෙස යළි වර්ගීකරණය කළ යුතුය. තවදුරටත් බැංකුවට කුමන හෝ මූල්‍ය වත්කමක් ඉදිරි දෙවර්ෂය තුළදී කල් පිරීමට හරින ලද ආයෝජන ලෙස වර්ගීකරණය කිරීම තහනම් වේ.

## II. ණය හා ගනුදෙනුකරුවන්ගෙන් අයවිය යුතු වට්නාකම්

ණය හා ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු වට්නාකම්වලට පහත දැක්වෙන කරුණු හැර ස්ථාවර හා ක්‍රියාකාරී වෙළෙඳපොලේ ලැයිස්තුගත කර නැති තීරණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍යමය වත්කම් ඇතුළත් වේ:

- බැංකුව විසින් ක්ෂණිකව හෝ නුදුරු අනාගතයේදී විකණීමට අපේක්ෂිත වට්නාකම් හෝ මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගය මත පත් කරන ලද වට්නාකම්,

- බැංකුව විසින් මූලික හඳුනා ගැනීමෙන් පසුව විකිණීමට ඇති වට්නාකම් ලෙස සලකනු ලබන වට්නාකම්.

- ණය අවප්‍රමාණ වීමේ හේතුව හැරුණු කොට බැංකුවට සිය මුළු මූලික ආයෝජනයම ශක්තිමත් ලෙස අයකර ගත නොහැකි වීමේ ඉඩකඩ ඇති වට්නාකම්

ණය හා පාරිභෝගිකයන්ගෙන් ලැබිය යුතු වට්නාකම්, ඒවායේ මූලික මිණුම්කරණයෙන් පසුව සඵලදායී පොලී අනුපාතයෙන් හානිවීම් අඩු කිරීමේ ක්‍රමය (EIR) යොදාගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට ද මිනුම්ගත කරනු ලැබේ. මෙහිදී ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරන්නේ මෙම වත්කම් අත්පත් කර ගැනීමේදී ගෙවූ වාරික හෝ හිමිවූ වට්ටම් සහ සඵලදායී පොලී අනුපාතයේ අන්තර්ගත අංගයක් වන ගාස්තු හා පිරිවැය සැලකිල්ලට ගනිමිනි. මෙම ක්‍රමක්ෂය වට්නාකම ආදායම් ප්‍රකාශනයේ පොලී ආදායම යටතේ ඇතුළත් කර ඇත. මේ සම්බන්ධයෙන් වන අපහායන නිසා ඇතිවන අලාභයන් ආදායම් ප්‍රකාශනයේ ණය හා ලැබිය යුතු වට්නාකම් හානි වීමේ ලාභ/(අලාභ) යටතේ හඳුනා ගැනේ.

බැංකුව විසින් ගනුදෙනුකරුගේ ණය පහත හෙළීම මත වෙළඳාම සඳහා හරින ලද වට්නාකම් ලෙස වර්ගීකරණය කිරීමට අපේක්ෂා කරන බැවින් ඇතැම්විට කිසියම් ණයදීමේ බැඳීමකට ඇතුළත් වනු ඇත. මෙයට හේතුව වන්නේ මෙම ණය කෙටි කාලයේදී විකිණීමට අපේක්ෂා කිරීමයි. මෙම ණය දීමට ඇති බැඳීම් ව්‍යුත්පන්නතා ලෙස වාර්තා කරනු ලබන අතර ලාභ හෝ අලාභ මත සාධාරණ වෙළඳ වට්නාකමට මනිනු ලැබේ. මෙම ණය මුදල ගිණුම් මාරු කිරීම මත බැංකුවේ රඳවා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් සහ කෙටි කාලයේදී අලෙවි නොකරනු ලබන්නේ නම් අදාළ බැඳීම වාර්තා කරනු ලබන්නේ, අලාභයක් උද්ගත කිරීමේ හැකියාවක් ඇති ගැටළු සහිත කොන්ත්‍රාත් ගිවිසුමක් නම් පමණි.

## III. විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන

විකිණීමට ඇති මූල්‍යමය ආයෝජනවලට හිමිකම් සුරැකුම්පත් ඇතුළත් වේ. විකිණීමට ඇති ලෙස වර්ගීකරණය කර ඇති හිමිකම් ආයෝජන, වෙළෙඳාමට හරින ලද මෙන්ම ලාභය හෝ අලාභය මත සාධාරණ වෙළෙඳ වට්නාකමට පත් කරන ලද ආයෝජන ලෙස වර්ගීකරණය නොකළ ආයෝජන වේ. බැංකුව විසින් කිසිදු ණය මුදලක් හෝ ලැබිය යුතු වට්නාකමක් විකිණීමට ඇති ආයෝජන ලෙස නම්කර නොමැත.

මූලික මිණුම්කරණයෙන් අනතුරුව විකිණීමට ඇති මූල්‍යමය ආයෝජන නැවතත් සාධාරණ වෙළෙඳ වට්නාකමට මනිනු ලැබේ. නිෂ්කාශනය නොවූ ලාභ හා අලාභ, විකිණීමට ඇති සංචිතයේ ඇතුළත් හිමිකම් මගින් ඍජුව (වෙනත් විස්තීරණ ආදායම්) හඳුනා ගනියි. මෙම ආයෝජනය විකුණා අවසන් කළ පසු, එහි හිමිකම සම්බන්ධයෙන් පෙරදී හඳුනා ගනු ලැබූ සමුච්චිත ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශයේ "වෙනත් මෙහෙයුම් ආදායම්" යටතේ දැක්වේ.

## 3.2.4 මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කිරීම

මූලික හඳුනාගැනීමෙන් පසු ලාභ හෝ අලාභ මත සාධාරණ වෙළෙඳ වට්නාකමට පත් කරන ලද (FVTPL) මූල්‍යමය වත්කම් හැර ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් නිශ්චිත තත්ත්වයන් යටතේ යළි වර්ගීකරණය කිරීමට බැංකුව උත්සුක වීමට ඉඩ ඇත:

- විකිණීම සඳහා වෙන් කරන ලද කාණ්ඩයෙන් ඉවත් කර එම වත්කම් විකිණීමට ඇති කාණ්ඩයට, ණය හා ලැබිය යුතු වට්නාකම් කාණ්ඩයට හෝ කල් පිරීම සඳහා වෙන් කරන ලද කාණ්ඩයට මාරු කිරීම.

- විකිණීම සඳහා ඇති කාණ්ඩයෙන් ඉවත් කර ණය හා ලැබිය යුතු වට්නාකම් කාණ්ඩයට හෝ කල් පිරෙන තුරු රඳවා තබන ලද කාණ්ඩයට මාරු කිරීම. මෙම යළි වර්ගීකරණයෙන්, එසේ වර්ගීකරණය කරන ලද දිනට පැවති සාධාරණ වෙළෙඳ වට්නාකමට වාර්තා කරනු ලබන අතර එම වට්නාකම වත්කමේ නව ක්‍රමක්ෂය කරන ලද පිරිවැය බවට පත්වේ.

- එමෙන්ම නව ක්‍රමක්ෂය කරන ලද පිරිවැය හා අපේක්ෂිත මූල්‍ය ප්‍රවාහ අතර යම් වෙනස්කමක් වෙතොත් , එම වට්නාකමද ඉතිරි ජීව කාලය මත පදනම්ව ඵලදායී පොලී අනුපාත ක්‍රමයට ක්‍රමක්ෂය කරයි. ඒත් සමගම යම්හෙයකින් මෙම වත්කම හානි වී ඇති බවට තීරණය කරනු ලැබුවහොත්, හිමිකම යටතේ වාර්තා කර ඇති වට්නාකම ආදායම් ප්‍රකාශනයට ප්‍රතිචක්‍රීකරණය කරනු ලැබේ.

- යම් වත්කමක්, ණය හා ලැබිය යුතු වටිනාකම් සඳහා ඇති නිර්වචනය සමග සමපාත වන්නේ නම් සහ එම මූල්‍යමය වත්කම පෙර දැකිය හැකි අනාගත කාලයක් හෝ කල්පිරෙන තෙක් රඳවා ගැනීමේ අපේක්ෂාව හා හැකියාව බැංකුව සතු නම්, එය වෙළෙඳාමට හරින ලද කාණ්ඩයෙන් ඉවත් කර ණය හා ලැබිය යුතු වටිනාකම් කාණ්ඩයට ඇතුළත් කරනු ලැබේ. එමෙන්ම යම් මූල්‍යමය වත්කමක් යළි වර්ගීකරණය කරනු ලැබේ නම් සහ එම වත්කමේ මුදල් ලැබීම් ආවරණය කරගැනීමේ හැකියාව වර්ධනයවීමේ ප්‍රතිඵලයක් වශයෙන් බැංකුව විසින් එහි අනාගත මුදල් ලැබීම් තක්සේරුව වැඩි කරනු ලැබේ නම්, එම වර්ධනයේ බලපෑම තක්සේරුව වෙනස් කිරීමේ දින සිට සඵලදායී පොලී අනුපාතයට සිදු කළ ගැලපුමක් ලෙස හඳුනා ගැනේ.

- යළි වර්ගීකරණය, කළමනාකාරීත්වයේ තීරණය මත සිදු කරන අතර එය උපකරණ පදනමට අනුව යම් උපකරණයක් මත තීරණය කරනු ලබයි.

### 3.2.5 මූල්‍යමය වත්කම් බැහැර කිරීම

පහත දැක්වෙන අවස්ථාවලදී මූල්‍යමය වත්කමක (හෝ, අදාළ වන අවස්ථාවලදී මූල්‍යමය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍යමය වත්කම් කාණ්ඩයක කොටසක්) හඳුනාගැනීම ඉවත් කරයි:

- වත්කමක මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය කල් ඉකුත්වීම.

- බැංකුව විසින් වත්කමක මූල්‍ය ප්‍රවාහ ලැබීමේ අයිතිය මාරු කිරීම හෝ මාරු කර හැරීමේ වැඩපිළිවෙලක් යටතේ සැලකිය යුතු කාල පමාවකින් තොරව ලැබුණු මූල්‍ය ප්‍රවාහ තුන්වන පාර්ශ්වයකට ගෙවීමේ බැඳීමක් ඇතැයි උපකල්පනය කිරීම.

■ මේ යටතේ, බැංකුව විසින් වත්කමේ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ ශක්තිමත් ලෙස මාරුකිරීම

හෝ

■ බැංකුව විසින් වත්කමේ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ මාරු කිරීම මෙන්ම රඳවා ගෙන නොමැති වුවත් එම වත්කමේ පාලනය මාරු කිරීම.

බැංකුව විසින් යම් වත්කමකින් මූල්‍ය ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය මාරු කර ඇති විටකදී හෝ මාරු කර හැරීමේ වැඩපිළිවෙලකට ඇතුළත් වී ඇති විට සහ වත්කමේ සියලුම අවදානම් හා ප්‍රතිලාභ ශක්තිමත් ලෙස මාරු කර මෙන්ම රඳවාගෙන හා එහි පාලනය මාරු කර නොමැති විට ඒ පිළිබඳ බැංකුවේ අඛණ්ඩ මැදිහත්වීමේ උපරිමය දක්වා වත්කම හඳුනා ගැනේ. එවැනි අවස්ථාවකදී බැංකුව විසින් ආශ්‍රිත වගකීමක්ද හඳුනා ගනු ලැබේ. ඒ අනුව මාරු කරන ලද වත්කම සහ ආශ්‍රිත වගකීම, බැංකුව විසින් රඳවා ගනු ලැබූ අයිතීන් හා බැඳීම් පිළිබිඹු වන පදනමකට අනුව මිනුම්ගත කරනු ලැබේ. එමෙන්ම, මාරු කරන ලද වත්කමට අදාළ අඛණ්ඩ මැදහත්වීම ඇපකරයක ස්වරූපය ගන්නා අතර එය වත්කමේ ඉදිරියට ගෙන යාමේ සත්‍ය වටිනාකමට අඩුවෙන් සහ බැංකුවට නැවත ගෙවීමට අවශ්‍ය වන උපරිම සලකා බැලීමේ වටිනාකම මත මිනුම්ගත කරනු ලැබේ.

### 3.2.6 මූල්‍ය වත්කම් අපහායනය වීම

කිසියම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් අපහායනයට ලක් වී ඇති බවට කවර හෝ වාස්තවික සාක්ෂියක් තිබේද යන්න බැංකුව විසින් සෑම මූල්‍ය වාර්තා කිරීමේ සෑම දිනකදීම තක්සේරු කරනු ලබයි. මූල්‍යමය වත්කමක් හෝ මූල්‍යමය වත්කම්වලින් කොටසක් හානියට පත්වූ ලෙස සලකනු ලබන්නේ, මූලික හඳුනා ගැනීමෙන් පසු මෙම වත්කම හෝ වත්කම් සම්බන්ධයෙන් අලාභදායී තත්ත්වයක් උද්ගත වී ඇතැයි අරමුණුසහගත සාක්ෂි මඟින් පෙන්නුම් කරන විටදී සහ එම වත්කම/වත්කම් සම්බන්ධයෙන් විශ්වාසදායී ලෙස නිශ්චය කළ හැකි අනාගත මූල්‍ය ප්‍රවාහ සඳහා බලපෑමක් ඇති විටදීය.

කිසියම් ණයකරුවෙකු හෝ ණයකරුවන් සමූහයක් කැපී පෙනෙන මූල්‍ය දුෂ්කරතාවකට මුහුණ දීම, ඔවුන් වස්තු භංගත්වයට හෝ වෙනත් අහිතකර මූල්‍යමය ප්‍රතිසංවිධානයකට ලක් වීමේ ඉඩකඩ, පොලී හෝ මූලික ණය මුදල නැවත ගෙවීම පැහැර හැරීමට ඇති ඉඩ සහ තක්සේරු කරන ලද අනාගත මුදල් ප්‍රවාහයන්හි මිනුම්ගත කළ හැකි පහත බැසීමක් ඇති බවට නිරීක්ෂණය කළ හැකි දත්ත ඇසුරින් ගම්‍ය වීම යනාදිය අපහායන තත්ත්ව ඇති වීමට සාක්ෂි, උදාහරණ ලෙස දැක්විය හැක.

ක්‍රමක්ෂය වූ පිරිවැයක් යටතේ ඉදිරියට ගෙන යනු ලබන මූල්‍ය වත්කම් සඳහා (වෙනත් බැංකු සමග සිදු කරන තැන්පතු, ගනුදෙනුකරුවන් සඳහා ගෙවනු ලබන ණය හා අත්තිකාරම්, ලීසිං හා කුලී සින්නක්කර, අයවිය යුතු ගාස්තු සහ කල් පිරෙන තුරු රඳවා තබන ලද ආයෝජන ආදිය) බැංකුව විසින් පළමුව අපහායන සාක්ෂි අදාළ මූල්‍ය වත්කමට අදාළව තනි වශයෙන් පවතින්නේද නැතහොත් තනි වශයෙන් කැපී නොපෙනෙන මූල්‍ය වත්කම්වලට අදාළව සාමූහික වශයෙන් පවතින්නේද යන වග තක්සේරු කර බලනු ලබයි. තනිව තක්සේරු කරන ලද කිසියම් මූල්‍ය වත්කමකට අදාළව කිසිදු වාස්තවික අපහායන සාක්ෂියක් දක්නට නොලැබෙන බව බැංකුව හඳුනා ගන්නේ නම්, එවිට එකී මූල්‍ය වත්කම් සමාන හර ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් සමූහයක් තුළට ඇතුළත් කොට අනතුරුව එම සමූහය අපහායන සාක්ෂි සඳහා පරීක්ෂා කර බලයි. අපහායන සාක්ෂි සඳහා තනිව සලකා බලනු ලැබෙන හෝ අපහායන අලාභයක් සහිත වත්කම් හඳුනා ගැනීම සිදු කෙරුණද ඒවා සාමූහික අපහායන තක්සේරුවට ඇතුළත් නොකෙරේ.

අපහායනයක් හඳුනා ගැනීමෙන් අනතුරුව සිදු විය හැකි සිදුවීමක් හේතුවෙන් එකී අපහායන අලාභය ඉන් පසු වසරකදී ඉහළ හෝ පහළ යන්නේ නම්,ඉහත කී ප්‍රතිභාග ගිණුම නිසි පරිදි ගැලපීම මගින් අපහායන අලාභය වැඩි හෝ අඩු කිරීම සිදු කෙරේ. අනාගතයේදී ණය වටිනාකම් අහෝසි කිරීමක් ඉන් පසුව නැවත අයකර ගත හැකි නම්, එකී නැවත අයකර ගනු ලැබෙන වටිනාකම ''ණය හා අනෙකුත් අලාභ සඳහා වන අපහායන ගාස්තු'' වෙත හර කෙරේ.

තක්සේරු කරන ලද අනාගත මුදල් ප්‍රවාහයන්හි වත්මන් වටිනාකම අදාළ මූල්‍ය වත්කමෙහි සඵලදායී පොලී අනුපාතිකයට

වට්ටම් කරනු ලැබේ. කිසියම් ණය මුදලකට අදාළ පොලී අනුපාතය විචල්‍ය හෙවත් වෙනස් වන සුළු නම් ඊට අදාළ කවර හෝ අපහායනයක් මිනුම්ගත කිරීමේදී යොදා ගැනෙන වට්ටම් අනුපාතිකය වන්නේ වත්මන් සඵලදායී පොලී අනුපාතිකයයි.

අපහායනය සාමූහික වශයෙන් ඇගයීමට ලක් කිරීමේ අරමුණින් මූල්‍ය වත්කම්, වත්කම් වර්ගය, භූගෝලීය පිහිටීම, අතීත තත්ත්ව ඇතුළු අනෙකුත් අදාළ සාධක යොදා ගෙන ඒවාට අදාළ හර ලක්ෂණ සැලකිල්ලට ගනිමින් කාණ්ඩගත කරනු ලැබේ. සමාන හර අවදානමක් සහිත ණයවලට අදාළ අපහායන අලාභය සාමූහික පදනමක් මත හඳුනා ගනු පිණිස සංඛ්‍යාන ක්‍රමවේද භාවිත කරනු ලැබේ.

හිඟ මාස ගණන සැලකිල්ලට ගනිමින් විවිධ පරාස යටතේ ණය කාණ්ඩගත කරනු ලැබෙන අතර ඒ ඒ කාණ්ඩය තුළ ඇති ණය මුදල් ගෙවීම පැහැර හැරීමේ අදියර පසු කිරීමට ඇති ඉඩකඩ තක්සේරු කරනු සඳහා සංඛ්‍යාන විශ්ලේෂණ යොදා ගැනේ. එනම්:

- සමාන ණය අවදානම් කළඹ තුළ අතීත අලාභ අත්දැකීම් සහ
- මූල්‍ය තත්ත්ව වාර්තාකරණ දිනය වන විට පවතින සත්‍ය අලාභය අතීත අත්දැකීම් මත උපකල්පිත ප්‍රමාණයට වඩා වැඩි හෝ අඩු වීමට ඇති ඉඩකඩක් පවතින වත්මන් ආර්ථික හා ණය තත්ත්වයන් පිළිබඳ කළමනාකාරිත්ව නිර්ණය කිරීම්

## විකිණීම සඳහා ඇති මූල්‍ය උපකරණ අපහායනය

විකිණීම සඳහා ඇති මූල්‍ය උපකරණ වෙනුවෙන් බැංකුව සෑම මූල්‍ය තත්ත්ව වාර්තා කරන දිනයදීම, කිසියම් ආයෝජනයක් අපහායනයට ලක් වීමේ ඉඩකඩක් ඇතිද යන වග මැන බලයි. විකිණීම සඳහා ඇති ලෙස වර්ග කර ඇති බැර උපකරණවලට අදාළව බැංකුව විසින් තක්සේරු කරනු ලබන්නේ ක්‍රමක්ෂයට ලක් වූ පිරිවැය මත ඉදිරියට ගෙන යන ලද මූල්‍ය වත්කම් සඳහාම යොදා ගත් නිර්ණායක මත පදනම්ව අපහායන අවදානමක් ඇති බවට වාස්තවික සාක්ෂි තිබේද යන්නයි. කෙසේ වෙතත්, අපහායනය සඳහා වාර්තා වන වටිනාකම වන්නේ ක්‍රමක්ෂයට ලක් වූ පිරිවැය සහ වත්මන් සාධාරණ අගය අතර ඇති වෙනස ලෙසයි. අනාගත පොලී ආදායම, අඩු කරන ලද ඉදිරියට ගෙන යන වටිනාකම මත පදනම් වන අතර, අපහායන අලාභ මැනීමේ අරමුණින් අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීම සඳහා භාවිත කෙරෙන පොලී අනුපාතිකය ඇසුරින් එය රැස් කෙරේ.

පොලී ආදායම, 'පොලී හා සමාන ආදායමෙහි' කොටසක් ලෙස වාර්තා වේ. පසුකාලීනව කිසියම් ණය උපකරණයක සාධාරණ අගය ඉහළ යන්නේ නම් සහ එම ඉහළ යාම එහි අපහායන අලාභය මූල්‍ය ප්‍රකාශනයෙහි හඳුනා ගැනීමෙන් පසුව මතු වන ණය සිදුවීමක් වෙත වාස්තවිකව සම්බන්ධ කළ හැකි නම්, ආදායම් ප්‍රකාශනය හරහා එම අපහායන අලාභය වෙනස් කරනු ලැබේ.

විකිණීම සඳහා ඇති හිමිකරු ප්‍රාග්ධන ආයෝජනවලට අදාළ වාස්තවික සාක්ෂි වශයෙන් 'සුවිශේෂීව' සහ 'කාලයක් පුරාවට' සාධාරණ අගය පහත වැටීම සැලකිල්ලට ගත යුතු වෙයි. අපහායනයක් සිදු වීමට ඉඩ ඇති බවට සාධක පවතින සමුච්චිත අලාභය මනිනු ලබන්නේ අත්කර ගැනීමේ පිරිවැය සහ වත්මන් සාධාරණ වටිනාකම අතර වෙනස වශයෙනි. විකිණීමට ඇති හිමිකරු ප්‍රාග ්ධන ආයෝජන අපහානයට ලක්වීම්, ආදායම් ප්‍රකාශනය මගින් වෙනස් කිරීමට හැකි නොවේ. අපහායනය වීමෙන් අනතුරුව සාධාරණ වටිනාකමෙහි ඉහළ යාමක් වේ නම් එය වෙනත් විස්තීර්ණ ආදායම් ආශ්‍රිතව හඳුනා ගැනේ.

## 3.2.7 සුරැකුම් තක්සේරු කිරීම

බැංකුව විසින් මූල්‍යමය වත්කම්වල අවදානම අවම කරගැනීම සඳහා හැකි සෑම විටෙකදීම, සුරැකුම් ලබා ගනී. මෙම ඇප සුරැකුම් විවිධාකාරී ස්වරූප ගන්නා අතර මුදල්, සුරැකුම්, ණයවර ලිපි/ඇපකර, දේපළ වත්කම්, ලැබිය යුතු ශේෂ, තොග ලේඛන, වෙනත් මූල්‍යමය නොවන වත්කම් සහ ජාලකරණ ගිවිසුම් වැනි ණය පුළුල්කිරීමේ ක්‍රම මීට ඇතුළත් වේ. මෙම අතිරේක ඇපවල සාධාරණ වෙළෙඳ වටිනාකම, ඒවායේ අවම අගයට, ආරම්භක අවස්ථාවේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති උපදෙස් පදනම් කොටගෙන සාමාන්‍යයෙන් ගණනය කරනු ලබයි.

දේපල වත්කම් වැනි මූල්‍යමය නොවන වත්කම්, ස්වාධීන තක්සේරුකරුවන් සහ විගණනය කරන ලද මූල්‍ය වාර්තා වැනි තුන්වන පාර්ශ්වයන් විසින් සපයනු ලබන දත්ත පදනම් කොටගෙන තක්සේරු කරනු ලැබේ.

## 3.3 මූල්‍ය නොවන වත්කම්

## 3.3.1 දේපල හා උපකරණ හඳුනා ගැනීම හා මිනුම්ගත කිරීම

දේපළ හා උපකරණ, ඒවායේ අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය සතු වන්නේ දැයි හෝ එහි පිරිවැය දේපළ, පිරියත හා උපකරණ පිළිබඳ ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය - 16 ට අනුකූලව විශ්වාසදායී ලෙස මැනිය හැකි දැයි යන්න මත හඳුනා ගනු ලැබේ. මූලික අදියරේදී දේපළ හා උපකරණ එහි පිරිවැයට තක්සේරු කරනු ලබයි.

### ප්‍රාග්ධනීත කිරීම සඳහා මූලික අවශ්‍යතා

#### අත්පත්කර ගැනීම් අවස්ථාවේදී දරන ලද වියදම් මත

පහත මූලිකාංග මත කිසියම් වියදමක් ජංගම නොවන වත්කමක් ලෙස හඳුනා ගැනීමේදී මූලික අවම වටිනාකම හා වර්ෂයකට වැඩි ඵලදායි ජීව කාලයක් පැවතීම මූලිකව අපේක්ෂා කෙරේ.

1. අනාගත ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපාරය තුලට ගෙන ඒමේ සම්භාවිතාවක් පැවතීම.

2. අදාල වියදම රු. 25000ට වැඩි වීම.

**අත්පත්කර ගැනීම දක්වා දරන ලද වියදම් මත**

වත්කමක් මිලදී ගැනීමට වඩා අළුතින් වත්කම් නිර්මාණය කර ගැනීමේදී. වත්කම වඩාත් කාර්යක්‍ෂම හෝ වඩා වැඩි ඵලදායි ජීව කාලයක් සඳහා භාවිතා කිරීමේ හැකියවක් ඇත. එවැනි වත්කම් නිර්මාණයේදී දරන වියදම් හා අළුත්වැඩියා කිරීමේ, වැඩිදියුණු කිරීමේ වියදම් ප්‍රාග්ධනිත කිරීමේ හැකියාවක් පවති. ඒ සඳහා පහත සඳහන් අවශ්‍යතාවලින් එකක් හෝ සම්පූර්ණ වීම අවශ්‍ය වේ.

1. දරන ලද වියදමේ ප්‍රතිපලයක් ලෙස

2. වත්කමේ ඵලදායි ජීවිත කාලය වසරකට වඩා වැඩි විය යුතුය

3. වත්කමේ ඵලදායි ධාරිතාව ඉහළ යාම

4. වත්කමේ ප්‍රතිලාභී සේවාවන්ගේ හා ඒකකයන්ගේ ගුණාත්වය ඉහළයාම

5. දරන ලද පිරිවැයේ වටිනාකම රු. 25,000/- ඉක්මවීම.

## පිරිවැය මාදිලිය

දේපළ හා උපකරණ, ඒවායෙහි එදිනෙදා නඩත්තු වියදම් හැර ඉතිරි පිරිවැයෙන් සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානි වටිනාකම අඩු කළ පසු ලැබෙන පිරිවැයට දක්වනු ලැබේ. එම පිරිවැයට, හඳුනා ගැනීමේ නිර්ණායක සපුරාලන්නේ නම් උපකරණයක කොටස් නැවත සවි කිරීමේ පිරිවැය ඇතුළත් කරයි.

## ප්‍රත්‍යාගනනය

වත්කම් ලෙස හඳුනාගැනීමෙන් අනතුරුව, ඉඩම් ගොඩනැගිලි හා අනෙකුත් ජංගම නොවන වත්කම් වල සාධාරන වටිනාකම් ප්‍රත්‍යාගනන වටිනාකම් වලට ගැලපීම සිදුකරයි. එහිදී අදාල වත්කම් වල සමුච්චිත ක්ෂය වීම් හා කපාහරිනලද / වෙන්කරන ලද වටිනාකම් ප්‍රත්‍යගනන වටිනාකමෙන් අඩුකළ යුතුය. වත්කම් ප්‍රත්‍යාගනනය සෑම වර්ෂ 5 කට වරක් සිදු කරනු ලබන අතර ප්‍රත්‍යග නන වෙනස් වීම වාර්ථාකරන කාල රාමුව ආවසානයේ අනාවරනය කරනු ලබයි.

## පසු පිරිවැය

කිසියම් අයිමයක අනාගත ආර්ථික ප්‍රතිලාභ බැංකුව තුළට සිදු වන මුදල් ප්‍රවාහ තුළ අන්තර්ගත වනු ඇති බව හඳුනා ගනු ලැබේ නම් සහ ඒ බව මිනුම්ගත කළ හැකි නම් එම අයිතමයට අදාළව ඉදිරියට ගෙන යනු ලබන පිරිවැය වශයෙන් මෙය හඳුනා ගනු ලැබේ.

## ක්‍ෂයවීම

සින්නක්කර ඉඩම් හැර දේපළ හා උපකරණවල ක්ෂය වෙන් කිරීම් ඒවායේ පිරිවැය මත සෘජු ක්‍රමයට සිදු කරනු ලැබේ. ක්ෂය කිරීමේ අරමුණ සඳහා යොදාගන්නා ඵලදායී ජීව කාලයන් පහතින් දැක්වේ:

| | |
|---|---|
| **පරිගණක මෘදුකාංග හා දෘඩාංග** | **වසර 04** |
| **ගෘහ භාණ්ඩ හා සවිකිරීම්** | **වසර 05** |
| **මෝටර් රථ වාහන** | **වසර 05** |
| **කාර්යාල හා අනෙකුත් ස්ථාපිත/විදුලි උපකරණ** | **වසර 05** |

## වත්කම් ඉවත් කිරීම

දේපළ හා උපකරණ ඒවා මුළුමනින්ම හානියට පත් වූ විට හෝ එයින් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා කළ නොහැකි වූ විට ඉවත් කරනු ලබයි. මෙම වත්කම් ඉවත් කිරීමේදී ඇතිවන කුමන හෝ ලාභයක් හෝ අලාභයක් (ශුද්ධ ඉවත් කිරීමේ ලැබීම් හා වත්කමේ ධාරණ වටිනාකමේ වෙනස ලෙස ගණනය කරන ලද) වත්කම ඉවත් කරනු ලබන වර්ෂයේ ආදායම් ප්‍රකාශනයේ වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ දක්වනු ලබයි. වත්කම ඉවත් කිරීමෙන් පසු ඉවත් කළ වත්කමට අදාළ වන්නා වූ යළි තක්සේරු කිරීමේ සංචිත අගයක් වේ නම් එම වටිනාකම රඳවාගත් ඉපැයුම්වලට මාරු කරනු ලැබේ.

## 3.3.2 මූල්‍ය නොවන වත්කම් අපහායනය

බැංකුව විසින් සෑම වාර්තා කිරීමේ දිනයකදීම, කුමන හෝ වත්කමක් හානි වීමේ ඉඩ ප්‍රස්ථා ඇත්දැයි විමසා බලනු ලැබේ. එවැනි හානි වීමේ ඉඩකඩක් පවතී නම් හෝ යම් වත්කමක් සම්බන්ධයෙන් වාර්ෂික හානි පරීක්ෂාවක් අවශ්‍ය වන්නේ නම් බැංකුව විසින් එම වත්කමේ නැවත පියවා ගැනීමේ වටිනාකම තක්සේරු කරනු ලැබේ.

## 3.3.3 ආයෝජන දේපල

**පිරිවැය පදනම**

කුලී ඉපයීම සඳහා සහ/හෝ ප්‍රාග්ධන වැඩි කිරීම් සඳහා තබාගෙන සිටින ඉඩම්, ගොඩනැගිලි හෝ ගොඩනැගිලිවලින් කොටසක් 'ආයෝජන දේපල' ලෙස වර්ගීකරණය කෙරෙන අතර පිරිවැය මත මනිනු ලැබේ (ආරම්භයේදී හා ඉන් අනතුරුව). කළමනාකාරීත්වය විසින් ආයෝජන දේපල සතු සාධාරණ අගය වාර්ෂිකව මනිනු ලැබෙන අතර මූල්‍ය ප්‍රකාශනවලට සටහන් වශයෙන් වෙන වෙනම හෙළිදරව් කෙරේ. අයවිය යුතු කුලී මුදල අදාළ ලීසිං කාල සීමාව සඳහා ඍජු රේඛීය පදනමක් මත අදාළ වෙයි. කිසියම් බදුකරුවෙකු හට කුලී රහිත කාල සීමාවක් වැන සහන දීමනාවක් ලබා දී ඇති විට වෙනම වත්කමක් ලෙස වාර්තා වන ඕනෑම වටිනාකමක් එකී ආයෝජන දේපලෙහි ඉදිරියට ගෙන යන වටිනාකමින් බැහැර කෙරෙයි.

**සාධාරණ වටිනාකම**

ආයෝජන ගොඩනැගිලි ලෙස හඳුනාගැනීමෙන් අනතුරුව වත්කම් වල සාධාරණ වටිනාකම් ප්‍රත්‍යාගනන වටිනාකම් වලට ගැලපීම සිදුකරයි. එහිදී අදාල වත්කම් වල සමුච්ත ක්ෂය වීම් හා කපාහරින ලද / වෙන්කරන ලද අලාභ ප්‍රත්‍යාගණන වටිනාකමෙන් අඩුකළ යුතුය. වත්කම් ප්‍රත්‍යාගණනය සෑම වර්ශ 5 කට වරක්ම සිදු කරනු ලබන අතර ප්‍රත්‍යාගනන වෙනස් වීම් වාර්ථාකරන කාල රාමුව අවසානයේදී අනාවරණය කරනු ලබයි.

## 3.3.4 තොග අයිතම

ලිපිද්‍රව්‍ය ඇතුළු තොග අයිතම අවම පිරිවැය හා ශුද්ධ සත්‍ය වටිනාකමට අනුව අඩු අගයට තක්සේරු කරනු ලැබේ.

## 3.3.5 ණය පිරිවැය

ණය පිරිවැය යනු අපේක්ෂිත පරිදි වෙළෙඳාම් කිරීම සඳහා සූදානම් කිරීමට සැලකිය යුතු කාලයක් ගන්නා වත්කමක් අත්කර ගැනීම, ඉදිරි කිරීම හෝ නිෂ්පාදනය කිරීම නිසා ඉස්මතු වන්නකි. එවැනි වත්කම් ඒවායෙහි පිරිවැයෙහිම කොටසක් ලෙස ප්‍රාග්ධනිත කරනු ලැබේ. පොලී සහ අරමුදල් ලබා ගැනීමට අදාළව මතු වන අනෙකුත් වියදම්ද ණය පිරිවැයට ඇතුළත් වේ.

## 3.3.6. අස්පෘශ්‍ය වත්කම්

අස්පෘශ්‍ය වත්කම් යනු මූල්‍ය වටිනාකමක් සහිත භෞතික නොවන වත්කමකි.

### 3.3.6.1. හදුනාගැනීමේ පදනම

වත්කමක පිරිවැය වඩා විශ්වාසයව මැනිය හැකි මෙන්ම එම වත්කමේ අනාගත අපේක්ෂිත ආර්ථික ප්‍රථිලාභ ව්‍යාපාරය තුලට ගලා එන්නා වූ භෞතික පැවතීමක් නොමැති වත්කම් මේ යටතේ හදුනාගැනේ. මූලිකව මෙම වත්කම් පිරිවැය මත අනාවරනය කෙරේ.

### 3.3.6.1.(a) පරිගණක මෘදුකාංග

ආයතනය විසින් මිලදී ගන්නා ලද පරිගණක මෘදුකාංගය අත්පත්කර ගැනීමේ පිරිවැය මත මිනුම් කිරීම සිදු කරන අතර, පිරිවැයෙන් සමුච්චිත ක්ෂය කපා හැරීම සිදුකරයි.

### 3.3.6.2. අත්පත් කර ගැනීම දක්වා දරන ලද වියදම්

අත්පත් කර ගැනීමේදී දරන කිසියම් වියදමක් මත අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ වල වර්ධනය සිදු වේනම් එවැනි වියදම් වත්කමේ පිරිවැයට එකතු කල හැක. අනෙකුත් වියදම් කාලජේදයෙ වියදමක් ලෙස හදුනාගැනේ.

### 3.3.6.3. අස්පෘශ්‍ය වත්කම් ක්ෂය කිරීම

වත්කම් භාවිතයට ගත් දිනයේ සිට වත්කමේ පිරිවැය ඵලදායි ජීව කාලය මත සරළ මාර්ග ක්‍රමයට ක්ෂය කිරීමෙන් ආදයම් ප්‍රකාශයට

ගැලපීම සිදුකරයි. සුදුසු අවස්ථාවලදී ක්ෂය කිරීමේ ක්‍රම වේදය ඵලදායී ජීවකාලය මෙන්ම අවශේෂ වටිනාකම යාවත්කාලීන කිරීම හා වෙනස් කිරීම සිදු කරයි. එමෙන්ම ආයතනය විසින් අස්පෘශ්‍ය වත්කම් වල අවශේෂ වටිනාකම නොමැති බව උපකල්පනය කරයි.

| වත්කම් වර්ගය | ඵලදායී ජීව කාලය |
|---|---|
| පරිගණක මෘදුකාංග | 2 - 15 |
| බලපත්‍ර | 5 - 20 |
| සන්නම් නාම | 1 - 20 |
| උපදේශන කලමනාකරණය | 1 - 15 |

අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගත් මාසයේදී අදල මාසයට ක්ෂය කිරීම් සිදු කරන අතර ඉවත් කරන මාසයේදී අදල මාසයට ක්ෂය නොකරීම සිදු කරයි.

## 3.4 මූල්‍ය වගකීම්

### 3.4.1 මූලික හඳුනා ගැනීම හා මිනුම්ගත කිරීම

ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39 හි විෂය පථයට අයත් වන මූල්‍යමය වගකීම්, බැංකුවලට ගෙවීමට ඇති වටිනාකම්, ගනුදෙනුකරුවන්ගේ තැන්පතු සහ ප්‍රතිමූල්‍ය ණය ගැණුම් ආදි ලෙස අවශ්‍ය පරිදි වර්ගීකරණය කරනු ලැබේ. බැංකුව විසින් මූලික හඳුනා ගැනීමේදී මෙම වර්ගීකරණය සිදු කරන ආකාරය තීරණය වේ.

බැංකුව විසින් මූල්‍යමය වගකීම්, ඒවායේ ලාභ හෝ අලාභ මත සාධාරණ වෙළෙඳ වටිනාකමට හෝ වෙනත් මූල්‍යමය වගකීම් අදාළ කොන්ත්‍රාත් ගිවිසුම්වල විධිවිධානවලට අනුකූලව සහ මූල්‍යමය වගකීම්වල නිර්වචනයට අනුව වර්ගීකරණය කරනු ලබයි.

යම් මූල්‍යමය වගකීමක ගිවිසුම්ගත විධිවිධානවල පාර්ශ්වකරුවෙකු බවට බැංකුව පත් වූ විට බැංකුව විසින් අදාළ මූල්‍යමය වගකීම් තම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙන් හඳුනා ගැනේ.

#### I. ලාභ හෝ අලාභ මත සාධාරණ වෙළෙඳ වටිනාකමට මූල්‍යමය වටිනාකම්

සාධාරණ වෙළෙඳ වටිනාකමට ඇති මූල්‍යමය වගකීම් සඳහා වෙළෙඳාමට හරින ලද හෝ මූලික හඳුනා ගැනීමෙන් පසුව එසේ පත් කරන ලද මූල්‍යමය වගකීම් ඇතුළත් වේ. මූලික හඳුනා ගැනීමත් සමගම ලාභ හෝ අලාභ මත සාධාරණ වෙළෙඳ වටිනාකමට ඇති මූල්‍යමය වගකීම් සාධාරණ වෙළෙඳ වටිනාකමට අනුව මනිනු ලබන අතර එහිදී සිදුවන වෙනස්කම් ලාභයෙන් හෝ අලාභයෙන් හඳුනා ගැනේ.

මූලික හඳුනා ගැනීමෙන් පසු පවරා ගැනීම සඳහා සෘජුව අදාළ වන ගනුදෙනු වියදම්, යෙදවුම් ලෙස ලාභයෙන් හෝ අලාභයෙන් හඳුනා ගැනේ.

මූලික හඳුනා ගැනීමෙන් පසුව මූල්‍යමය වගකීම් ලාභය හෝ අලාභය මත සාධාරණ වෙළෙඳ වටිනාකමට පැවරීමේ නිර්ණායකය මූල්‍යමය වත්කම්වල පරිදිම වේ.

#### II. වෙනත් මූල්‍යමය වගකීම්

තැන්පතු, බැංකුව විසින් නිකුත් කරන ලද ණය සහ වෙනත් ණයට ගන්නා ලද අරමුදල් ඇතුළත් වෙනත් මූල්‍යමය වගකීම්, මූලික වශයෙන් සාධාරණ වෙළෙඳ වටිනාකමෙන් ගනුදෙනු පිරිවැය අඩු කිරීමෙන් පසු ලැබෙන වටිනාකමට ගණනය කරනු ලබන අතර එය සෘජුවම පවරා ගැනීම සඳහා අදාළ වේ. ඉන්පසු එය ඵලදායී පොලී අනුපාත ක්‍රමය යොදාගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරයි. ක්‍රම ක්ෂය පිරිවැය ගණනය කරන්නේ නිකුත් කිරීමේදී ලබා දුන් කවර හෝ වට්ටම් හෝ වාරික සහ ඵලදායී පොලී අනුපාතයේ අභ්‍යන්තර කොටස් වන ඕනෑම පිරිවැයක් සැලකිල්ලට ගැනීමෙනි.

### 3.4.2 මූල්‍ය වගකීම් ඉවත් කිරීම

මූල්‍යමය වගකීමක් ඉවත් කරනු ලබන්නේ එම වගකීම සම්බන්ධයෙන් ඇති බැඳීමෙන් මුදවාලීම හෝ අහෝසි කිරීම හෝ කල් ඉකුත් වීම හේතුවෙනි දැනට පවතින වගකීමක් එයට අදාළ ණය හිමියාගේම සැලකිය යුතු වශයෙන් වෙනස් කොන්දේසි සහිත තවත් වගකීමකින් හිලවු වන්නේ නම් හෝ දැනට පවත්නා

වගකීමේ කොන්දේසි සැලකිය යුතු ලෙස අලුත් වන්නේ නම් එවැනි වගකීම් හුවමාරුවක් හෝ අලුත් වීමක් මුල් වගකීම ඉවත් වීමක් ලෙස හා නව වගකීමක් ඇති වීමක් ලෙස සලකනු ලැබේ. මුල් මූල්‍යමය වගකීමේ ඉදිරියට ගෙන එන ලද ශේෂය හා ඉන් ගෙවා ඇති මුදල අතර වෙනස ලාභයෙන් හෝ අලාභයෙන් හඳුනා ගැනේ.

## 3.5 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම

### 3.5.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම

සියලුම සේවකයන් සඳහා විශ්‍රාම වැටුප් පාරිතෝෂික ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 19 - සේවක ප්‍රතිලාභ විධිවිධානයට අනුකූලව වෙන් කරන ලදි. කෙසේ වෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතේ විධිවිධාන යටතේ කිසියම් සේවකයෙකු සඳහා පාරිතෝෂික ගෙවීමේ වගකීම උපදින්නේ වසර පහක කාලයක් අඛණ්ඩව සේවය කිරීමෙන් අනතුරුවය. එම වගකීම සඳහා බාහිර අරමුදල් වෙන් නොකෙරේ.

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිශ්චිත දායක සැලැස්මක් නොව, සේවා කාලයෙන් පසුව සැලසෙන ප්‍රතිලාභ සැලැස්මකි. කිසියම් සේවකයෙකු තම වත්මන් හා පූර්ව සේවා කාලවලට අදාළව හිමිකම් කියන අනාගත ප්‍රතිලාභ ප්‍රමාණය තක්සේරු කිරීම මගින් මීට අදාළ බැංකුවේ ශුද්ධ වගකීම ගණනය කරනු ලැබේ. එසේම, එහි වත්මන් වටිනාකම හඳුනා ගනු පිණිස එම ප්‍රතිලාභය වට්ටම් කරනු ලැබේ. හඳුනා නොගත් අතීත සේවා පිරිවැයක් වේ නම් එය ඉන් අඩු කර ගනු ලැබේ.

වට්ටම් අනුපාතිකය යනු වාර්තා කරන දින වන විට ඉහළ තත්ත්වයේ ආයතනික බැඳීම් මත ප්‍රතිලාභයයි. බැංකුවේ බැඳීම්කලාවලට සමාන කල් පිරෙන කාල සීමාවක් ඊට ඇති අතර එය දක්වනු ලබන්නේද අදාළ ප්‍රතිලාභ ගෙවීමට අපේක්ෂිත මුදල් ඒකකයෙන්ම වේ. එම ගණනය කිරීම වාර්ෂිකව සිදු කරනු ලැබේ.

### 3.5.2 දායක සැලසුම්

නිශ්චිත දායක සැලසුමක් සඳහා ගෙවිය යුතු දායකත්වය අදාළ සේවකයා බැංකුව කෙරෙහි ලබා දුන් සේවය මත තීරණය වන අතර එය වියදමක් ලෙස සේවක වියදම් යටතේ වාර්තා කෙරේ. ගෙවා නොමැති දායක මුදල් වගකීමක් ලෙස සටහන් කරනු ලැබේ.

#### සේවක අර්ථසාධක අරමුදල

බැංකුව හා සේවකයා විසින් අනුමත පුද්ගලික අර්ථසාධක අරමුදලට පිළිවෙලින් 12% ක් හා 8% ක් ලෙස දායකත්වය දක්වයි.

#### සේවක භාරකාර අරමුදල

බැංකුව විසින් සේවක භාරකාර අරමුදල සඳහා 3% ක දායකත්වයක් දක්වනු ලබයි.

## 3.6 වෙන් කිරීම්

බැංකුවට අතීත සිදුවීමක් හේතුවෙන් වර්තමානයේදී වගකීමක් (නෛතික හෝ ගිවිසුම්ගත) උද්ගත වී ඇතිවිට, සහ ආර්ථික ප්‍රතිලාභ ලැබීම සඳහා ඉවහල් වන සම්පත් මෙම වගකීම් පියවීම සඳහා යොදාගැනීමට සිදුවිය හැකි විට සහ අදාළ වගකීමේ වටිනාකම පිළිබඳ විශ්වාසදායී ලෙස ඇස්තමේන්තුවක් සකස් කළ හැකිවිට ඒවා වෙන් කිරීම් ලෙස හඳුනා ගැනේ. මෙවැනි වෙන්කිරීම් සම්බන්ධයෙන් දැරීමට සිදු වන වියදම් ආදායම් ප්‍රකාශනයේ ඕනෑම නැවත ලබා ගැනීමක ශුද්ධ අගයක් ලෙස ඉදිරිපත් කරයි.

## 3.7 මුලයමය ඇපකර

සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී බැංකුව විසින් ණයවර ලිපි හා ඇපකර ඇතුළත් මුලයමය ඇපකර නිකුත් කරනු ලැබේ. මුලයමය ඇපකර වාරික ලැබීමට නියමිත නිසා මූලික වශයෙන් සාධාරණ වෙළෙඳපොල වටිනාකමට මුලයමය ප්‍රකාශනවලින් (වෙනත් වගකීම් යටතේ) හඳුනාගනියි. මූලික හඳුනාගැනීමෙන් පසු සෑම ඇපකරයක් යටතේම බැංකුවට ඇති වගකීම, මූලික වශයෙන් හඳුනාගත් වටිනාකමෙන් ආදායම් ප්‍රකාශනයෙන් හඳුනාගැනෙන සමුච්චිත ක්‍රමක්ෂය අඩු කළ අගය හා මෙම ඇපකර හේතුවෙන් පැනනගින ඕනෑම මුලයමය වගකීමක් පියවීම සඳහා අවශ්‍ය වියදමේ ඇස්තමේන්තුගත වටිනාකමෙන් ලැබෙන අගය මත ගණනය කරනු ලබයි. මුලයමය ඇපකර සම්බන්ධ ඕනෑම වගකීමක ඉහළයාමක් ආදායම් ප්‍රකාශනයේ පොලී වියදම යටතේ වාර්තා කරනු ලැබේ. එමෙන්ම මේ සම්බන්ධ වාරික ලැබීම් අදායම් ප්‍රකාශනයේ ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම් යටතේ සෘජු පදනමට ඇපකරයේ ජීව කාලය පුරා හඳුනාගැනේ.

## 3.8 බදුකරණය

ආදායම් බදු 2013 වර්ෂයේ සිට නිදහස් වේ.

### 3.8.1 වර්තමාන බදු

වර්තමාන බදු වත්කම් හා වගකීම්, මෙම වසරට අදාළව දේශීය ආදායම් බදු කොමසාරිස් ජනරාල්වරයාගෙන් ලබාගත යුතු හෝ ගෙවිය යුතු වටිනාකම්වලින් සහ පසුගිය වර්ෂවල බදු ගෙවීම සම්බන්ධයෙන් සිදුකළ යුතු කවර ආකාරයේ හෝ ගැලපීම්වලින් සමන්විත වේ. මෙම බදු මුදල් ගණනය සඳහා යොදා ගන්නා බදු අනුපාත හා බදු නීති වාර්තාකරණ දිනයට අදාළ හෝ සුවිශේෂී ලෙස අදාළ වන තත්ත්වයන් වේ. ලාභාංශ ගත කළ ආදායම හා පොලිය හැරුණු කොට ආදායම සහ ලාභය, 2013 අංක 13 දරන දේශීය ආදායම් පනතේ 7 (බී) වගන්තිය යටතේ බදුවලින් නිදහස් වෙයි.

### 3.8.2 මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු

මූල්‍යමය සේවා මත මත එකතු කළ අගය මත බදු 2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පණතට හා ඉන්පසු එයට සිදු කළ සංශෝධන වලට අනුකූලව ගණනය කර තිබේ. මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු ගණනයේ පදනම වන්නේ එකතු කළ අගය මත බදුවලට පෙර ගිණුම්කරණ ලාභය සහ ආර්ථික ක්ෂයවීමට ගලපන ලද ආදායම් බදු සහ නියම කරන ලද අනුපාතයකට ගණනය කරන ලද සේවක වේතනයි.

## 3.9 ආදායම් හා වියදම් හඳුනා ගැනීම

අයභාරය හඳුනා ගනු ලබන්නේ එමගින් බැංකුව වෙත ආර්ථික ප්‍රතිලාභ ලැබිය හැකි හා එය විශ්වාසදායී ලෙස මැනිය හැකි විටයි. එමෙන්ම අයභාරය හඳුනා ගැනීමට පෙර පහත දැක්වෙන නිශ්චිත හඳුනා ගැනීමේ නිර්ණායකද සපුරාලිය යුතුයි.

### 3.9.1 පොලී ආදායම හා පොලී වියදම

පොලී ආදායම හා වියදම සඵලදායී පොලී ක්‍රමය යොදාගෙන ලාභයෙන් හෝ අලාභයෙන් හඳුනාගනියි. ඵලදායී පොලී අනුපාතය යනු මූල්‍යමය වත්කමේ හෝ වගකීමේ (හෝ, ප්‍රමාණවත් විට, කෙටි කාලයකට) අපේක්ෂිත ජීව කාලය හරහා අදාළ මූල්‍යමය වත්කමේ හෝ වගකීමේ ඉදිරියට ගෙන එන ලද ශේෂය දක්වා වන ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හා ලැබීම් නිසියාකාරයෙන්ම වට්ටම් කරනු ලබන වටිනාකමයි. මෙම ඵලදායී පොලී අනුපාතය ගණනය කිරීමේදී බැංකුව විසින් මූල්‍යමය උපකරණ සඳහා බලපාන සියලුම ගිවිසුම්ගත කොන්දේසි සැලකිල්ලට ගනිමින් අනාගත මූල්‍ය ප්‍රවාහයන් ඇස්තමේන්තුගත කරයි. කෙසේවෙතත් එහිදී අනාගත ණය අලාභයන් සැලකිල්ලට නොගනී.

සඵලදායී පොලී අනුපාතය ගණනයට එහි අභ්‍යන්තර අංග වන සියලුම ගනුදෙනු පිරිවැය හා ගාස්තු ඇතුළත් වේ. ගනුදෙනු පිරිවැය සඳහා මූල්‍යමය වත්කමක් හෝ වගකීමක් අත්පත්කරගැනීම හෝ නිකුත් කිරීම වෙනුවෙන් සෘජුව අදාළ වන වර්ධක පිරිවැය අයත් වේ.

පොලී ආදායම හා වියදම විස්තීරණ ආදායම් ප්‍රකාශනයෙන් ඉදිරිපත් කරන අතර එයට සඵලදායී පොලී පදනම මත ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කළ මූල්‍ය වත්කම් හා වගකීම් වලට අදාළ පොලිය ඇතුළත් වේ.

සඵලදායී පොලී පදනමට ගණනය කරන ලද විකිණීමට ඇති ආයෝජන සුරැකුම්පත්වල පොලී ආදායමද, ඉහතින් දක්වන ලද පොලී ආදායමට ඇතුළත් කෙරේ. කෙසේ වෙතත්, බැංකුව විසින් එකී වත්කම්වලට අදාළ පොලී ආදායම මුදල්වලින් හඳුනා ගන්නා ලදී.

### 3.9.2 ගාස්තු හා කොමිස් ආදායම

ගාස්තු හා කොමිස් ආදායම හා වියදම, මූල්‍යමය වත්කමක හෝ වගකීමක ඵලදායී පොලී අනුපාතයේ අන්තර්ගත කොටසක් වන අතර එය ඵලදායී පොලී අනුපාතය මැනීම සඳහා ඇතුළත් කරගනී.

ගිණුම්කරණ සේවා ගාස්තු, ආයෝජන කළමනාකරණ ගාස්තු, විකුණුම් කොමිස්, පිහිටුවීමේ ගාස්තු හා ඒකාබද්ධ කිරීමේ ගාස්තු ඇතුළත් ගාස්තු හා කොමිස් ආදායම ඒ ආශ්‍රිත සේවා ක්‍රියාත්මක කිරීමේදී හඳුනාගැනේ.

වෙනත් ගාස්තු සහ කොමිස් වියදම් ප්‍රධාන වශයෙන්ම සේවා ලබාගැනීමේදී වැය කිරීමට සිදුවන ගනුදෙනු හා සේවා ගාස්තුවලට අදාළ වේ. ගාස්තු හා කොමිස් වියදම් උපචිත පදනම මත හඳුනාගැනේ.

### 3.9.3 ලාභාංශ ආදායම

බැංකුවට ලාභාංශ ලැබීමේ අයිතිය ස්ථාපිත වූ විට ලාභාංශ ආදායම උපචිත පදනමට විස්තීරණ ආදායම් ප්‍රකාශනයෙන් හඳුනා ගැනේ.

## 3.10 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රමය උපයෝගී කරගෙන පිළියෙළ කරයි. ඒ අනුව මෙහෙයුම් ක්‍රියාකාරකම්, මූල්‍ය ක්‍රියාකාරකම් හා ආයෝජන ක්‍රියාකාරකම් වල දළ මුදල් ලැබීම් හා දළ මුදල් ගෙවීම් මෙමඟින් හඳුනා ගැනේ.

## 3.11 නිකුත් කළ නමුත් මෙතෙක් බලාත්මක නොකළ ප්‍රමිතීන්

නිකුත් කළ නමුත් මෙම මූල්‍ය ප්‍රකාශ නිකුත් කරන දින වන විටත් බලාත්මක නොකළ ප්‍රමිත පහත සඳහන් පරිදි වේ. මෙම ප්‍රමිත බලාත්මක වීමෙන් පසු ඒවා අදාළ කරගැනීමට බැංකුව බලාපොරොත්තු වේ. විස්තරාත්මක විවරණයක් ලැබීමට ඇති නිසා මෙම මූල්‍ය ප්‍රකාශන මඟින් ඒවා ප්‍රකාශයට පත්කරන දිනට බැංකුවේ මූල්‍යමය බලපෑම පිළිගතහැකි මට්ටමින් ඇස්තමේන්තු කොට නැත.

SLFRS 9- මූල්‍ය සාධන පත්‍ර: වර්ගීකරණය සහ ඇගයීම

SLFRS - නියාමන විලම්බිත ගිණුම්

SLFRS - කොන්ත්‍රාත් මගින් ආදායම

## 3.12. ණයකර

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2007 දෙසැම්බර් 3 ප්‍රසිද්ධ කරන ලද පුවත්පත් දැන්වීමට අනුව ප්‍රමුඛ ඉතිරිකිරීම් හා සංවර්ධන බැංකුවේ රු.100,000 වඩා වැඩි ශේෂයක් පවතින ආයතන තැන්පතුකරුවන් හා ආයෝජකයන් ගේ තැන්පතු සුරැකුම් නොලත් ණයකරවලට පරිවර්ථනය කරන අතර පරිනත කාලය වර්ෂ 10 බව තීරණයකරන ලදී. එමෙන්ම මේ සඳහා පොලිය ගෙවීමේදී වාර්ෂිකව 5% හෝ වාර්ෂික භාණ්ඩාගාර බිල්පත් අනුපාතය යන ඒවායින් වඩා අඩු අගය යොදගනී.

## 4. මූල්‍ය උපකරණ - අවදානම් කළමනාකරණය

## 4.1 අවදානම් කළමනාකරණ ව්‍යුහය

බැංකුවේ සමස්ථ අවදානම් කළමනාකරණ රාමුව හඳුනා ගැනීමේ හා කළමනාකරණය කිරීමේ බලතල අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. මේ අනුව, අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති, ඉලක්ක සහ බැංකුවට භාර ගත හැකි අවදානම් සීමාව හා අදාළ උපායමාර්ග පිහිටුවීම එමගින් සිදු කෙරේ. බැංකුවට මුහුණ දීමට සිදු වන සෑම වර්ගයකම අවදානම් සඳහා සාර්ථකව මුහුණ දීමේ අරමුණින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තවත් උප කමිටු පිහිටුවා තිබේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලයට අනුබද්ධිත අවදානම් කළමනාකරණ කමිටුවේ වගකීම වන්නේ බැංකුව තුළ ක්‍රියාත්මක වන සමස්ථ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමයි.

ස්ථාපිත ප්‍රතිපත්ති, ක්‍රමවේද සහ තීන්දු ගැනීමේ ක්‍රියාවලීන් ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකු සමාගමේ දෛනික මෙහෙයුම්වලට ඒකාබද්ධ කර තිබේ. බැංකුව පුරාවටම ක්‍රියාත්මක වන විස්තීර්ණ අවදානම් කළමනාකරණ ක්‍රියාවලියක් අභ්‍යන්තර විගණන නිලධාරීන් විසින් වාර්ෂිකව නිරීක්ෂණය කරනු ලැබෙන අතර එහිදී බැංකුව ස්ථාපිත ක්‍රමවේදයන්ට දක්වන අනුකූලතාව සහ ඒවායෙහි යෝග්‍යතාව විමසා බලනු ලැබේ. අභ්‍යන්තර විගණන අංශය සියලු තක්සේරු කිරීම්වල ප්‍රතිඵල කළමනාකාරිත්වය සමග සාකච්ඡා කොට තම නිර්දේශ විගණන කමිටුව වෙත වාර්තාකරයි.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සැදුම් ලබන්නේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු (ඉන් එක් අයෙකු රැස්වීම්වල මූලාසනය හොබවයි), ප්‍රධාන විධායක නිලධාරී, ජ්‍යෙෂ්ඨ කළමනාකාර-මෙහෙයුම්, ජ්‍යෙෂ්ඨ කළමනාකාර-මූල්‍ය, ජ්‍යෙෂ්ඨ කළමනාකාර-ආයතනික, කළමනාකාර-ණය සහ කළමනාකාර-තොරතුරු තාක්ෂණ යන නිලධාරීන්ගෙනි. වෙළඳපොල, ණය, ද්‍රවශීලතා, මෙහෙයුම්, අනුකූලතා, කීර්ති නාම සහ උපාය මාර්ගික යන අවදානම් වර්ග නිරන්තරයෙන් තක්සේරු කොට අධීක්ෂණය කිරීම සහ වත්කම් හා වගකීම් කමිටුව වැනි කමිටුවල සාර්ථකත්වය නිරීක්ෂණය කිරීම වැනි කටයුතු එම කමිටුව විසින් සිදු කෙරේ. බැංකුවේ සියලු ව්‍යාපාරික කටයුතුවලදී පවතින නීති, රෙගුලාසි, රීති, නියාමන මගපෙන්වීම්, අභ්‍යන්තර පාලන පද්ධති සහ අනුමත ප්‍රතිපත්ති ආදියට අනුකූලතාව දක්වනු ලැබේද යන්න පරීක්ෂා කිරීමද එමගින් සිදු වේ.

බැංකුව මූල්‍ය උපකරණ ආශ්‍රිත අවදානම්වලට මුහුණ දීම, එහි අරමුණු, ප්‍රතිපත්ති සහ එම අවදානම් කළමනාකරණය කර ගැනීම සඳහා භාවිත ක්‍රියාවලීන් ආදිය සම්බන්ධයෙන් මෙහි සටහන් මගින් දක්වා ඇති විට හැර අන් කිසිදු අවස්ථාවක පෙරට වඩා වෙනසක් දැකිය නොහැක.

## ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව

## මූල්‍ය ප්‍රකාශන

### මූල්‍ය ප්‍රකාශන මත සටහන්

| 5. ශුද්ධ පොලී ආදායම | 2015 (රු.) | 2014 (රු.) |
|---|---|---|
| **පොලී ආදායම** | | |
| පොලී ආදායම - භාණ්ඩාගාර බැඳුම්කර | - | - |
| පොලී ආදායම - භාණ්ඩාගාර බිල්පත් | 92,149,307 | 95,754,911 |
| පොලී ආදායම - ප්‍රතිමිලදී ගැනුම් ආයෝජන (REPO) | 143,263,773 | 111,998,721 |
| පොලී ආදායම - ණයකර | 24,118,731 | 5,692,678 |
| පොලී ආදායම - බැංකු තැන්පතු | 142,986,723 | 271,656,175 |
| පොලී ආදායම - සුරැකුම් කරන ලද පත්‍රිකා | 30,993,523 | 12,263,036 |
| ඒකක භාරමත ඉපැයීම් | 16,155,107 | - |
| පොලී ආදායම - ප්‍රමුඛ ඉතිරිකිරීම් හා සංවර්ධන බැංකුවේ ණය | 36,927,667 | 41,497,962 |
| පොලී ආදායම - කල්බදු | 14,924,376 | 8,030,261 |
| පොලී ආදායම - තැන්පතු ශේෂ මත ණය | 1,067,802 | 622,566 |
| පොලී ආදායම - කුලී පිට ගැනුම් | 6,269,602 | 5,920,344 |
| පොලී ආදායම - හවුල්කාර සමාගම් වෙත ණය | 90,986,647 | 95,819,106 |
| පොලී ආදායම - දොරින් දොර ණය | 2,427,460 | 1,492,067 |
| පොලී ආදායම - කාර්ය මණ්ඩල ණය | 1,623,923 | 1,593,296 |
| පොලී ආදායම - පුද්ගලික ණය | 36,972,877 | 16,504,930 |
| පොලී ආදායම - පුද්ගල හා ආයතනික ණය | 22,068,467 | 35,756,328 |
| පොලී ආදායම - (MFD) ණය | 5,287,251 | 4,422,231 |
| පොලී ආදායම - උකස් අත්තිකාරම් | 1,815,063 | 160,025 |
| පොලී ආදායම - ප්‍රජා දිරිය ණය | 3,747,770 | 180,758 |
| පොලී ආදායම - වාහන ණය | 909,049 | 1,136,295 |
| පොලී ආදායම - අධ්‍යාපනික ණය | 17,593 | - |
| පොලී ආදායම - කාර්ය මණ්ඩල නිවාස ණය | 1,113,278 | - |
| පොලී ආදායම - වෘත්තීය ණය | 342,553 | - |
| **සමස්ථ පොලී ආදායම** | **676,168,543** | **710,501,691** |
| අනෙකුත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු | 38,426,482 | 75,094,687 |
| PSDB තැන්පතුකරුවන්ට ගෙවිය යුතු | 11,825,786 | 10,145,685 |
| නිකුත් කල ණයකර | 64,722,519 | 65,015,173 |
| වෙනත් ණය ගැනීම් | 32,647,658 | 33,120,946 |
| **සමස්ථ පොලී වියදම** | **147,622,445** | **183,376,492** |
| **ශුද්ධ පොලී ආදායම** | **528,546,098** | **527,125,199** |

## 5.1. ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වලින් ලද ශුද්ධ පොලී ආදායම

| | 2015 (රු.) | 2014 (රු.) |
|---|---|---|
| පොලී ආදායම | 235,413,080 | 207,753,632 |
| **ශුද්ධ පොලී ආදායම** | **235,413,080** | **207,753,632** |

## 6. ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම

| | 2015 (රු.) | 2014 (රු.) |
|---|---|---|
| ගාස්තු හා කොමිස් ආදායම | 3,261,068 | 1,847,405 |
| ගාස්තු හා කොමිස් වියදම | (12,629,571) | (8,101,481) |
| **ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම** | **(9,368,504)** | **(6,254,076)** |
| **ගාස්තු හා කොමිස් ආදායම:** | | |
| ඉතුරුම් ගිණුම් මත කොමිස් ආදායම | 23,780 | 20,210 |
| ලේඛන ගාස්තු | 359,700 | 254,300 |
| මිලදීගත් බිල්පත් මත කොමිස් ආදායම | 27,260 | 33,693 |
| ඇපකරුවන් මත කොමිස් ආදායම | 60,000 | - |
| ඉදිරියට දින නියම කරන ලද චෙක්පත් මත කොමිස් මුදල | | - |
| සැකසුම් ගාස්තු - ණය | 1,814,465 | 795,480 |
| අධීක්ෂණ වියදම් | 501,773 | 266,186 |
| රක්ෂණ කොමිස් | 197,091 | 98,536 |
| ආපසු නොගෙවන තැන්පතු මත ආදායම | 277,000 | 379,000 |
| **මුළු ගාස්තු සහ කොමිස් ආදායම** | **3,261,068** | **1,847,405** |
| **ගාස්තු සහ කොමිස් වියදම්** | | |
| උපදේශන ගාස්තු | 150,000 | 1,321,975 |
| වෘත්තීය ගාස්තු | 2,334,639 | 399,747 |
| නීති ගාස්තු | 6,390,264 | 2,958,130 |
| හිමිකම් ගාස්තු | 2,706,227 | 2,500,000 |
| හිමිකම් සෙවුම් ගාස්තු | 6,420 | 8,000 |
| බැංකු ගාස්තු | 272,992 | 735,848 |
| CRIB ගාස්තු | 643,227 | 177,781 |
| SLIPS - උපයෝජ්‍යතා වියදම් | 30,355 | - |
| හඳුන්වා දීමේ කොමිස් වියදම් - කල්බදු සහ කුලී | 95,448 | - |
| **මුළු ගාස්තු සහ කොමිස් වියදම්** | **12,629,571** | **8,101,481** |

## 7. වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)

| | 2015 (රු.) | 2014 (රු.) |
|---|---|---|
| දේපල, පිරියත හා උපකරණ විකිණීම මත ලාභය | 2,120,500 | 161,882 |
| ලාභාංශ ආදායම | 446,754 | 296,068 |
| විවිධ ආදායම් | 431,759 | 56,330 |
| ආදායම - නුවර එළිය බංගලාව | 408,300 | 436,510 |
| ආදායම - අනුරාධපුර බංගලාව | 68,000 | 20,000 |
| ආදායම - බස් රථ කුලී | 355,470 | 358,810 |
| වගාකිරීමෙන් ලද ආදායම | 40,000 | - |
| වෙනත් අයවිය යුතු මුදල් සඳහා අයකරවා ගත් ප්‍රතිපාදන | 1,530,057 | 492,953 |
| භාරකාරත්ව අයකර ගැනීම | 1,179,300 | 782,300 |
| ණය ප්‍රතිපාදන අයකර ගැනීම් (අධි ප්‍රතිපාදන) | 59,512,232 | 79,481,654 |
| දඩ පොලී | 209,480 | 129,294 |
| සාමූහික වේතන ගිවිසුම මත අධි වෙන්කිරීම් | | |
| කල්බදු නැවත අත්කර ගැනීමෙන් ඉදිරියට ගෙන ගිය | - | 1,796,310 |
| ගිවිසුම් නවතා දැමීමේ ආදායම | 24,463 | 29,376 |
| නැවත අයකර ගත් නීති වියදම් | 439,485 | 8,400 |
| ලියාභරින ලද | | |
| **වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)** | **66,765,800** | **84,049,886** |

## 8. මූල්‍ය වත්කම් හානිකරණය

| | 2015 (රු.) | 2014 (රු.) |
|---|---|---|
| ණය සහ අනෙකුත් ගනුදෙනු කරුවන්ගෙන් අයවිය යුතු මුදල් | (75,585,703) | 167,167,519 |
| විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් | - | - |
| **මුළු එකතුව** | **(75,585,703)** | **167,167,519** |

## 9. පුද්ගල වියදම්

| | 2015 (රු.) | 2014 (රු.) |
|---|---|---|
| වැටුප් හා ප්‍රසාද දීමනා | 66,373,735 | 40,882,721 |
| නිශ්චිත දායක මුදල්/ප්‍රතිලාභ සැලසුම් | 8,565,635 | 5,530,874 |
| වෙනත් දීමනා සහ කාර්ය මණ්ඩලය සඳහා වියදම් | 24,069,607 | 16,444,624 |
| පාරිතෝෂික | 2,142,133 | 1,003,952 |
| **මුළු එකතුව** | **101,151,110** | **63,862,170** |

## 10. අනෙකුත් වියදම්

| | 2015 (රු.) | 2014 (රු.) |
|---|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වේතන | 4,150,319 | 3,518,197 |
| විගණන කටයුතු සඳහා ගාස්තු | 1,035,147 | 539,425 |
| වෘත්තීය ගාස්තු | - | 159,936 |
| දේපල, පිරියත හා උපකරණ ක්ෂය වීම | 18,614,872 | 17,954,644 |
| කාර්යාල පරිපාලනය හා ආයතනික වියදම් | 20,490,093 | 19,732,863 |
| නෛතික ක්‍රියාමාර්ග සඳහා හිලවු ගාස්තු | | - |
| අලුත්වැඩියා කිරීම් සහ නඩත්තු | 6,191,273 | 6,223,079 |
| ප්‍රචාරණ හා වෙළඳ දැන්වීම් | 6,906,385 | 20,688,042 |
| ආයතනික සමාජ වගකීම් වැඩසටහන් | 100,000 | 54,850 |
| විනෝදාස්වාදාත්මක වැඩසටහන් | 211,819 | 84,566 |
| බාහිරින් ශ්‍රමිකයන් ලබා ගැනීමේ වියදම් | 321,267 | 227,218 |
| ආරක්ෂක වියදම් | 5,163,369 | 6,735,619 |
| රක්ෂණ | 1,814,913 | 2,759,893 |
| මුද්‍රණ කටයුතු හා ලිපි ද්‍රව්‍ය | 5,964,126 | 4,396,775 |
| ගාස්තු හා බදු | 3,179,744 | 3,040,699 |
| පරිත්‍යාග | 70,000 | 132,412 |
| ජාතික රක්ෂණ භාරකාර අරමුදලට අයකිරීම් | 2,808,800 | 4,053,950 |
| ප්‍රවාහන හා ඉන්ධන වියදම් | 3,381,600 | 3,666,062 |
| යැපීම් හා නවාතැන් වියදම් | 1,457,504 | 863,525 |
| අහෝසි කළ කොටස් ආයෝජන | - | - |
| ලියාහරින ලද ආදායම් බදු | - | - |
| බැකුව විවෘත කිරීමේ ගාස්තු ක්‍රමක්ෂය කිරීම | 4,793,766 | - |
| නඩු සඳහා හිලවු කිරීම් | - | - |
| වෙනත් | 1,322,420 | 1,446,694 |
| **සමස්ථ වියදම් වටිනාකම** | **87,977,418** | **96,278,446** |

## 11. බදු වියදම්

| | 2015 (රු.) | 2014 (රු.) |
|---|---|---|
| වත්මන් බදු වියදම් | | |
| පෙර වසරේ අඩි වෙන් කිරීම් කපා හැරීම | - | - |
| 2009/2010 කාල සීමාව සඳහා ආදායම් බදු තක්සේරුව | - | 32,830,793 |
| බදු අනුපාතයන්හි වෙනස්වීමේ බලපෑම් | | - |
| විලම්බිත බදු වෙන් කිරීම් කපා හැරීම | | |
| **මුළු එකතුව** | **-** | **32,830,793** |

2014 අංක 13 දරන දේශීය ආදායම් පනතේ (සංශෝධිත) 07 (ආ) වගන්තියට අනුව 2013 ජනවාරි 01 සිට බලාත්මක වන පරිදි බැංකුවේ ලාභය සහ ආදායම, ආදායම් බදුවලින් නිදහස් කර ඇත.

## 12. කොටසකට ඉපයීම

| | 2015 (රු.) | 2014 (රු.) |
|---|---|---|
| සාමාන්‍ය ප්‍රාග්ධන හිමියන් සඳහා වන ශුද්ධ ලාභය | 432,282,566 | 234,854,912 |
| කොටසකට මූලික ඉපයීම සඳහා බර තබන ලද සාමාන්‍ය කොටස් ප්‍රමාණය | 4,584,466 | 4,584,466 |
| **සාමාන්‍ය කොටසකට මූලික ඉපයීම** | **94** | **51** |

## 13. මුදල් සහ මුදල් සමාන දෑ

| | 2015 (රු.) | 2014 (රු.) |
|---|---|---|
| අත ඉතිරි මුදල් | 2,827,296 | 4,386,237 |
| බැංකුවල ඇති ශේෂයන් (සටහන 13.1) | 37,634,628 | 12,673,092 |
| **මුළු අගය** | **40,461,924** | **17,059,329** |

## 13.1. බැංකුවල ඇති ශේෂයන්

| | | |
|---|---|---|
| මහජන බැංකුව - කල්බදු රැස්කිරීමේ ගිණුම | 2,000,153 | 3,527,521 |
| මහජන බැංකුව - ලිබර්ටි ප්ලාසා (පැරණි) | 75,373 | 75,373 |
| මහජන බැංකුව - ලිබර්ටි ප්ලාසා (නව) | | - |
| ලංකා බැංකුව - බොරැල්ල | 879,603 | 574,852 |
| ලංකා බැංකුව - මන්නාරම | 25,000 | 25,000 |
| මහජන බැංකුව - 1001-52536877 | 32,165 | 32,165 |
| මහජන බැංකුව - 1001-32536878 | 30,375 | 30,375 |
| මහජන බැංකුව - 1001-72536882 | 29,867 | 29,867 |
| මහජන බැංකුව - 1001-52536881 | 30,669 | 30,669 |
| මහජන බැංකුව - 1001-32536883 | 34,963 | 34,963 |
| මහජන බැංකුව - 1001-6002189 | 71,076 | 71,076 |
| මහජන බැංකුව - 1001-6002212 | 101,688 | 101,688 |
| මහජන බැංකුව - 1001-6002235 | 30,652 | 30,652 |
| මහජන බැංකුව - මන්නාරම | 1,978,772 | - |
| මහජන බැංකුව - මාතර | 1,649,246 | 2,628,870 |
| මහජන බැංකුව - අනුරාධපුර | - | 1,533,990 |
| බැංකුවේ ඇති මුදල් - NDTF 046-1001-20000683 | 665,025 | 665,025 |
| බැංකුවේ ඇති මුදල් - NDTF 309-1001-72536876 | - | 3,281,004 |
| මහජන බැංකුව - ඇමතුම් තැන්පතු | 30,000,000 | - |
| **මුළු අගය** | **37,634,628** | **12,673,092** |

## 14. ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්

| | 31.12.2015 (රු.) | 31.12.2014 (රු.) |
|---|---|---|
| භාණ්ඩාගාර බිල්පත් | - | 2,245,227,722 |
| භාණ්ඩාගාර බැඳුම්කර | - | - |
| ප්‍රතිමිලදී ගැනුම් ආයෝජන (REPO) | 1,493,066,537 | 1,712,668,047 |
| **මුළු අගය** | **1,493,066,537** | **3,957,895,768** |

## 15. බැංකුවල ඇති තැන්පතු

| | | |
|---|---|---|
| ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | 1,013,000,000 | 70,000,000 |
| ස්ථාවර තැන්පතු - ලංකා බැංකුව | - | 69,930,151 |
| ස්ථාවර තැන්පතු - ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 730,305,551 | 72,600,241 |
| ස්ථාවර තැන්පතු - ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 200,000,000 | 384,041,573 |
| ස්ථාවර තැන්පතු - HDFC බැංකුව | 1,255,654,105 | 967,355,228 |
| ස්ථාවර තැන්පතු - ජාතික සංවර්ධන බැංකුව (NDB) | 578,688,333 | 440,506,604 |
| අයවිය යුතු පොළිය | 44,406,479 | 44,185,732 |
| **මුළු අගය** | **3,822,054,468** | **2,048,619,529** |

## 16. ණය හා වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් අයවිය යුතු මුදල්

| | 31.12.2015 (රු.) | 31.12.2014 (රු.) |
|---|---|---|
| දළ ණය හා අයවිය යුතු මුදල් | 4,170,075,242 | 3,458,177,005 |
| (අඩු කළා): කේවල හානිකරණ වීම් | (1,223,532,974) | (1,342,831,704) |
| සාමූහික හානිකරණ වීම් | (183,142,010) | (73,002,189) |
| **ශුද්ධ ණය හා අයවිය යුතු මුදල්** | **2,763,400,258** | **2,042,343,113** |

IFRS අවශ්‍යතාව මත ස්වාධීන පාර්ශවයක් විසින් හානිකරණය වෙන්කිරීම ගනනය කරන ලදී.

## 16.1. විශ්ලේෂණය

| | 31.12.2015 (රු.) | 31.12.2014 (රු.) |
|---|---|---|
| **සේවා, ණය සහ අත්තිකාරම් අනුව** | | |
| වාරික ගෙවනු ලැබෙන ණය - NDTF (සක්‍රීය) | 1,062,287,025 | 796,483,019 |
| වාරික ගෙවනු ලැබෙන ණය - PSDB | 79,455,528 | 125,198,441 |
| කාර්ය මණ්ඩලය සඳහා ණය | 18,880,954 | 4,979,445 |
| විශේෂ ණය - කාර්ය මණ්ඩලය සඳහා | 1,809,696 | 2,107,275 |
| තැන්පතු ශේෂ මත ණය | 7,714,808 | 6,042,115 |
| ණය - දොරින් දොර ණය | 20,799,586 | 11,413,523 |
| PSDB ශේෂ මත ණය | 4,275,973 | 6,089,263 |
| ණය - රාජ්‍ය හා පෞද්ගලික සේවා නියුක්තික | 404,525,251 | 142,898,855 |
| ණය - පුද්ගලික සහ ආයතනික ණය | 132,864,009 | 225,875,584 |
| ණය - කාර්ය මණ්ඩල බහුකාර්ය ණය | - | 13,803,278 |
| උකස් අත්තිකාරම් | 26,494,767 | 3,282,384 |
| වාහන ණය | 2,806,474 | 6,295,350 |
| ප්‍රජා දිරිය ණය | 32,390,582 | 15,825,454 |
| අධ්‍යාපනික ණය | 34,486 | - |
| කාර්යමණ්ඩල නිවාස ණය | 39,470,313 | - |
| වෘත්තීය ණය | 5,784,750 | - |
| කල් ඉක්මවූ ණය | 66,213,735 | 41,864,228 |
| උප ප්‍රාමාණික ණය | 48,578,125 | 101,061,246 |
| අඩමාණ ණය | 19,681,287 | 49,157,121 |
| අලාභ කාණ්ඩය | 237,477,998 | 191,378,835 |
| PSDB ණය | 1,010,330,497 | 1,067,164,308 |
| ලැබිය යුතු ණය - කාර්ය මණ්ඩල ලෙජර - PSDB | 3,320,291 | 3,844,679 |
| ප්‍රතිවක්‍රගත - PSDB | 3,113,403 | 10,216,349 |
| ලැබිය යුතු කල්බදු | 205,024,170 | 96,540,249 |
| ලැබිය යුතු කුළී පිට ගැනීම් | 50,579,081 | 33,131,965 |
| ණයකරවල ආයෝජන | 378,417,619 | 117,064,879 |
| වෙනත් ආයෝජන | 274,428,310 | 380,439,568 |
| ණය පාලන | 33,316,523 | 6,019,593 |
| ලැබිය යුතු පොලී | - | - |
| **දළ අගය** | **4,170,075,242** | **3,458,177,005** |
| **කර්මාන්තය අනුව** | | |
| කෘෂිකාර්මික සහ ධීවර | 962,241,694 | 928,720,000 |
| නිෂ්පාදන | 467,236,843 | 598,551,000 |
| සංචාරක කර්මාන්තය | 20,935,707 | 24,398,000 |
| ප්‍රවාහනය | 88,603,000 | 70,330,000 |
| ඉදිකිරීම් | 586,952,449 | 301,128,000 |
| වාණිජ | 516,752,420 | 233,004,000 |
| නව ආර්ථික | 4,709,352 | 3,964,000 |
| වෙනත් | 1,522,643,776 | 1,298,082,005 |
| **දළ අගය** | **4,170,075,242** | **3,458,177,005** |

## 16.2. අයවිය යුතු කල්බදු ගාස්තු

| | 31.12.2015 (රු.) | 31.12.2014 (රු.) |
|---|---:|---:|
| අයවිය යුතු කල්බදු ගාස්තු | 166,391,629 | 50,026,721 |
| කල් ඉක්මවූ ණය | 6,815,385 | 7,258,494 |
| උප ප්‍රාමාණික ණය | 7,874,182 | 5,931,060 |
| අඩමාණ ණය | 4,415,350 | 12,676,055 |
| අලාභ කාණ්ඩය | 19,727,506 | 20,667,257 |
| අඩු කළා: නොඉපයූ පොලී | (199,882) | (19,338) |
| **මුළු එකතුව** | **205,024,170** | **96,540,249** |

## 16.3. අයවිය යුතු කුළී පිට ගැනීම්

| | 31.12.2015 (රු.) | 31.12.2014 (රු.) |
|---|---:|---:|
| ලැබිය යුතු කුළී පිට ගැනීම් | 47,022,341 | 30,418,768 |
| කල් ඉක්ම වූ ණය | 3,140,590 | 2,548,961 |
| උප ප්‍රාමාණික ණය | 885,627 | 426,263 |
| අඩමාණ ණය | 51,993 | - |
| අඩු කළ : නොයිපයු පොළී | (521,470) | (262,028) |
| **මුළු එකතුව** | **50,579,081** | **33,131,965** |

## 16.4. වෙනත් ආයෝජන

| | 31.12.2015 (රු.) | 31.12.2014 (රු.) |
|---|---:|---:|
| වානිජ පත්‍රිකා | 6,000,000 | 16,000,000 |
| වත්කම් ඇපමත ලබාගත් වානිජ පත්‍ර ආයෝජන | 274,428,310 | 370,439,568 |
| වෙනත් ආයෝජන | 165,594,500 | 165,594,500 |
| අඩු කළ : අපහායන වියදම් | (171,594,500) | (171,594,500) |
| **මුළු එකතුව** | **274,428,310** | **380,439,568** |

## 16.5. මූල්‍ය වර්ෂය තුළ කේවල හා සාමූහික හානිකරණය සඳහා වෙන් කිරීම්

| | 31.12.2015 (රු.) | 31.12.2014 (රු.) |
|---|---|---|
| **කේවල හානිකරණය** | | |
| වසර ආරම්භයේදී ශේෂය | 1,342,831,704 | 1,290,843,625 |
| ආදායම් ප්‍රකාශනය මත වියදම් | (64,432,821) | 163,678,744 |
| පෙර වසරේ ගැලපුම් - අක්‍රිය ණය ප්‍රතිපාදන | (10,913) | - |
| අයකරගැනීම් | (54,854,995) | (111,690,665) |
| **වර්ෂ අවසානයේදී ශේෂය** | **1,223,532,974** | **1,342,831,704** |
| **සාමූහික හානිකරණය** | | |
| වසර ආරම්භයේදී ශේෂය | 73,002,189 | 69,513,413 |
| ආදායම් ප්‍රකාශනය මත වියදම් | 111,502,254 | 3,488,775 |
| අයකර ගැනීම් | (1,362,432) | - |
| **වර්ෂ අවසානයේදී ශේෂය** | **183,142,010** | **73,002,189** |
| **එකතුව** | **1,406,674,984** | **1,415,833,892** |

ස්වයංක්‍රීය වෙන්කිරීමේ සටහන්වල තිබූ වැරැද්දක් නිවැරදි කිරීම සඳහා රු.10,913/- නිවැරදි කිරීමේ සටහනක් ඇතුලත් කර ඇත.

## 17. විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන

| | 31.12.2015 (රු.) | 31.12.2014 (රු.) |
|---|---|---|
| කොටස් මත ආයෝජන / සුරැකුම් | 235,187,164 | 227,764,057 |
| (අඩු): හානිවීම් සඳහා වියදම් | (42,464,300) | (42,638,768) |
| **විකිණීම සඳහා ඇති ආයෝජනවල ශුද්ධ වටිනාකම** | **192,722,864** | **185,125,289** |

ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුව විසින් සිදුකරන ලද කොටස් මත ආයෝජන ඉහතින් දැක්වේ. මෙම මූල්‍ය වර්ෂය තුළ වෙළෙඳ කටයුතු කිසිවක් වාර්තා නොවීය.
මේ පිළිබඳ ගුණාත්මක අනාවරණයක් SLFRS 7අනුව "අවදානම් කරළමණාකරන වාර්ථාවේ" අඩංගු වේ.

## 17.1. මිල ප්‍රකාශිත සමාගම්වල කොටස් සුරැකුම්

| ආයෝජන සමාගම් | 31.12.2015 (රු.) | | | 31.12.2014 (රු.) | | |
|---|---|---|---|---|---|---|
| | කොටස් සංඛ්‍යාව | කොටස් පිරිවැය | වෙළෙඳපොළ වටිනාකම | කොටස් සංඛ්‍යාව | කොටස් පිරිවැය | වෙළෙඳපොළ වටිනාකම |
| ජාතික සංවර්ධන බැංකුව | 13,800 | 970,956 | 2,678,580 | 13,800 | 970,956 | 3,450,000 |
| කොමර්ෂල් බැංකුව | 203 | 7,135 | 24,969 | 195 | 7,135 | 33,345 |
| ලංකා ඔරික්ස් ලීසිං සමාගම | 200 | 855 | 18,800 | 200 | 855 | 17,600 |
| සම්පත් බැංකුව | 2,977 | 83,221 | 738,296 | 2,794 | 83,221 | 660,222 |
| වණික් ඉන්කෝපරේෂන් | 17,000 | 176,184 | - | 17,000 | 176,184 | - |
| වටවල ප්ලාන්ටේෂන් | 4,000 | 20,288 | 97,200 | 4,000 | 20,288 | 75,200 |
| ලංකා සෙරමික් පී.එල්.සී. | 5,000 | 128,334 | 600,000 | 5,000 | 128,334 | 600,500 |
| සිනමන් ලේක් සයිඩ් | 4,000 | 34,983 | 377,600 | 4,000 | 34,983 | 368,400 |
| කැළණි වැලි ප්ලාන්ටේෂන් | 5,500 | 198,121 | 385,000 | 5,500 | 198,121 | 407,000 |
| හපුගස්තැන්න ප්ලාන්ටේෂන් | 100 | 2,666 | 2,270 | 100 | 2,666 | 3,740 |
| එයිට්කන් ස්පෙන්ස් | 18,000 | 160,364 | 1,740,600 | 18,000 | 160,364 | 1,863,000 |
